# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,914 – 1970 ජූලි 10 වැනි සිකුරාදා – 1970.7.10

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)



| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 907 | තොටුපළ රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | 938 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 916 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 918 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 937 | විවිධ දැන්වීම් ... ... ... | — |



සැලකිය යුතුයි.—මෙවර ප්‍රසිද්ධ කරණු ලබන ගැසට් පත්‍රයේ VI වැනි කොටසේ ජූරි සභිකයින්ගේ සහ උපදේශකවරුන්ගේ නාම ලේඛනයක් පළවේ.

## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

දීමනා.—ගෙවිල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. සේවා කොන්දේසි.—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන්ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥා පනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණ යකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාලවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

(ii) ලන්ඩන්හි විදුලි ඉංජිනේරු ආයතනයේ I වැනි, II වැනි III වැනි කොටස්වලින් හෝ ඒ හා සමාන වෙනත් පරීක්ෂණයකින් හෝ සාමාර්ථය ලබා තිබිය යුතු ය. නැතහොත්

(iii) ලංකා ඉංජිනේරු ආයතනයේ විදුලි ඉංජිනේරු විභාගයේ I, II, සහ III වැනි කොටස්වලින් සාමාර්ථය ලබා තිබිය යුතුය.

සටහන.—වායු සමීකරණය ගැන දැනීමක් ඇති අයට වැඩි සැලකිල්ලක් දක්වනු ඇත.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම හෝ අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතු ය :—

(ඒ) උප්පැන්න සහතිකය. (සැ. යු.—අධ්‍යපන රෙගුලාසි පරිදි උපකෘත පාසලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බව්තීස්ම සහතික පිළිගනු නොලැබේ.

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය

(සී) චරිත සහතික දෙකක්

(මින් එකක් විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් හෝ අධ්‍යාපනය ලත් ආයතනයේ අධ්‍යක්ෂකගෙන් විය යුතු ය).

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික

(ඊ) සිංහල සහ දෙමළ භාෂාවලින් සමත් උසස් විභාග සහතිකය.

(සැ. යු.—(i) අයදුම්පත්‍ර කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුයි).

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකිවන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම්පත්‍ර, ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළයුතු ය. එතෙකුදු වුවත් තම ඉල්ලුම්පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැන ගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙළින්ම ලියා එවිය යුතු යි. ඉල්ලුම්පත්‍ර පෝරම සමග තමන්ට එවන ලද ('බී' සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැක.

7. අයදුම්පත් හෝ ඒ පිළිබඳ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් නැතට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතු ය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භය සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත්‍ර පෝරමය සමග තම තමන්ට නිකුත් කරන ලද ('ඒ' සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතු ය. එවිට ඉල්ලුම්පත්‍ර පෝරමය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ලැබුන බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූ ද ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුලත, තම ඉල්ලුම්පත්‍රය ලැබුන බවට දැන්වීමක් නොලැබෙන්නාවූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතු ය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියොත් අයදුම්කරුවෙකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 ජූලි මස 2 වැනිදා,
කොළඹ 1,
ගාලු මුවදොර මහලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කායසීලයේදී ය.
තැ. පෙ. 500.

7–400/2—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒබී. 36/එක්ස්. 2252/70.

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ නාරාහේන්පිට පිහිටි පලතුරු කම්හලේ නිෂ්පාදන කළමනාකරු තනතුර

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ නාරාහේන්පිට පිහිටි පලතුරු කම්හලේ නිෂ්පාදන කළමනාකරු තනතුර සඳහා ඉල්ලුම්පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම්පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය.

මෙරට ඉල්ලුම්පත් : 1970 ජූලි මස 24 වැනිදා.

විදේශීය ඉල්ලුම්පත් : 1970 ජූලි මස 31 වැනිදා.

සටහන :

(i) මුද්‍රිත ඉල්ලුම්පත් ආකෘතිපත්‍ර තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රජයේ සේවයේ නියුක්ත නිලධාරියෙක්ද ? නැද්ද ? යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9" × 4" ප්‍රමාණයට කුඩා නොවූද, තම ලිපිනය ලියන ලද්දාවූද, මුද්දර නො ගැසූවාවූද ලියුම් කවරයක් එවිය යුතු ය.

(ii) ඉල්ලුම් පතක් හෝ ඊට අදාල ලිපියක් හෝ තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය නො හැක. අවසාන දින වන තුරු ඉල්ලුම් පත් ප්‍රමාද කරන ඉල්ලුම්කරුවන් එසේ කිරීමෙන් සිදු විය හැකි අලාභ හානි තමන් විසින් ම විඳ දරා ගත යුතු ය.

(iii) පිටරටවල ඉල්ලුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම්පත් පෝරම විදේශයන්හි සිටින ලංකා නියෝජිතයින්ගේ කාර්යාලවලින් ලබාගත හැක. සිය ඉල්ලුම්පත් රාජ්‍ය සේවා කොමිසන් සභාවේ ලේකම් වෙත එවනු වස් තමන් පදිංචි රටේ හෝ තමන් පදිංචි රටට ආසන්න රටේ හෝ ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුලතදී භාරදීමට ඉල්ලුම්කරුවන්ට සිය අභිමතය පරිදි පුළුවන.

(iv) වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.—ලංකාණ්ඩුව යටතේ සේවයට පත් කිරීම සඳහා විදේශවලින් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා අය කෙරෙන ගාස්තුවත්, ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු ය.

2. සේවයේ නියුක්ත කරවා ගැනීමේ වගන්ති හා කොන්දේසි.—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තෝරා ගනු ලබන්නා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

3. වැටුප් පරිමාණය.—වර්ෂයකට රු. 6,720—360×12—රු. 11,040 (ඒකාබද්ධ වැටුප) (සටහන : 1969.10.1 දිනට පෙර පැවති අනුරූප මූලික වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 4080—360×12—8400)

4. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(ආ) 1970.7.24 වැනි දිනට වයස අවුරුදු 20 ට නොඅඩු සහ අවුරුදු 35 ට නොවැඩි බව. දැනටමත් රජයේ සේවයේ නියුතු වූවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

(ඇ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් ලබාගත් අ.පො.ස. (සාමාන්‍ය) සහතිකය හෝ ඊට සමාන හෝ උසස් සහතිකයක් ලබා ඇති බව ;

(ඈ) පලතුරු සහ එළවළු සකස් කිරීමේ කර්මාන්තායතනයක අවුරුදු 10කට නොඅඩු පළපුරුද්දක් ඇති බව ; යටත් පිරිසෙයින් මින් අවුරුදු 5 ක් වත් පරිපාලන හෝ කළමනාකාර තත්ත්වයේ විය යුතුය.

(ඉ) අවුරුදු 10 කට නොඅඩු කාල සීමාවක් තුලදී පහත සඳහන් වැඩවල නියත වශයෙන්ම යෙදී සිටිය බවට සහ ප්‍රවීනත්වයක් ඇති බවට අයදුම්කරු ඔප්පු කළ යුතුයි :—

(i) ජෑම් ජූස, කෝඩියල්, සෝස්, චට්නි සහ පලතුරු සිරප් නිෂ්පාදනය සඳහා ගනු ලබන පලතුරු වර්ග සහ ඒවයේ තත්ත්වය හඳුනා ගැනීම.

(ii) පලතුරු සහ එළවළු සකස් කිරීමේ කර්මාන්තායතනයට අවශ්‍ය අමු ද්‍රව්‍ය රැස් කිරීම සහ ඒවා ප්‍රයෝජනයට ගැනීමේ හැකියාව.

(iii) පලතුරු සහ එළවළු සකස් කර ගැනීමේ කර්මාන්තය පිළිබඳ නිෂ්පාදනය වැඩ සටහන් සකස් කිරීම සහ නිෂ්පාදනයට අවශ්‍ය අමු ද්‍රව්‍ය ලබා ගැනීමේ සම්බන්ධී කරන කටයුතුය.

(iv) පලතුරු සහ එළවළු සකස් කර ගැනීමේ කර්මාන්ත කටයුතු වල දී උපරිම නිෂ්පාදන සඳහා කම්කරුවන් යෙදවීම.

සටහන :

පලතුරු හා එළවළු සකස් කර ගැනීමේ කර්මාන්තය පිළිබඳව, අයදුම්කරුවන් විසින් හදාරා ඇති විශේෂ පාඨමාලාවක් වේනොත් ඒවා ගැන වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බෞතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(ආ) උපාධි හෝ උසස් අධ්‍යාපන සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලීය ආචාර්ය වරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය.

(ඈ) වෘත්තීය සහ හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඉ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිවල සහතික.

සැ. යු. :

(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නො ලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම ඉල්ලුම්පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එසේනමුදු වුවත්, තම ඉල්ලුම්පත්‍රය එසේ එව්වේ කවදා දැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැන ගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද ("බී") ලකුණ දරණ මුද්‍රිත තැපැල්පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි වලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත්‍ර පෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("ඒ" සලකුන දරණ) මුද්‍රිත තැපැල්පත එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම්පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුන බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ලැබුන බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නා වූද ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුලත, තම ඉල්ලුම්පත්‍රය ලැබුනු බවට දැන්වීමක් නො ලැබෙන්නාවූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරිය හොත් අයදුම්කරුවෙකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. 500,
කොළඹ 1,
1970 ජුලි මස 2 වැනි දින.

7–400/3—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒබී/64/එක්ස්. 2253/69

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

### සමාජ විද්‍යාඥ තනතුර

ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ සමාජ විද්‍යාඥ තනතුර සඳහා ඉල්ලුම්පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත්‍ර පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය.

(ඒ) මෙරට ඉල්ලුම්පත්—1970 ජුලි මස 24 වැනිදා.

(බී) විදේශ ඉල්ලුම්පත්—1970 ජුලි මස 31 වැනිදා.

සටහන් :

(i) මුද්‍රිත ඉල්ලුම්පත්‍ර පෝර්ම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යන ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9″×4″ ප්‍රමාණයට කුඩා නොවූද, තම ලිපිනය ලියන ලද්දා වූද මුද්දර නොගැසුවාවූ ද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම්පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපැලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරාගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම්පත්‍ර පෝර්ම විදේශයන්හි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාල වලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම්පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුලත දී බාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත්කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන් ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.—(i) මෙම තනතුර ස්ථිර, විශ්‍රාම වැටුප් රහිතය. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය. මෙම පත්වීම අවුරුදු 3 ක කාලයක පරීක්ෂණයකට යටත්වය.

3. මෙම තනතුරට හිමි වාර්ෂික වැටුප් ක්‍රමය මෙසේ යි.—වර්ෂයකට රු. 6,720—12×360 සහ 11×480—16,320 (රු. 11,520 හා රු. 14,400 ට පෙර කාර්යක්ෂමතා කඩඉම්ද වෙයි.)

සටහන :

(i) පශ්චාත් උපාධි සුදුසුකම් ඇති තැනැත්තෙකු පත්කරනු ලැබුවහොත් ඔහු ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ රු. 7,800 ආරම්භක වාර්ෂික වැටුපේ තැබිය හැක.

(ii) පිළිගත් විශ්ව විද්‍යාලයක සමාජ විද්‍යාව පිළිබඳ නියමිත පශ්චාත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් ලබා නොගත හොත් තෝරාගනු ලබන අපේක්ෂකයාට වර්ෂයකට රු. 11,520 ඉක්මවා යෑමට නොහැක.

4. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශරීර සනීපයෙන් යුක්ත බව ;

(බී) 1970. 7. 24 වැනි දිනට අවුරුදු 22 ට නොඅඩු බව, පිළිගත් විශ්ව විද්‍යාලයක සමාජ විද්‍යාව පිළිබඳ ගෞරව උපාධියක් දරන්නවුන් අවුරුදු 30 ට නොවැඩි බව හා පිළිගත් පශ්චාත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් දරන්නවුන් අවුරුදු 35 ට නොවැඩි බව (රාජ්‍ය සේවයේ දැනටමත් තනතුරු උසුලන්නවුන් කෙරෙහි මෙම උපරිම වයස් සීමාව බල නොපානු ඇත.) ;

(සී) පිළිගත් විශ්ව විද්‍යාලයක සමාජ විද්‍යාව පිළිබඳ ගෞරව උපාධියක් හෝ සමාජ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා ඇති බව.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලක්ම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නොලැබේ.) ;

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය ;

(සී) චරිත සහතික දෙකක්.—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය ;

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස් ම විභාග පිළිබඳ සහතික.

සැ. යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම්පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තුවේ ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත් තම ඉල්ලුම්පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙළින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර පෝර්මය සමග තමන්ට එවන ලද ("ආ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක් ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ 1 වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි වලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත්‍ර පෝර්මය සමග තම තමන්ට නිකුත් කරන ලද ("අ" සලකුණ දරණ) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම්පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූ ද, ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නාවූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම්දිය යුතුය. මේ විධානය ඉටුකිරීම පැහැර හැරිය හොත් අයදුම්කරු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමිවේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 ජූලි මස 2 දින,
කොළඹ 1, ගාලු මුවදොර මහලේකම් ගොඩනැගිල්ලේ
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. 500.

7–400/4—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය : සීජී 3/92

## මැනුම් දෙපාර්තමේන්තුව

### ප්‍රවාහන නිලධාරි තනතුර

මැනුම් දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන නිලධාරි තනතුර සඳහා ලාංකිකයින්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරගත් ඉල්ලුම් පත්‍ර, 70.7.24 වැනි දින හෝ ඊට පෙර හෝ සර්වේ ජනරාල්, ආයතන අංශය, මැනුම් දෙපාර්තමේන්තුව, කොළඹ 5 යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය.

2. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට නියමිතව ඇත්තේ වර්ෂයකට රු. 6,600 න් පටන්ගෙන රු. 180 වාර්ෂික වැටුප් වැඩිවීම් සහිතව වර්ෂයකට රු. 8,040 දක්වා වැඩිවියන ඒකාබද්ධ වාර්ෂික වැටුපකි.

3. **බඳවා ගැනීමේ කොන්දේසි.**—මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් රහිත තනතුරකි. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

4. **සේවා කොන්දේසි :**

(අ) පත්වීම වූ කලී අවුරුදු 3 ක ආධුනික කාලයකට යටත් වේ ;

(ආ) 1956 අංක 33 දරණ රාජ්‍යභාෂා පනතේ විධිවිධාන වලටත් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහා දැනටමත් පනවා ඇති සියළුම නීතිරීති හා ව්‍යවස්ථාවලටත් මතුවට පනවනු ලබන නීති රීති හා ව්‍යවස්ථාවලටත් එකඟව කටයුතු කිරීමේ කොන්දේසිය තෝරාගනු ලබන්නා පිළිගත යුතුය.

(ඇ) පත්වීමේ ආධුනික කාල පරිච්ඡේදය තුළදී රාජ්‍ය භාෂාව වන සිංහලෙන් වැඩ කිරීමේ දැනුමක් ලබාගත යුතුයි ;

(ඈ) පත්වීම වූ කලි රාජ්‍යසේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසිවලටත් යටත් වන්නේ ය.

5. **අවශ්‍ය සුදුසුකම් :**

(i) 70.7.24 දිනට අවුරුදු 25ට අඩු නොවන අතර, අවුරුදු 40 ට වැඩි නොවිය යුතුය. (රාජ්‍ය සේවයේ දැනට ස්ථිර තනතුරු දරණ නිලධාරීන්ට උපරිම වයස් සීමාව බලපාන්නේ නැත) ;

(ii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ එක වරකදී විෂයයන් 3 කට අඩු නොවන සම්මාන සාමාර්ථයක් සහිතව යටත් පිරිසෙයින් විෂයයන් 6 කින් සමත් වූ අධ්‍යයන පොදු සහතික පත්‍රය (සාමාන්‍ය පෙළ) ලබා තිබීම ;

(iii) (අ) මෝටර් ඉංජිනේරු විද්‍යාව හෝ අදාල මෝටර් කාර්මික විද්‍යාව පිළිබඳව හෝ පිළිගත් ඒකාබද්ධ රාජධානියේ කාර්මික ආයතනයකින් ලබාගත් සහතිකයක් හෝ ඩිප්ලෝමා සහතිකයක්, හෝ ;

(ආ) ඒකාබද්ධ රාජධානියේ මෝටර් රථ කාර්මික ආයතනයේ (ඒකාබද්ධ මණ්ඩලය) ආශ්‍රිත සාමාජිකත්වය හෝ (Associate Membership in the Institute of United Motor Industries in the United Kingdom);

(ඇ) පිළිගත් ගරාජයක හෝ ප්‍රවාහන ආයතනයක පරීක්ෂක/පාලනමය තනතුරක අවුරුදු 8ක් සහිතව අඩු වශයෙන් අවුරුදු 15ක කාර්මික පළපුරුද්දක් තිබීම හා මෝටර් රථ අළුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම පිළිබඳව මනා දැනීමක් තිබීම ; හෝ

(ඈ) සමාන සුදුසුකම් තිබීම.

(iv) සියළුම වර්ගයේ කාර් හා ලොරි පැදවීම සඳහා රියැදුරු බල පත්‍රයක් තිබීම හා පළමුවන පංතියේ මෝටර් රථ අළුත්වැඩියා කිරීමේ වැඩපලක් භාරව කටයුතු කළ බවට සහතිකයක් තිබීම ;

(v) කම්කරුවන් සංවිධානය කිරීම හා පාලනය කිරීමට, රථවාහන සමූහයක් නඩත්තු කිරීමට සහ ප්‍රවාහන ආයතනයක සේවකයන් පරිපාලනය කිරීමට හැකියාවක් තිබීම ;

(vi) මෝටර් වාහන සඳහා වැඩ විස්තර පත්‍රිකා කෙටුම්පත් (Draft Specifications) සැපයීමේ සහ මෝටර් වාහනවල බොඩි තැනීමේ හැකියාව ; හා

(vii) පැට්‍රෝල් සහ ඩීසල් ඇතුළත දවන (ඉන්ටර්නල් කොම්බසන්) එන්ජින් අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම් පිළිබඳව සෑහෙන දැනුමක් තිබීම.

6. (අ) ඉල්ලුම්කරුවන් විසින් තම ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් ලියකියවිලිවල පිටපත් (මුල් පිටපත් නොව) අමුනා එවිය යුතුය :—

(i) උප්පැන්න සහතිකය.

(ii) තමා සතුව ඇති උසස් අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතික.

(iii) ඉහත 5 වන ඡේදයේ III වන අනුඡේදයේ සිට VII වන අනු ඡේදය දක්වා ඇති කාර්මික සුදුසුකම් සනාථ කිරීමේ සහතික.

(iv) චරිතය පිළිබඳ මෑතදී ලබා ඇති සහතික දෙකක් (දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින නිලධාරීන් විසින් චරිත සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නැත.)

(ආ) **සැලකිය යුතුයි.**—ඉහතින් ඉල්ලා ඇති සහතිකවල පිටපත් නො එවන ඉල්ලුම් කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. එසේම මේ නිවේදනයේ සහ ඉල්ලුම් පත් ආකෘතියේ සඳහන් අවශ්‍යතාවයන් සියල්ල සෑම ආකාරයෙන් සම්පූර්ණ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

7. රජයේ සේවයේ නියුක්ත සුදුසුකම් ලබා ඇති ඉල්ලුම්කරුවන් තම දෙපාර්මේන්තු ප්‍රධානියා මගින් ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතුය. ඉහතින් සඳහන් දිනයට පසුව එවන අයදුම් පත් භාරගනු නොලැබේ. එහෙත් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට නියම අවස්ථාවේ ලැබී ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණයක් ඉදිරිපත් කළහොත් පමණක් ප්‍රමාද වී ලැබෙන රජයේ සේවකයින්ගේ ඉල්ලුම් පත් භාරගනු ලැබේ.

8. ඉල්ලුම් පත්‍ර මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පුද්ගලික නමට නො එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වනු නොලැබේ.

9. සම්මුඛ පරීක්ෂණයට කැඳවන ඉල්ලුම්කරුවන් තම තමන්ගේ වියදමින් ඒ සඳහා පැමිණිය යුතුය. 6 (අ) ඡේදයේ සඳහන් සහතික වල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

සී. ටී. ගුණවර්ධන,
සර්වේ ජනරාල්.

70.7.1,
ආයතන අංශය,
සර්වේ ජනරාල් කාර්යාලය,
කිරුල පාර, කොළඹ 5.

## ඉල්ලුම් පත්‍රය

### මැනුම් දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන නිලධාරි තනතුර

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.

2. ලිපිනය :————.

3. (i) උපන් දිනය :————.
   (ii) 70.7.24 දිනට වයස : අවු.———, මාස :———, දින :——.

4. (i) ජාතිය :————.
   (ii) ලාංකික වන්නේ උත්පත්තියෙන් ද ? ලියාපදිංචි කිරීමෙන් ද ? :————.

5. උපන් ස්ථානය :—
   (i) අයදුම්කරුගේ :————.
   (ii) ඔහුගේ පියාගේ :————.
   (iii) ඔහුගේ පිය පස මුත්තාගේ :————.
   (iv) ඔහුගේ පිය පස මී මුත්තාගේ :————.

6. විවාහක අවිවාහක බව :————.

7. අධ්‍යාපන සුදුසුකම් :————.

8. කාර්මික සුදුසුකම් :————.

9. පළපුරුද්ද :————.

10. වෙනත් සුදුසුකම් :————.

11. දැනටමත් රැකියාවක් කරන්නේ නම් :—
    (i) යෙදී සිටින තනතුර :————.
    (ii) ආයතනය :————.
    (iii) වැටුප් විස්තර :————.

12. අමුණා ඇති චරිත සහතික ලබාගත් අය :
    (i) :————.
    (ii) :————.

ම විසින් මෙම ඉල්ලුම් පත්‍රයේ සඳහන් කරන ලද තොරතුරු සත්‍ය බව හා නිවැරදි බව සහතික කරමි. මෙහි අඩංගු යම් කිසි කරුණක් අසත්‍ය හෝ වැරදි හෝ බව සොයාගනු ලැබුවහොත්, තේරීමට කලින් මා නුසුදුසුවීමත්, පත්වීමෙන් පසුව එම ප්‍රමාද දෝෂය අනාවරණය වුවහොත් කිසිම වන්දියක් නොමැතිව සේවයෙන් පහකරනු ලැබීමටත් මා යටත් වන බවද දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

7-341—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඊ.ඒ/2/17.

## රේගු දෙපාර්තමේන්තුව

### මෝටර් ලෝන්ච් යාත්‍රා තණ්ඩල්කරුවන්ගේ තනතුරු

මෙම දෙපාර්තමේන්තුවේ මෝටර් ලෝන්ච් යාත්‍රා කණ්ඩල් කරුවන්ගේ තනතුරුවල ඇති ඇබෑර්තු කීපයක් සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. පහත සඳහන් ආකෘති පත්‍රයට අනුකූල වන සේ පිළියෙල කරන ලද අයදුම්පත් 1970 ජූලි මස 21 දිනට පෙර, කොළඹ ලංකා රේගුවේ ප්‍රධාන රේගු අයකැමි (පාලන ශාඛාව) වෙත ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය.

2. **වැටුප් ක්‍රමය.**—මෙම තනතුරට අදාල වාර්ෂික වැටුප් ක්‍රමය රු. 1,044—42—1,296 වේ. (ඒකාබද්ධ වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 3,060—8 × 60—3,540 වේ).

3. **සේවයේ යෙදවීම පිළිබඳ කොන්දේසි.**—මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තෝරා ගනු ලබන අපේක්ෂකයන් පත් කරනු ලබන්නේ තුන් අවුරුදු ආධුනික සේවා කාලයකට යටත්වය.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම් කරුවෙකුටම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(i) කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ උසස් විභාගයකින් සමත්ව සිටිය යුතුය.

(ii) ලෝන්ච් යාත්‍රා තණ්ඩල්කරුවකුගේ සහතිකය ලබාගත තිබිය යුතුය.

(iii) 1970 ජූලි මස 21 දිනට වයස අවුරුදු 25 කට නොඅඩු හා අවුරුදු 35 කට නො වැඩි විය යුතුය.

(iv) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සනීපයකින් යුක්ත විය යුතුය.

5. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් වලට පහත සඳහන් සහතික වල පිටපත් පමණක් අමුණා එවිය යුතුය.

(i) උප්පැන්න සහතිකය.

(ii) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහතිකය.

(iii) තණ්ඩල්කරු සහතිකය.

(iv) පළපුරුද්ද සම්බන්ධයෙන් ඇති සහතික.

(v) මෑත දී ලබාගත් චරිත සහතික තුනක්.

6. දැනටමත් රජයේ සේවයේ නියුතු අපේක්ෂකයන් ගෙන් ලැබෙන අයදුම්පත් තම තමන් සේවය කරන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

7. අයදුම්පත් මගේ පුද්ගලික නමට හෝ දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරියකුගේ පුද්ගලික නමට නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (II) ඡේදයේ මුලින්ම සඳහන් රාජ්‍ය සේවයේ තනතුරු වලට කරනු ලබන පත් කිරීම් සම්බන්ධයෙන් පොදු කොන්දේසි ද බලනු මැනවි.

ප්‍රධාන රේගු අයකැමි.

1970 ජූලි මස 1 දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

## තණ්ඩල්කරුවන්ගේ තනතුරු සඳහා අයදුම් පත්‍රය

1. සම්පූර්ණ නම :————.

2. ලිපිනය :————.

3. 1970 ජූලි මස 21 දිනට වයස :————.

4. (i) ජාතිය :————.
   (ii) ලාංකික වන්නේ උත්පත්තියෙන් ද, නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද යන වග :————.

5. උපන් ස්ථානය :
   (i) අයදුම්කරු :————.
   (ii) අයදුම්කරුගේ පියා :————.
   (iii) අයදුම්කරුගේ පියාගේ පියා :————.

6. අධ්‍යාපන සුදුසුකම් :————.

7. පළපුරුද්ද ගැන විස්තර :————.

මා විසින් ඉහත සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසිම කරුණක් අසත්‍ය හෝ වැරදි බව තෝරා ගැනීමට පළමු සොයාගනු ලැබුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත් පත්වීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

7-383—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

## ලංකා ගුවන් විදුලි සංස්ථාව

### පුරප්පාඩු

පහත සඳහන් තනතුරු සඳහා ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ :—

**අධ්‍යක්ෂ, මුදල් :—**

**සුදුසුකම්.**—(අ) සුදුසුකම් ලැබීමෙන් පසුව අවුරුදු 3 කට නොඅඩු පළපුරුද්දක් ඇති වාර්ටර්ඩ් ගණකාධිකාරිවරයකු හෝ

(ආ) විධායක තත්ත්වයේ අවුරුදු 10 කට නොඅඩු සේවාවක් ඇති චාර්ටර්ඩ් ගණකාධිකරණය පිළිබඳ මධ්‍ය පරීක්ෂණය සමත් ගණකාධිකාරිවරයකු හෝ

(ඇ) විධායක තත්ත්වයේ අවුරුදු 10 කට නොඅඩු සේවාවක් සහිතව අවුරුදු 15 කට නොඅඩු සේවාවක් ඇති රජයේ/සංස්ථා සේවාවේ ගණකාධිකාරිවරයකු හෝ විය යුතුයි.

**වයස.**—අවුරුදු 35–50 දක්වා.

**වැටුප් ක්‍රමය.**—සියළු දීමනා සහිතව රු. 1,250—1,750 (50×10) රු. 1,350 ට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

**මුදල් කළමනාකරු :**

**සුදුසුකම්.**—(අ) චාර්ටර්ඩ් ගණකාධිකාරිවරයකු හෝ

(ආ) සුදුසුකම් ලැබීමෙන් පසුව අවුරුදු 3 ක පළපුරුද්දක් ඇති පිරිවැය හා වැඩ පිළිබඳ ගණකාධිකාරිවරයකු හෝ

(ඇ) සුදුසුකම් ලැබීමෙන් පසුව අවුරුදු 5 ක පළපුරුද්දක් ඇතිව, චාර්ටර්ඩ් ගණකාධිකරණය පිළිබඳ මධ්‍ය පරීක්ෂණය, හෝ

(ඈ) විධායක තත්ත්වයේ අවුරුදු 10 කට නොඅඩු පළපුරුද්දක් සහිතව ලංකා කාර්මික විද්‍යාලයේ ගණකාධිකරණය පිළිබඳ ඩිප්ලෝමාව, හෝ

(ඉ) විධායක තත්ත්වයේ යටත් පිරිසෙයින් අවුරුදු 8 ක සේවාවක් සහිතව රජයේ සේවයේ හා/හෝ සංස්ථාවක අවුරුදු 25 ක සේවාවක්.

**වයස.**—අවුරුදු 30–45 දක්වා.

**වැටුප් ක්‍රමය.**—රු. 720—1,200 (40×7—50×4) රු. 920 ට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

මෙම දැන්වීම අග ඇති ආකෘතිය අනුව සැපයිය යුතු අයදුම්පත් 1970 ජූලි මස 24 වැනි දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි කළ තැපැලෙන් කොළඹ 7, ලංකා ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතුයි. ලිපි කවරයේ ඉහළ වම් කෙළවර ගැලපෙන පරිදි " අධ්‍යක්ෂ මුදල්/මුදල් කළමනාකරු " යන්න පැහැදිලිව ලිවිය යුතුයි.

සුසිල් කුමාර් මුණසිංහ,
අධ්‍යක්ෂ ජනරාල්.

1970 ජූනි මස
කොළඹ 7.

## නිදර්ශන අයදුම්පත

**.................තනතුර සඳහා වූ අයදුම්පතයි**

1. සම්පූර්ණ නම :————.
   (1) මුල් අකුරු සහිත නම :————.
   (මහත්මයාද, මහත්මියද, මෙනෙවියද යනවග සඳහන් කරන්න)
   (2) ලිපිනය :————.
2. උපන් දිනය හා ස්ථානය :————.
   (1) 1970 ජූලි මස 24 වැනි දිනට වයස :— අවු :— මාස :— දින :——
   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි)
3. ජාතිය :————.
4. අධ්‍යාපන හා පුහුණුවීම් :————.

| ඉගෙනීම ලැබූ පාසැල් හා ආයතන | දින ............ සිට ......... දක්වා | සමත්වී ඇති විභාග | දරූ වගකිවයුතු තත්ත්ව හා යෙදුණු වැදගත් පරිබාහිර කටයුතු |
|---|---|---|---|
| ———— | ———— | ———— | ———— |

5. සමත්වී ඇති උසස්ම විභාගය :————.
   (1) සිංහල :————.
   (2) දෙමළ :————.
   (3) ඉංග්‍රීසි :————.
   (සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි)
6. පළපුරුද්ද :————.
   (ඔබගේ අතීත පළපුරුදුකම් හා රැකියා පිළිබඳ වාර්තා කාල ක්‍රමානුගතව යොදන්න)

| ආයතනයේ නම | උසුලනලද තනතුර | දින ............ සිට ......... දක්වා | අස්වීමට හේතුව |
|---|---|---|---|
| ———— | ———— | ———— | ———— |

7. ඔබගේ පෞද්ගලික ජීවිතය ගැන හොඳින් දන්නා නෑයන් නොවන තිදෙනෙකුගේ නම, ලිපින හා තත්ත්ව :—
   (1)
   (2)
   (3)
8. චරිත සහතික ලබාගෙන ඇති අයගේ නම සහ තනතුරු :—
   (1)
   (2)
   (3)
9. වෙනත් විස්තර :————.
10. මෙම අයදුම්පතෙහි මවිසින් ඇතුළත් කොට ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි ඒවා බව මම සහතික කරමි. තෝරා ගැනීමේදී හෝ තෝරා ගැනීමට පෙර මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හා වැරදි ඒවා බව හෙළිවුවහොත්, මා යථෝක්ත තනතුර සඳහා නුසුදුස්සකු වන බවත් පත්වීම ලද පසු වරදක් හෙළිවුවහොත් කිසිම වන්දියක් නැතිව සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බවත් මම දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

## අධ්‍යාපන අමාත්‍යාංශය

### පේරාදෙනිය රජයේ ගුරු විද්‍යාලයේ භාෂා පර්යේෂණාගාරයේ අභ්‍යාසාචාර්ය/ආචාරිණී තනතුර

අධ්‍යාපන අමාත්‍යාංශයේ පේරාදෙනිය රජයේ ගුරු විද්‍යාලයේ භාෂා පර්යේෂණාගාරයේ අභ්‍යාසාචාර්ය/ආචාරිණී තනතුර සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. පහත දක්වා ඇති ආදර්ශ ආකෘතිපත්‍රයට අනුකූලව පිළියෙල කරගතයුතු වූ අයදුම්පත් 1970.7.24 වැනි දින හෝ ඊට පෙර, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ, ස්ථිර ලේකම් (ගුරු විද්‍යාල ශාඛාව) වෙත ලැබෙන සේ එවිය යුතුය.

සටහන්.—(i) මුද්‍රිත ඉල්ලුම්පත් පෝරම සඳහා කරන ලද ඉල්ලීම් භාරගත නොහැකිය. මෙම දැන්වීමේ දක්වා ඇති ආදර්ශ ආකෘතිපත්‍රය අනුව, අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍රය පිටපත් කරගත යුතුය.

(ii) යම්කිසි අයදුම්පතක් තැපැලේ දී නැති වී හෝ ප්‍රමාද වී හෝ ඇතැයි ඉදිරිපත් කරන කිසිම දෝෂාරෝපණයක් ගැන සලකා බැලිය නොහැක. ස්වකීය අයදුම්පත් එවීමට අවසාන දිනය තෙක් පමාවන අයදුම්කරුවන් විසින් එසේ පමාවීමෙන් සිදුවන පාඩුව උඳ දරාගත යුතුය.

2. (i) **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—පාඨශාලා ගුරු විශ්‍රාම වැටුප් රෙගුලාසි යටතේ මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ, ගුරුවරයෙකු වශයෙන් විශ්‍රාම වැටුප හිමි තනතුරක් දරණ අයදුම්කරුවකු මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුව හොත් ඔහු/ඇය දරණ තෙක් මෙම තනතුර විශ්‍රාම වැටුප් සහිත යයි ප්‍රකාශ කිරීමට කටයුතු කරනු ලැබේ.

(ii) තෝරාගනු ලබන අයදුම්කරු පළමු වශයෙන් පේරාදෙනිය ගුරු විද්‍යාලයට පත් කරනු ලබන අතර, වෙනත් ඕනෑම ගුරු විද්‍යාලයකට මාරුකර යැවීමට ඉඩ තිබේ.

3. **වැටුප් හා දීමනා.**—මෙම තනතුරට හිමි වාර්ෂික ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේය : රු. 6,024—4 × 144, 8 × 180 සහ 2 × 240—8,520.

**සටහන.**—69.10.1 ට පෙර මීට අනුරූප වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 3,420—4 × 120—8 × 180—2 × 240—රු. 5,820.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ට චරිතයෙන් හා හොඳ ශරීර සනීපයෙන් යුක්ත බව.

(බී) 1970.7.24 වැනි දිනට අයදුම්කරුවන් වයස අවුරුදු 25ට අඩු හෝ අවුරුදු 50 ට වැඩි හෝ නොවිය යුතුය. (රජයේ සේවයේ නියුක්ත නිලධාරීන්ට ඉහළ වයස් සීමාව අදාළ නොවේ.)

(සී) අන්තර් මධ්‍යම විභාගයේ ද හෝ අ. පො. ස. (උසස් පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සාමාර්ථය හා පස් අවුරුදු ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති පුහුණු උපාධිධාරීන් විය යුතුය. උපාධි විභාගයේ ඉංග්‍රීසි සාමාර්ථය ලබා ඇති අය ගැන විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

5. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ පොදු කොන්දේසිවලටද අවධානය යොමු කරනු ලැබේ.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්

1970.7.1 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේදී ය.

## ආදර්ශ ආකෘති පත්‍රය

### පේරාදෙනිය රජයේ ගුරු විද්‍යාලයේ භාෂා පර්යේෂණාගාරයේ අභ්‍යාසාචාර්ය/ආචාරිණී තනතුර පිළිබඳ ඉල්ලුම් පත්‍රයයි

1. (i) සම්පූර්ණ නම :————.
(ii) මුලකුරුත් සමග නම :————.
(මයා, මිය මෙනවිය යන වග සඳහන් කරන්න.)

2. ලිපිනය :—
(i) පෞද්ගලික :————.
(ii) රාජකාරී :————.

3. (i) 1970.7.24 වැනි දිනට නිවැරදි වයස :————.
(ii) උපන් දිනය : අවුරුදු...... මාස...... දින......

4. ජාතිය හා එය ලද අන්දම :————.

5. උපන් ස්ථානය :
(අ) ඉල්ලුම්කරු :————.
(ආ) ඉල්ලුම්කරුගේ පියා :————.
(ඉ) ඉල්ලුම්කරුගේ පියාගේ පියා :————.

6. (i) ලබාගත් දින සමග අධ්‍යාපන සුදුසුකම් (ලබාතිබෙන අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත් ඈමිණිය යුතුය) :————.
(ii) උපාධියට ගත් විෂයයන් :————.

7. වෘත්තීය සුදුසුකම් (ලබාතිබෙන වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික වල පිටපත් ඈමිණිය යුතුය)

8. ඉගෙනීම ලැබූ පාසල් හා විද්‍යාල (ඇතුළත්වූ සහ අස්වූ දින සඳහන් කළ යුතුය) :————.

9. ඉගැන්වීමේ පළපුරුද්ද (මෙහි පහත දක්වෙන පෝරමයෙහි විස්තර සඳහන් කරන්න) :—

| පාඨශාලාවේ හෝ විද්‍යාලයේ නම | ඇතුල්වූ දිනය | අස්වූ දිනය | දරූ තනතුරු | සේවාකාලය | | | අස්වීමට හේතු |
|---|---|---|---|---|---|---|---|
| | | | | අ. | මා. | දි. | |
| | | | | | | | |

10. සිංහල පිළිබඳව ලබා තිබෙන සුදුසුකම් :————.

11. චරිත සහතික ලබාගත් අයගේ ( ඥාතීන් නොවේ) නම් හා නිලතල (සහතික තුනක පිටපත්) (මුල් පිටපත් නොවේ) ඈමිණිය යුතුය) රජයේ සේවකයන් සම්බන්ධයෙන් මෙය අනවශ්‍යය.

12. **වෙනත් සුදුසුකම්.**—මවිසින් මෙම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට මම මෙයින් සහතික කරමි. මේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය හෝ වැරදි දෙයක් සඳහන් කර තිබෙන බව තෝරා ගැන්මට කලින් අනාවරණය වූවහොත්, මා එයින්ම නුසුදුසු බවට පැමිණෙනවා පමණක් නොව තෝරා පත්කර ගැනීමෙන් පසු ඒ බව දැනගන්නට ලැබුණහොත් කිසිම වන්දි ගෙවීමක් නොමැතිව මා රාජකාරියෙන් පහකර දමනු ලැබීමට යටත්වන බවද දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

7–344—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

## ලංකා ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලය

### ප්‍රධාන ගණකාධිකාරී තනතුර

ලංකා ඛණිජවැලි සංයුක්ත මණ්ඩලයේ ප්‍රධාන ගණකාධිකාරී තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම්.**—ගණකාධිකරණය පිළිබඳව අවුරුදු 10ක පළපුරුද්දක් ඇති චාට[illegible] හෝ [illegible]ස්ට් ඇන්ඩ් වර්ක්ස් පිළිබඳ ගණකාධිකාරිවරයෙක්, [illegible] අවුරුදු දහයෙන් අවුරුදු පහක්ම ගණකාධිකරණයෙහිලා [illegible] විධායක තත්ත්වයක් ඉසිලූ අයෙක් විය යුතුය.

**වේතන ක්‍රමය.**—සියළු දීමනා ඇතුළු මාසික වේතනය රු. 1,600—50—රු. 1,800.

**සුදුසුකම්.**—වරලත් ගණකාධිකාරීන්ගේ සාමාජිකත්වය හා ගණකාධිකරණය පිළිබඳ අවුරුදු 3ක පළපුරුද්ද ඇති අයටද ඉල්ලුම් කළ හැක.

**වේතන ක්‍රමය.**—සියළු දීමනා ඇතුළු මාසික වේතනය රු. 1,200—50—රු. 1,400.

පළපුරුද්ද හා සුදුසුකම් අනුව ඉහත සඳහන් වේතන පරිමාණයන්හි සුදුසු ස්ථානයක තෝරාගනු ලබන අයට පත්වීම් දෙනු ලැබේ.

අධ්‍යාපන සුසුදුකම්, වයස පළපුරුද්ද හා සිංහල දැනුම සඳහන් අයදුම්පත් කොළඹ 10, අංක 167, ශ්‍රී විපුලසේන මාවතේ පිහිටි ලංකා ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලයේ ලේකම්/සේවක නිලධාරි නමට 1970 ජූලි මස 24 දිනට පෙර ලැබෙන්නට ඉදිරිපත් කළ යුතුයි.

ජෝ. ඉශලගේවා,
ලේකම්/සේවක නිලධාරී.
ලංකා ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලය.

167, ශ්‍රී විපුලසේන මාවත,
කොළඹ 10.

7–282—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

යොමු අංකය : එස්.ජී. 76

## ලංකා විභාග දෙපාර්තමේන්තුව

### ලංකා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය පිළිබඳ ව්‍යවස්ථා හා විෂය නිර්දේශ-හින්දු ධර්මය

1969 ඔක්තෝබර් මස 28 වැනි දින සංශෝධන පත්‍රිකා අංක 2 යටතේ පූර්වෝක්ත විෂය වෙනුවෙන් ප්‍රකාශයට පත් කරන ලද අලුත් විෂය නිර්දේශය අවලංගු කළ බවත්, නැවත දන්වන තුරු එම විෂය වෙනුවෙන් මෙතෙක් බලපැවැත්වූ විෂය නිර්දේශය තව දුරටත් වලංගු කරන බවත් සියළුම පාසැල් ප්‍රධානීන් හා අයදුම් කරුවන් වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. ඩී. ඩබ්ලිව්. සුමනසූරිය,
විභාග කොමසාරිස්,

1970 ජූනි මස 24 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ
විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

7–300—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

---

## අම්පාරේ හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයේ තුන් අවුරුදු කාර්මිකයින්ගේ පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත්කරගැනීම

1970–71 අධ්‍යයන සැසිවාරය සඳහා කාර්මිකයින්ගේ තුන් අවුරුදු (දෙවුරුදු විද්‍යාලයීය හා එක් අවුරුදු කර්මාන්ත) පූර්ණ කාල දිවා පාඨමාලාව හැදෑරීම වස් අම්පාරේ හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයට සිසුන් ඇතුළත් කර ගැනීම පිණිස සුදුසුකම් ඇති අයැදුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත් බාරගනු ලැබේ.

2. **සුදුසුකම් :**

(අ) වයස.—1970 ඔක්තෝබර් මස 1 දිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 16 ට නොඅඩු හෝ අවුරුදු 20 ට නොවැඩි හෝ විය යුතුයි.

(ආ) අධ්‍යාපන සුදුසුකම්.—අ. පො. ස. (සා.පෙ.) විභාගයේදී ශුද්ධ ගණිතය, භෞතික විද්‍යාව, හා එක් භාෂාවක්ද ඇතුළුව විෂයයන් හයකින් එක්වර සාමාර්ථය ලබා තිබිය යුතු අතර යටත් පිරිසෙයින් විෂයයන් තුනකට සම්මාන සාමාර්ථය තිබිය යුතුවක් හැර යටත් පිරිසෙයින් ඉන් දෙකක් විද්‍යා විෂයයන් විය යුතුය.

3. හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයට ඇතුළත් විය හැක්කේ පිරිමි අයදුම්කරුවන්ට පමණක් වන අතර ඔවුන් ආයතනයේ ශිෂ්‍ය නිවාසයේ නැවතී සිටිය යුතුවේ.

4. මෙහි පහත 6 වැනි ඡේදයේ නියමිත දින සීමාව තුළ ඉදිරිපත් කිරීමට හැකිවන සේ පහත දක්වෙන අංක 1 දරණ ෆෝර්මය පුරවා අයදුම්කරු විසින් තමා ඉගෙනගත්/ දැනට ඉගෙන ගන්නා මහා විද්‍යාලයේ හෝ පෞද්ගලික ද්විතීය පාඨශාලාවේ විදුහල්පති වෙත හැකි ඉක්මණින් යැවිය යුතුය. (මුද්‍රිත ෆෝර්ම නිකුත් කරනු නොලැබේ)

බාහිර අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ ඉල්ලුම්පත්‍ර තමා අන්තිමට ඉගෙනීම ලැබූ පාසැලේ විදුහල්පති මගින් එවිය යුතුය.

5. පාසැල් ප්‍රධානින් විසින් ඔවුන්ට ලැබී ඇති ඉල්ලුම්පත්‍ර මැනවින් පරීක්ෂා කර පහත දක්වෙන 2 ආකෘති ෆෝර්මයේ උපලේඛනයක් පිළියෙල කොට කාර්මිකයන්ගේ පාඨමාලාව හැදෑරීමෙහිලා අයදුම්කරුවන්ට ඇති සුදුසුකම් ගැන නිර්දේශ කළ යුතුය. මෙසේ සුදුසුකම් නිර්දේශ කිරීමේදී අයදුම් කරුවන්ගේ අධ්‍යාපනික ක්‍රියාකාරිත්වය හා විෂය මාලාවට බාහිර වූ වැඩ කටයුතු සැලකිල්ලට ගත යුතුය. (මුද්‍රිත ෆෝර්මය නිකුත් කරනු නොලැබේ.)

6. පාසැල් ප්‍රධානියන් විසින් ඉල්ලුම්පත්‍ර හා ඔවුන්ගේ නිර්දේශ ඇතුළත් උප ලේඛනද 1970 ජූලි 31 දින නොඉක්මවා ලැබෙන සේ අම්පාරේ හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයේ ලේඛකාධිකාරි වෙත එවිය යුතුය. එදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

7. ඇතුළත් කර ගැනීම සඳහා ශිෂ්‍යයන් තෝරාගනු ලබන්නේ ලිඛිත විභාගයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

8. අධ්‍යාපන පොදු සහතිකපත්‍ර උසස් පෙළ විභාගය නොමැතිව, කාර්මිකයින්ගේ පාඨමාලාව අවුරුදු දෙකක් හැදෑරීමෙන් පසුව, කාර්මිකයින්ගේ අවසාන විභාගයේදී නියමිත තත්වයක් ලබා ගන්නා මෙම ආයතනයේ හා කටුබැද්දේ ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ හොඳම ශිෂ්‍යයන් 50 ස් දෙනාට කටුබැද්දේ ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ පස් අවුරුදු කාර්මික විද්‍යා පාඨමාලාවේ (ඉංජිනේරු උපාධි පාඨමාලාවකට සමාන) මූල් ස්ථාන 50 ලැබෙනු ඇත. (ලබාගතයුතු තත්වය පසුව නියම කරනු ලැබේ.)

එච්. විජයරත්න,
විද්‍යාලයාධිපති,
හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනය.

1970 ජූනි මස 20 දින,
හාඩි ජ්‍යෙ. කා. ආ., අම්පාර.

### පෝර්මය I

## හාඩි ජ්‍යෙෂ්ඨ කාර්මික ආයතනයට ඇතුලත්වීම සඳහා ඉල්ලුම් පත්‍රය

**සැළකිය යුතුයි.**—ඉහත දක්වෙන දන්වීමේ ප්‍රකාර අධ්‍යාපන සුදුසුකම් ඇති හා නියමිත වයස් සීමාව තුළ සිටින අය පමණක් ඉල්ලුම් කළ යුතුය.

1. සම්පූර්ණ නම :————.
 (පැහැදිලි අකුරෙන්)
2. ලිපිනය :————.
3. උපන් දිනය :————.
 (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)
4. 1970.10.1 දිනට වයස අවුරුදු :————. මාස :————.දින :————.
5. ජාතිය :————.
6. පියාගේ/මවගේ හෝ භාරකරුගේ නම හා ලිපිනය :————.
7. ඉගෙනගත් මහා විද්‍යාලයේ හෝ පෞද්ගලික ද්විතිය පාඨමාලාවේ නම සහ ලිපිනය :————.
8. (අ) ඉහත දක්වෙන දන්වීමේ 2 (ආ) ඡේදයේ සඳහන් අධ්‍යයන සුදුසුකම් ලබාගත් අ.පො.ස. (සා.පෙ.) විභාගයේ වර්ෂය හා මාසය :————.
 (ආ) සමත්වූ විෂයයන් හා ලබාගත් තත්වය (සාමාන්‍ය සාමාර්ථය, සම්මාන සාමාර්ථය, විශිෂ්ඨ සාමාර්ථය ආදි වශයෙන්)

| විෂයයන් | ලබාගත් තත්වය |
|---|---|
| 1. ශුද්ධ ගණිතය | .............................. |
| 2. භෞතික විද්‍යාව | .............................. |
| 3. භාෂාව | .............................. |
| 4. | |
| 5. | |
| 6. | |

9. විෂය මාලාවෙන් බාහිර ක්‍රියාකාරිත්වයන් :————.
10. 1970–71 අධ්‍යයන වර්ෂය සඳහා කටුබැද්දේ ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ කාර්මික පාඨමාලාවකට ඇතුල්වීමට ඉල්ලුම් කලේද ?

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

ඉල්ලුම්පත්‍ර උප ලේඛනය : පෝර්මය 2 පාඨශාලාවේ නම :

| අංකය | අයදුම්කරුගේ නම හා ලිපිනය | උපන්දිනය | සමත් විෂයයන් ශ්‍රේණි සහිතව | | | අ.පො.ස. (සා.පෙ.) සමත් වර්ෂය | අධ්‍යාපන ප්‍රගතිය | පාඨශාලා ප්‍රධානියාගේ නිර්දේශය හා වෙනත් කිවයුතු කරුණු |
|---|---|---|---|---|---|---|---|---|
| | | | භාෂා | විද්‍යා | වෙනත් | | | |
| | | | | | | | | |

————,
විද්‍යාලයාධිපතිගේ අත්සන.

දිනය : ————.

7–345—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

---

## මොරටුව කටුබැද්දේ ලංකා උසස් කාර්මික විද්‍යායතනයට සිසුන් ඇතුලත් කිරීම—1970/71

**පාඨමාලාව.**—උසස් කාර්මික විද්‍යා ඩිප්ලෝමා

ලංකා උසස් කාර්මික විද්‍යායතනය විසින් 1970/71 අධ්‍යාපන වසරට උසස් කාර්මික විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවට සිසුන් ඇතුලත් කර ගැනීම සඳහා පහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් ලත් අයගෙන් අයදුම් පත් භාරගනු ලැබේ :—

(අ) 1969 දෙසැම්බර් මාසයේ පවත්වන්ට යෙදුන අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ දී,
 භෞතික විද්‍යාව
 රසායන විද්‍යාව
 ශුද්ධ ගණිතය
 ව්‍යවහාර ගණිතය යන සියළුම විෂයයන්ගෙන් සාමාර්ථය ලත් අය.

(ආ) 1969 දෙසැම්බර් මාසයේ අධ්‍යාපන පොදු සහතික පත් උසස් පෙළ විභාගයේ දී මුළු ලකුණු ප්‍රමාණය ඉහලින් ලබා අඩු වශයෙන් ඉහත සඳහන් විෂයයන් 3 කින් සාමාර්ථය ලබා ඇති අය.

2. 1970 ඔක්තෝබර් 1 වෙනි දිනට වයස අවුරුදු 17 ක් හෝ ඊට වැඩි ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයටම මේ සඳහා ඉල්ලුම් කල හැක.

3. මේ සඳහා නියමිත අයදුම්පත් පෝර්ම මොරටුව, කටුබැද්දේ, ලංකා උසස් කාර්මික විද්‍යායතනයේ ලේඛකාධිකාරී තැනගෙන් ලබාගෙන, 1970 අගෝස්තු මස 8 වැනි දිනට හෝ ඊට පෙර ඔහුට ලැබෙන සේ එවිය යුතුය.

4. ලංකා උසස් කාර්මික විද්‍යායතනය එක්සත් ජාතීන්ගේ විශේෂ අරමුදලේ අනුග්‍රහය ලබා පාලනය වන අතර, සිවිල්, යාන්ත්‍රික, විදුලිය, ඉලෙක්ට්‍රොනික්, සහ විදුලි සංදේශ කර්මාන්තඥයින් පුහුණු කිරීමේ පාඨමාලා පවත්වනු ලැබේ. රජයේ හෝ පිළිගත් ජාතික කාර්මික ව්‍යාපාරවල හෝ සුදුසු අංශයන්හි දොලොස් මසකට නො අඩු කාලසීමාවක් කාර්මික ප්‍රායෝගික පුහුණුවක් ද මෙම පස් අවුරුදු පාඨමාලාවට ඇතුලත් වේ. මින් ලබන ප්‍රායෝගික පුහුණුව රැකියාවල් සඳහා පිළිගනු ලැබේ. මෙම පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කරන අයට ඉංජිනේරු උපාධියට සමාන ඉංජිනේරු ඩිප්ලෝමා සහතිකය ප්‍රදානය කරනු ලැබේ.

5. 1970 ඔක්තෝබර් මාසයෙන් ආරම්භවන අධ්‍යයන වර්ෂය වෙනුවෙන් සිවිල් ඉංජිනේරු අංශයේ 30 දෙනෙකුද, යාන්ත්‍රික ඉංජිනේරු අංශයේ 30 දෙනෙකුද, විදුලිය, ඉලෙක්ට්‍රොනික් සහ විදුලි සංදේශ ඉංජිනේරු අංශයේ 45 දෙනෙකු සඳහා ඉඩකඩ තිබේ.

ඇල්. එච්. සුමනදාස,
අධ්‍යක්ෂ.

ලංකා උසස් කාර්මික විද්‍යායතනය,
කටුබැද්ද-මොරටුව.
1970 ජූලි 10.

7–349—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

කොළඹ 3, ගෝල්ෆේජ් කෝට් 2කේ තට්ටු ගෙවල්, අංක 53 විදේශ හා ස්වදේශ වෙළඳාම් අමාත්‍යාංශයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය: තැ. පෙ. 560, කොළඹ 3.) 1970.10.1 සිට 1971.9.30 තෙක් ලියුම් කවර සැපයීම සඳහා 1970 අගෝස්තු මස 11 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ, ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50ක් රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1970 අගෝස්තු 10 වැනි සඳුදා දවල් 12 වනතෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

ඇස්. ඒ. පී. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්‍ෂ.

1970.7.10 වැනි දින,
කොළඹ දී ය.

7–405—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

---

## රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

ගෝල්පේස් කෝට් 2 කේ, කොළඹ 3, තට්ටු ගෙවල් අංක 53, විදේශ හා ස්වදේශ වෙළඳාම්, අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය: තැ. පෙ. 560 කොළඹ 3) 1970. 10. 1 සිට 1971. 9. 30 තෙක් ආණ්ඩුවේ නැව් බඩු ගෙනැවිත් භාරදීම සඳහා 1970 අගෝස්තු මස 11 වෙනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

මෙම සේවය සඳහා ලාංකිකයින්ට සහ ලාංකික සමාගම්වලට පමණක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ, සර් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 300 ක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ, ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1970 අගෝස්තු මස 10 වෙනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

එස්. ඒ. පී. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්‍ෂ.

1970 ජූලි මස 10 වෙනි දින,
කොළඹ දී.

7–404—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

---

## රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

කොළඹ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය: තැ. පෙ. 418, කොළඹ 1) පහත සඳහන් සේවයන් සඳහා ඒ ඒ දිනයන්හි පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර්පත්‍ර භාරගනු ලැබේ:—

| සේවයන් | ටෙන්ඩර්පත්‍ර භාරගන්නා අවසාන දිනය |
|---|---|
| 1. මෙරට සෑදූ පිත්තල හා යකඩ ඉස්කුරුප්පු ඇණ සැපයීම ... ... | 1970.8.4 |
| 2. 1970.10.1 සිට 71.9.30 තෙක්, මෙරට සෑදූ කපු බැනියන් සැපයීම ... ... | 1970.8.4 |
| 3. 1970.10.1 සිට 71.9.30 තෙක්, මෙරට සෑදූ බහු පිටපත් පොත් යනාදිය සැපයීම ... | 1970.8.4 |
| 4. 1970.10.1 සිට 71.9.30 තෙක්, මෙරට සෑදූ කාබන් කඩදාසි සැපයීම ... | 1970.8.11 |
| 5. 1970.10.1 සිට 71.9.30 තෙක්, මෙරට සෑදූ යතුරු ලියන රිබන් පටි සැපයීම ... | 1970.8.11 |

කාබන් කඩදාසි හා යතුරු ලියන රිබන්පටි සැපයීම සම්බන්ධව ඒ ඒ ටෙන්ඩර්කරුවන් විසින් කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ, අංක 363 දරණ "විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ලංකා ආයතනයේ" තමන්ගේ සැම්පල් පරීක්ෂා කරවා ගෙන ඒ සඳහා ලැබෙන සහතිකපත් ස්වකීය ටෙන්ඩර්පත්‍ර සමග අමුණා ඉදිරිපත් කළ යුතුය.

ටෙන්ඩර්පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂතැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර්පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුය.

එක් එක් සේවය සම්බන්ධයෙන් රුපියල් 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් මෙහි ඉදිරිපත් කළ විට ඉහත සඳහන් දිනවලට කලින් දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

එස්. ඒ. පී. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1970.7.10 දින,
කොළඹ දීය.

7–406—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය : 2/18/30/69

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

නුවර එළිය දිස්ත්‍රික්කයේ පහත සඳහන් තැනීම් වැඩ සඳහා 1970 අගෝස්තු මස 7 වෙනි දින පස්වරු 2.30 දක්වා කොළඹ තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර්පත් භාරගනු ලැබේ :—

| වැඩෙහි නම | ලියා පදිංචි විය යුතු මුදල රු. |
|---|---|
| හබරගල ජනපදයට ජලය සැපයීම ... | 15,000 |

2. ඉහත සඳහන් වැඩය ඉදිරියෙහි සඳහන් කර ඇති ප්‍රමාණයට හෝ ඊට වැඩි මුදලකට රජයේ වැඩ, වාරිමාර්ග හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුවක කොන්ත්‍රාත් කරුවන් වශයෙන් ලියා පදිංචි වී ඇති ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති හා සමුපකාර සමිතිවලට සහ ලියා පදිංචි වී සිටින කොන්ත්‍රාත් කරුවන්ටද, 1970 අගෝස්තු 5 වැනි දින දහවල් 12 දක්වා නුවර එළියේ දිසාපති කායර්‍යාලයෙන් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පෝර්ම අපේක්ෂකයින් විසින් ඒ වෙනුවෙන් රුපියල් 50 ක මුදලක් නුවර එළියේ දිසාපති කායර්‍යාලයේ තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් නුවර එළියේ දිසාපති වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති සහ සමුපකාර සමිති, ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට මුදල් තැන්පත් කිරීම අවශ්‍ය නැත. චෙක්පත්, මුදල් ඇණවුම් හා තැපැල් ඇණවුම් භාරගනු නොලැබේ.

4. ටෙන්ඩර් පෝර්ම සම්පූර්ණ කර පිටපත් දෙකකින් යුක්තව ලේඛනගත තැපැලෙන් කොළඹ 1, මහ ලේකම් කායර්‍යාලය, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති කියා එවිය යුතුයි. ටෙන්ඩරය බහාලන කවරය සීල් තැබිය යුතු අතර, කවරයේ උඩ වම් කෙළවරේ වැඩෙහි නම ලියා තැබිය යුතුයි.

5. 1970 අගෝස්තු 7 වෙනි දින පස්වරු 2.30 ට ඉඩම් කොමසාරිස් කායර්ාලයේ අංක 357 දරණ කාමරයේ ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ.

6. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩය කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු යන දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතු අතර, ඔවුන් පමණක් එසේ නියුක්ත කරනු ලැබිය යුතුය. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගනු ලබන්නේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරෙනි.

7. කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසි සපුරාලීමට කොන්ත්‍රාත්කරුවා යම්කිසි විධියකින් අසමත් වුවහොත් කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එළඹෙන ලද නිළධාරියා විසින් විශේෂ අවස්ථාවලදී ඉඩම් හා කෘෂිකර්ම අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වරයාගේ එකඟත්වය ඇතිව, නිශ්චිත ලියවිල්ලකින්, එකී නිළධාරියා විසින් අනුමත කරන ලද ලාංකීක නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැක.

එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව, ලාංකික කම්කරුවන් යෙදවීම තහනම් වන අතර, එය කොන්ත්‍රාත්තුව කඩ කිරීමක් ලෙස සලකනු ලැබේ.

8. මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා " ලාංකික " යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියකු බව අදහස් කෙරෙන අතර, එවැන්නක් එකී පාඨයට ඇතුළත් වෙයි.

9. මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණ වූ ද කම්කරුවන්ට වේතන ගෙවීමේ සම්බන්ධ යෙන් දැනට බලපවත්වන සහ මින්මතු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසිවලට අනුකූලවූ ද වේතනයක් ගෙවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ විය යුතුයි.

10. කොන්ත්‍රාත්කරු විසින් වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පත පොත, චෙක්රෝල් පොත්, පෙරෙට්ටු පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට ඉඩම් කොමසාරිස් විසින් විධිමත් බලය දෙනු ලැබූ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ඕනෑම නිළධාරියෙකුට ඒවා පරීක්ෂාකිරීමට ඉඩ දීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

11. ටෙන්ඩර් කරුවන්ට අවශ්‍ය වෙනත් තොරතුරු ඉල්ලුම් පතක් මගින් නුවර එළියේ දිසාපතිගෙන් ගත හැක.

ඩබ්ලිව්. එච්. නවරත්න,
නුවරඑළියේ දිසාපති වෙනුවට,
සහකාර දිසාපති.

1970 ජූනි මස 30 වෙනි දින,
නුවර එළියේ දිසාපති කායර්ාලයේ දීය.

7–407—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### 1970–71 කෑම ද්‍රව්‍ය සැපයීමට ටෙන්ඩර් කැඳවීම

1970–71 මුදල් වර්ෂය තුළ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ පහත සඳහන් ආයතනවලට කෑම ද්‍රව්‍ය සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් (" ලාංකික " යනුවෙන් අදහස් කරන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියෙක් වූවෙකි) ටෙන්ඩර් කැඳවනු ලැබේ.

| ආයතනය | ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල | | ඇප මුදල | ටෙන්ඩර් භාර ගන්නා අවසන දිනය හා විවෘත කරන දිනය |
|---|---|---|---|---|
| | රු. | ශ. | රු. ශ. | |
| මීගමුව බන්ධනාගාරය ... ... ... ... | 50 | 0 ... | 1,000 ... | 3. 8.1970 |
| තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලය, වතුපිටිවෙල ... ... ... | 50 | 0 ... | 1,000 ... | 3. 8.1970 |
| එළිමහන් සිරකඳවුර, කෝපායි (යාපනය) ... ... ... ... | 50 | 0 ... | 1,000 ... | 3. 8.1970 |
| එළිමහන් අභ්‍යාස විද්‍යාලය, තල්දෙන (බදුල්ල) ... ... ... ... | 50 | 0 ... | 1,000 ... | 5. 8.1970 |
| බදුල්ල බන්ධනාගාරය ... ... ... ... | 50 | 0 ... | 1,000 ... | 5. 8,1970 |
| මඩකලපුව බන්ධනාගාරය ... ... ... ... | 50 | 0 ... | 1,000 ... | 5. 8.1970 |
| අනුරාධපුර බන්ධනාගාරය ... ... ... ... | 50 | 0 ... | 1,000 ... | 5. 8.1970 |
| ගාල්ල බන්ධනාගාරය ... ... ... ... | 50 | 0 ... | 1,000 ... | 7. 8.1970 |
| මාතර බන්ධනාගාරය ... ... ... ... | 50 | 0 ... | 1,000 ... | 7. 8.1970 |
| තංගල්ල බන්ධනාගාරය ... ... ... ... | 50 | 0 ... | 1,000 ... | 7. 8.1970 |
| අලුත්කඩේ බන්ධනාගාරය ... ... ... ... | 50 | 0 ... | 1,000 ... | 7. 8.1970 |

2. ආහාර සඳහා ගණන් ඉදිරිපත් කිරීමේදී බත්, පාන්, තේ, සීනි, පරිප්පු, වියලි මිරිස්, සුදුරු සහ කොත්තමල්ලි යන ද්‍රව්‍යයන් ඇතුලත් නොකොට ගණන් ඉදිරිපත් කළ යුතු බව හා (සියලුම ආයතනයන් සම්බන්ධයෙන් බත්, පාන්, තේ, සීනි, පරිප්පු, වියලි මිරිස්, සුදුරු සහ කොත්තමල්ලි ආදී ද්‍රව්‍යයන් අත්හැරීමෙන් ආහාර මිශ්‍රණයේ වෙනස් කම් ඇති කර ඇති බවද, අනුරාධපුරය, කෝපායි, බදුල්ල, තල්දෙන සහ වතුපිටිවෙල සම්බන්ධයෙන් එළවළුද අත්හැරිය යුතු බව ටෙන්ඩර්කරුවන් විසින් විශේෂයෙන් දැනගත යුතුව ඇත.)

3. එක් ආයතනයක් සඳහා සියළුම ටෙන්ඩර් පත්‍ර අනුපිටපතක් සහිතව ලියුම් කවරයක බහා සීල් තබා "සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, බන්ධනාගාර දෙපාර්තමේන්තුව, කොළඹ 9" කියා එවිය යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. රෙජිස්ටර් තැපෑලෙන් නොඑවන ටෙන්ඩර් පත්‍ර ටෙන්ඩර්කරුවා විසින් හෝ ඔහුගේ නියෝජිත යකු විසින් හෝ කොළඹ 9, බන්ධනාගාර මූලස්ථානයේ මූලස්ථාන අධිකාරි ඩබ්ලිව්. ජේ. ද සිල්වා මහතාට භාරදී එය ලැබුනු බවට ලියවිල්ලක් ලබාගත යුතුයි.

5. ටෙන්ඩර් පත්‍ර බහාලූ කවරයේ වම් පැත්තේ උඩ කෙළවරේ "………ආහාර ද්‍රව්‍ය සැපයීමේ ටෙන්ඩරය" කියා ලියා මෙහි 1 වැනි වගන්තියේ සඳහන් ඒ ඒ දිනවල පෙරවරු 10.30ට ප්‍රථම බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයාට ලැබෙන සේ එවිය යුතුයි. මෙහි 1 වැනි වගන්තියේ සඳහන් ඒ ඒ දිනවල පෙරවරු 10.35ට කොළඹ 9, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයාගේ කායර්ාල යේදී (බන්ධනාගාර මූලස්ථානය) ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී එහි පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

6. ටෙන්ඩර ෆෝර්ම කොළඹ 9, බේස්ලයින් පාරේ පිහිටි බන්ධනාගාර කොමසාරිස්වරයාගේ ප්‍රධාන කායර්ාලයෙන් ලබාගත හැක. නියමිත ෆෝර්මයේ ලියා නැති ටෙන්ඩර් පත්‍ර භාරගනු නො ලැබේ. එක් එක් බන්ධනාගාරය වෙනුවෙන් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලබන්නේ ඒ ඒ බන්ධනාගාරය වෙනුවෙන් ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනයට (ඉහත 1 වැනි ඡෙදය බලන්න) පෙරදින ප.ව. 3.30 දක්වා පමණි.

7. ටෙන්ඩර් භාරගැනීම නැවැත්වූ දින සිට මාස 3ක් යනතුරු ටෙන්ඩර්කරුවන් තමන්ගේ ටෙන්ඩර් පත්‍ර සැළකිල්ලට භාජන කිරීමට ඉඩ තැබිය යුතුයි.

8. ටෙන්ඩර්වල සියලුම වෙනස් කිරීම් හා මැකීම්වලට ටෙන්ඩර්කරුවන් විසින් තම කෙටි අත්සන තැබිය යුතුයි.

9. මෙහි පහත සඳහන් පරිදි, ටෙන්ඩර් පත්‍ර සඳහා තැන්පත් මුදල් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායර්ාලයේ හෝ කොළඹ කච්චේරිය හැර වෙන ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ බවට කුවිතාන්සි ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම ලබාගත හැක.

යමෙකුට ඔහුගේ ටෙන්ඩරය පිළිගත් බව ලියමනකින් දන්වනු ලැබීමෙන් දින 10ක් ඇතුළත දී අවශ්‍ය ඇප මුදල් ඉදිරිපත් කිරීමට නුපුළුවන් විනි නම් හෝ එසේ කිරීමෙන් වැලකී සිටී නම් හෝ තැන්පත් කරන ලද මුදල් රාජසන්තක වෙනවා ඇත. ඉන්පසු රජය සම්බන්ධ කවර කොන්ත්‍රාත්තුවකට හෝ බැඳීමට නොහැකි වනසේ ඔහුගේ නම කොන්ත්‍රාත් කඩකරන්නන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනවා ඇත. තව ද, කොන්ත්‍රාත් කඩ කිරීමේ අලාභ වශයෙන් ලංකාවේ වලංගු මුදලින් රු. 3,000ක් රජය වෙනුවෙන් බන්ධනාගාර කොමසාරිස්වරයාට ගෙවීමට එම කොන්ත්‍රාත්කරුවන්ට සිදුවෙනවා ඇත. මෙම මුදල අලාභ වශයෙන් නීති මාර්ගයෙන් අයකර ගැනීමේ බලය බන්ධනාගාර කොමසාරිස් වෙත පැවරී ඇත.

ටෙන්ඩරය පිළිගත් බව දන්වන නිවේදනය ටෙන්ඩර්කරු විසින් දෙනු ලබන ලිපිනයට තැපෑලෙන් යවනු ලැබුවහොත්, හෝ නො එසේව එහි ගෙන ගොස් භාර දුන හොත් එම නිවේදනය ටෙන්ඩර්කරුවා වෙත ලැබුනු ලෙස සලකනු ලැබේ. අන්‍ය සියලු තැන්පත් මුදල් කොන්ත්‍රාත්තුවට අත්සන් තැබී මෙන් පසු ආපසු ගෙවනු ලැබේ.

10. එක් එක් බන්ධනාගාරයේ එක් එක් උපලේඛන සඳහා තැන්පත් කරනු ලබන මුදල් වෙනුවෙන් වෙන වෙනම කුවිතාන්සි ලබාගත යුතු බවත්, ඉදිරිපත් කරනු ලබන ගණන් ඉලක්කමින් මෙන් ම වචනයෙන් ද සඳහන් කළ යුතු බවත්, එසේ එම ගණන් වචනයෙන් සඳහන් නොවන ටෙන්ඩර් ප්‍රතික්ෂේප විය හැකි බවත්, ටෙන්ඩර්කරුවන්ගේ විශේෂ සැලකිල්ලට භාජන කරවනු ලැබේ.

11. ටෙන්ඩරය පිළිගැනීමෙන් පසු එසේ පිළිගෙනු ලැබූ ටෙන්ඩර්කරුවන්, කොන්ත්‍රාත්තුව මනා අන්දමින් ඉටුකරන වගට, ඇප කරුවන් වශයෙන් ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට කැමති වගකිවයුතු පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් ඉදිරිපත් කළ යුතුයි.

12. ඒ ඒ කොන්ත්‍රාත්තුව මනා අන්දමින් ඉටුකරන වගට අවශ්‍ය තරම් ඇපකරුවන් පොරොන්දු පත්‍රයකින් බැඳීම අවශ්‍යය. තැන්පත් කිරීමට අවශ්‍ය ඇප මුදල් ප්‍රමාණය මෙම නිවේදනයේ 1 වැනි වගන්තියේ සඳහන් ප්‍රකාරය. ඒ ඒ බන්ධනාගාර අධිකාරි තැනගෙන් කොන්ත්‍රාත්තුව හරියාකාර කිරීමට වුවමනාකරන සියලු තොරතුරු දැනගත හැකිය.

13. ඒ ඒ ටෙන්ඩරය සඳහා වන සියලු කොන්දේසි සම්පූර්ණයෙන් ඉටුවී නොමැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ගැන සලකා බලනු නොලැබේ.

14. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියලුම ටෙන්ඩර් හෝ සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කිරීමේ හා ඕනෑම ටෙන්ඩරයක් කොටස් වශයෙන් පිළිගැනීමේ අයිතිවාසිකම් මුළුමනින්ම ටෙන්ඩර් මණ්ඩලය වෙත තබාගනු ලැබේ.

15. ටෙන්ඩර් මණ්ඩලයේ අවසරය නොමැතිව කිසිම කොන්ත්‍රාත්තුවක් අනෙකෙකු වෙත පැවරීම හෝ බදු වශයෙන් දීම හෝ කළ නොහැක. කොන්ත්‍රාත්කරුවෙකු වෙනුවෙන් කොන්ත්‍රාත්තුව ඉටු කිරීමේ බලය යම් පුද්ගලයෙකු වෙත පවරමින් නිකුත් කරන ලද ඇටෝර්නි බලය පිළිනොගෙන ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය රජය සතුය.

16. ඒ ඒ බන්ධනාගාර අධිකාරීන්ට සෑහෙන තරම් කරුණු ඇත්නම් කිසියම් පුද්ගලයකු කොන්ත්‍රාත්කරු විසින් වැඩෙහි යෙදවීම ගැන තම විරුධත්වය ලියා දැනුම් දිය හැක. එවැනි කිසිම පුද්ගලයකු කොන්ත්‍රාත්කරු විසින් වැඩෙහි නොයෙදවිය යුතුය. කොන්ත්‍රාත්තුව ඉටුකිරීමේ දී කොන්ත්‍රාත්කරුවන් විසින් වැඩෙහි යෙදවිය යුත්තේ ලාංකිකයන් පමණකි.

17. (අ) මීට ප්‍රථමයෙන් රජයේ කොන්ත්‍රාත්තුවක් භාර නොගත් ටෙන්ඩර්කරුවෙක් ටෙන්ඩර් පත්‍ර ඉල්ලා සිටීමේදී තමාගේ සම්පූර්ණ නම, ස්ථිර ලිපිනය, තමන්ට අයිති දේපොළ ආදිය පිහිටි දිස්ත්‍රික්කය හෝ කොට්ඨාශය සඳහන් කොට, තමා පදිංචි පළාතේ ආදායම් පාලක තැන විසින් සහතික කරන ලද වාර්තාවක් ටෙන්ඩර් පෝරම දෙනු ලබන නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතුයි. ඉඩකඩම් හා දේපොළවල ප්‍රමාණය හා වටිනාකම එහි සඳහන් කළ යුතුයි.

(ආ) මීට ප්‍රථම මෙම දෙපාර්තමේන්තුව වෙනුවෙන් කොන්ත්‍රාත්තු ඉටු කරන ලද ටෙන්ඩර්කරුවන්, එසේ සේවය ඉටු කරන ලද්දේ, දැනට ටෙන්ඩර් කැඳවන දිස්ත්‍රික්කයේ හෝ කොට්ඨාශයේ හෝ සඳහා නොවේ නම්, තමන් විසින් එසේ කොන්ත්‍රාත්තුව ඉටුකරන ලද පළාත් හෝ දිස්ත්‍රික්ක සඳහන් කළ යුතුයි.

(ඇ) වෙන දෙපාර්තමේන්තුවකට කොන්ත්‍රාත්තු ඉටු කරන ලද ටෙන්ඩර්කරුවන්, එම දෙපාර්තමේන්තුවේ නම සහ තමා සේවය කළේ කුමන දිස්ත්‍රික්කයේද යනාවග සඳහන් කරමින් ඒ බවට එම දෙපාර්තමේන්තුවෙන් ලබාගත් ලියවිල්ලක් ඉදිරිපත් කළ යුතුයි.

18. ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින බන්ධනාගාර කොමසාරිස්වරයා සමග කොන්ත්‍රාත්තුවට අත්සන් තැබිය යුතුයි. එබඳු නිළධාරියෙකුගේ පදවි නාමයෙන් අදහස් කළ යුත්තේද, ගිණිය යුත්තේද, ලංකාණ්ඩුව යටතේ දැනට එම පදවිය දරන්නාවූ නිළධාරියාද, ඔහුට පසුව එම පදවිය දරන්නාවූ නිළධාරියාද වේ.

19. මේ පිළිබඳව වැඩි විස්තර බන්ධනාගාර මූලස්ථානයෙන් ලබාගත හැක.

කොළඹ 9, බන්ධනාගාර මූලස්ථානයේ දීය.
1970.7.1.

ඇෆ්. ඩී. ඇල්. රත්නායක,
බන්ධනාගාර කොමසාරිස්,

7–346—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

---

## නැගෙනහිර කඩදසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

### ටෙන්ඩර් අවලංගු කිරීම

සුදු කරනලද සල්ෆයිට් කල්ක ටොන් 1,400 ක් සඳහා 1970 මැයි 30 දින තෙක් භාරගත් ටෙන්ඩර් අවලංගු කර ඇත.

ති. බ. නාරන්පනාව, සාමාන්‍යාධිකාරි
නැගෙනහිර කඩදසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

356, යූනියන් පෙදෙස, කොළඹ 2.
1970 ජූනි 28 දින.

7–386/1—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

---

## නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

### රීල් වශයෙන් යුත් නිව්ස් ප්‍රින්ට් දිග ටොන් 5,000 ක් සැපයීම සඳහා වූ ටෙන්ඩරය

1970 අගෝස්තු මාසයේ සිට මාස් පතා කොටස් වශයෙන් රීල් වශයෙන් යුතු [illegible] ස්ටෑන්ඩඩ් නිව්ස් ප්‍රින්ට් දිග ටොන් 5,000 ක් සැපයීම සඳහා මූලිකයන්ගෙන් හෝ බලලත් නියෝජිතයන්ගෙන් මිල ගණන් කැඳවේ. එකී මිල ගණන් කොළඹට සැපයෙන මි. හා වා. මිල ගණන් විය යුතුය.

සැපයුම් විස්තර හා ප්‍රමාණයන් දැක්වෙන ටෙන්ඩර් ආකෘතිපත්, සංයුක්ත මණ්ඩලය හා ලියාපදිංචිව ඇති සියළුම විදේශීය සැපයුම්කරුවනට තැපැල් කර ඇත.

ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට අදහස් කරන අනිකුත් අය, මූලිකයන්ගේ/නිෂ්පාදකයන්ගේ නම් හා ලිපිනයන් සඳහන් කර ටෙන්ඩර් ආකෘතිපත් සඳහා අයැදිය යුතුය.

1970 ජූලි 22 වෙනි දින පස්වරු 2ට මිල ගණන් බාරගැනීම අවසන් කෙරේ.

ති. බ. නාරන්පනාව,
සාමාන්‍යාධිකාරි,
නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

356, යූනියන් පෙදෙස,
කොළඹ 2,
1970. 6. 22 දින,

7-386/2—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

---

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

මීගමුවේ කුරණ දියහොඳ ඇලවත්ත නිවාස ක්‍රමයේ අඩි 30ක් [illegible] පාරක් ඉදිකිරීම සඳහා 1970 අගෝස්තු මස 7 දින පෙරවරු 10 දක්වා මිල ගණන් කැඳවනු ලැබේ.

ටෙන්ඩර් පත් නිකුත් කරනුයේ 1970 ජූලි මස 23 දින දවල් 12 දක්වා පමණි.

වැඩි විස්තර මෙම දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

ඩී. රාජේන්ද්‍රා,
ජාතික නිවාස කොමසාරිස් තැන.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
සර් සිත්තම්පලම් ගාඩිනර් මාවත,
කොළඹ 2.

7–283—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

## කෑගල්ල දිස්ත්‍රික්කයේ සංවර්ධන වැඩ කරවා ගැනීම සඳහා ටෙන්ඩර් කැඳවීම

පහත විස්තර දක්වා ඇති සේවාව සඳහා 1970 ජූලි 30 වෙනි දින දවල් 10 දක්වා ග්‍රාම සංවර්ධන සමිතිවලින්ද, සමුපකාර සමිතිවලින් සහ වාරිමාර්ග, රජයේ වැඩ, දුම්රිය හා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති (රු. 5,000 දක්වා) කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ. ටෙන්ඩර් එදිනම සවස 3 ට විවෘත කරනු ලැබේ.

| ජනපදයේ නම | ප්‍රා. ආ. නි. කොට්ඨාශය | වසම |
|---|---|---|
| තිවබෝල්ඩ් ජනපදයේ ළිං 3 තැනීම | බෙලිගල් කෝරලය | නාරන්ගොඩ |
| දෙරවක ජනපදයේ ළිඳක් තැනීම | එම ... | දෙරවක |
| දන්ගමපල ජනපදයේ ළිං 2 තැනීම | අටුළුගම් කෝරලය... | හිඟුරලකන්ද |
| අහුගහකන්ද ජනපදයේ ළිඳක් තැනීම | බෙලිගල් කෝරලය | කොබ්බෑවල |
| ඉළුක්පිටිකන්ද ජනපදයේ ළිං 2 තැනීම | අටුළුගම් කෝරලය... | පනාවල |
| පඹේගම ජනපදයේ ළිං 2 තැනීම... | එම ... | හිඟුරලකන්ද |
| දනාගම වත්තේ රජයේ බංගලාවේ අළුත්වැඩියා | ගල්බඩ කෝරලය... | වැගන්තලේ |

2. කෑගල්ල දිසාපතිතුමාගෙන් ටෙන්ඩර් පත්‍ර ලබාගෙන, ටෙන්ඩර් පත්‍ර ඒවායේ එව්ය යුතුයි. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කරනු ලබන කවරයේ වම් උඩ කෙලවරේ "......................................................." (ඒ ටෙන්ඩරයේ නම සඳහන් කරන්න) යන්න සඳහන් කර සීල්තබා දිසාපති, කෑගල්ල යන්න එහි ලිපිනය පැහැදිලිව ලියා ලේඛනගත තැපෑලෙන් එව්ය යුතුයි. සියළුම ටෙන්ඩර් අනුපිටපත් සහිතව එව්ය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර ලේඛනගත තැපෑලෙන් නොඑවතොත්, ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් ඒවා අතින්, ටෙන්ඩර් පත්‍ර දිසාපති වෙත හෝ ඔහුගෙන් බලය ලත් නිලධාරිතුමා වෙත පුද්ගලිකව භාර දිය යුතුයි.

4. ලියා පදිංචි කළ තැපෑලෙන් එවනු ලබන සියළුම ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ටෙන්ඩර් විවෘත කරන දිනයේම ටෙන්ඩර් කරුවන් වෙත එවනු ලැබේ. යම් ටෙන්ඩර් කරුවෙකුට ටෙන්ඩර් වසන දිනයේ සිට දින 4 ක් තුළ එවැනි ලිපියක් නොලැබුණහොත් ඔහු වහාම දිසාපතිගෙන් ඒ ගැන විමසිය යුතුයි. එසේ කරුණු විමසීමේ දී ටැන්ඩරය පිළිබඳ විස්තරත්, ටෙන්ඩර් කරුගේ ලිපිනයත්, ටෙන්ඩරය ලේඛනගත තැපෑලෙන් යවනු ලැබ් නම් එහි ලේඛනගත ලිපියේ අංකයත් දැක්විය යුතුයි.

5. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත දිනයේ උදේ 9.30 වනතෙක් ටෙන්ඩර් පත්‍ර දෙනු ලැබේ. එවේලේ නිකුත් කරනු ලබන සෑම ටෙන්ඩරයක් වෙනුවෙන්ම රු. 25 ක් කෑගල්ලේ දිසාපතිතුමා නමින් තැන්පත් කර ඒ වගට කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි. මෙසේ ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම ලංකාවේ ඕනෑම දිසාපති කාර්යාලයකදී කළ හැකියි. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරුවා එසේ ඔහුගේ ටෙන්ඩරය තෝරාගත් බව දන්වා සති තුනක් ඇතුළත, අවශ්‍ය ඇප මුදලක් තැන්පත් කර සේවාව සතුටුදායක ලෙස අවසන් කිරීම සඳහා ගිවිසුම්පත් අත්සන් කළ යුතුයි. එසේ කිරීම නොවුවහොත්, ඒ ටෙන්ඩර්කරුවාගේ නම වැඩ පැහැර හැරිය ටෙන්ඩර්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කරනු ලැබේ. තෝරාගනු ලැබුවාවූ ටෙන්ඩරයේ වටිනාකමින් 5% ක ඇප මුදලක් තැන්පත් කළ යුතුයි. එසේ මුදල් තැන්පත් කිරීම ලංකාවේ ඕනෑම දිසාපති කාර්යාලයකදී කළ හැකිය.

6. නියමිත ටෙන්ඩර් පෝරමයේ ලියා නැති හෝ නියමිත කොන්දේසි වලට පටහැනිව සකස් වී ඇති සියළුම ටෙන්ඩර් පත්‍ර, පිළිගත හැකි ටෙන්ඩර් පත්‍ර ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් හා ගණන් ඉතා පැහැදිලිව තීන්තෙන් ලිවිය යුතු අතර, එහි යම් වෙනස් කිරීමක් හෝ කපා ගැමක් ඇත්නම් එය ටෙන්ඩර් කරුගේ කෙටි අත්සන් යොදා අවලංගු කළ යුතුයි.

7. ටෙන්ඩරයේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය ඉතා පැහැදිලිව ලිවිය යුතුය.

8. යම් ටෙන්ඩරයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂෙප කිරීම හෝ නැතිනම් ටෙන්ඩරයකින් කොටසක් පිළිගැනීමේ අයිතිය ටෙන්ඩර් මණ්ඩලය වෙත තබා ගනු ලැබේ.

9. පත්කර ගනු ලැබුවාවූ ටෙන්ඩර්කරුවන් එම සේවාව සඳහා " ලාංකික " කම්කරුවන් පමණක් ගත යුතුයි. " ලාංකික " යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් ලංකාවේ පුරවැසියෙක්වූ තැනැත්තෙක්ය යන්නයි.

10. 1934, 19 වැනි අංකය දරණ කම්කරු ආඥපනතේ (117 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ සේවකයෙකු වෙනුවෙන් වන්දිය ඉල්ලා එවනු ලබන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරු ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

11. කොන්ත්‍රාත්කරුවාට භාර දිය යුතු සියළුම දැන්වීම් ඔහුගේ අතට දුන්නොත්, නැතහොත් ඔහු විසින් කොන්ත්‍රාත්කරුගේ ලිපිනයට තැපෑලෙන් යැවුවහොත්, එය ඔහුගේ අතට භාර දුන්නාසේ සැලකිය යුතුයි.

12. වැඩට ගැනීම නුසුදුසුයයි කල්පනා කරන යම් සේවකයෙකු කොන්ත්‍රාත්කරු වැඩට ගැනීම ගැන විරුද්ධ වීමේ හෝ ඕනෑම සේවකයෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ බලය ආණ්ඩුවට තබා ගනු ලැබේ.

13. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තු වට තනිතනිව හෝ එම ලැයිස්තුවේ නම සඳහන් වන කෙනෙකු සමග නම ඇතුළත්ව හෝ ටෙන්ඩර් මණ්ඩලය විසින් විරුද්ධවන කිසිවකු සමග හෝ කොන්ත්‍රාත්තුවට බැඳෙනු නොලැබේ.

14. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් යටත් පිරිසෙයින් සති තුනකටවත් වෙනස් නොවන ඒවා විය යුතුයි.

15. මේ පිළිබඳව වැඩි විස්තර කෑගල්ලේ දිසාපති කාර්යාලයේ ඉඩම් අංශයෙන් සතියේ වැඩ කරන දින වල උදේ 9 සිට සවස 4.30 දක්වා ලබා ගත හැකියි.

16. 5 වැනි වගන්තිය යටතේ සඳහන් ටෙන්ඩර් පෝරම සඳහා මුදල් හෝ ඇප මුදල් තැන්පත් කිරීමට ග්‍රාම සංවර්ධන සමිති හෝ සමුපකාර සමිති හෝ කම්කරු සමිති බැඳී නැත.

17. 16 වැනි වගන්තිය යටතේ සමිති දැනට ක්‍රියාත්මක සමිති බවට ග්‍රාම සංවර්ධන උප අධ්‍යක්ෂගෙන්, සමුපකාර සංවර්ධන උප කොමසාරිස් සහ කම්කරු උප කොමසාරිස්ගෙන් සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි.

ජී. පී. හත්තොටුව,
අතිරේක දිසාපති,
කෑගල්ලේ දිසාපති වෙනුවට.

1970 ජූනි 29 වැනි දින,
කෑගල්ලේ දිසාපති කාර්යාලයේදී ය.

7-295—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### කුරුණෑගල උප කොට්ඨාශය

කුරුණෑගල උප කොට්ඨාශයේ බඩු ප්‍රවාහණය 1970-71 වර්ෂය සඳහා ටෙන්ඩර්පත් 1970 අගෝස්තු මස 4 වෙනි අඟහරුවාදා පෙරවරු 10 දක්වා කුරුණෑගල, වයඹ කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම එහිදී සිදු කෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 15,000කට වැඩි ගණන කට පුහුණු වැඩ සඳහා ලියාපදිංචිවූ කොන්ත්‍රාත් කරුවන්ට, සමුපකාර සමිති වලට සහ ග්‍රාම සංවර්ධන සමිති වලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් කළ හැක.

3. 1970 ජූලි 31 වෙනි සිකුරාදා පස්වරු 3 වනතෙක් (එදින ඇතුළුව) කාර්යාල වේලාවන් තුළදී කුරුණෑගල, නිකවැරටිය, පුත්තලම යන වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල වලින් ලබා ගත හැකි පෝර්මවල ටෙන්ඩර් අයදුම්පත් සකස් කළ යුතුය. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට මවුක් කරන වාරිමාර්ග වැඩ සහ ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශනයක්, ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද? නැද්ද? යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝර්ම නිකුත් කිරීමට ප්‍රථම රුපියල් 25ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරුතැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර්කරුවන් විසින් ඔවුන් සතුව ඇති ලොරිවල විස්තර, ඒවායේ ලියාපදිංචි අංකය, ප්‍රමාණය යනාදී විස්තර සැපයිය යුතුය.

4. මේ ටෙන්ඩරය ගැන සියලු විස්තර, ගිවිසුම, වැඩය පිළිබඳ විශේෂ විස්තර යනාදිය කාර්යාලයීය වේලාවන් තුළදී කුරුණෑගල උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැක.

එල්. හරිදාස,
වාරිමාර්ග ඉංජිනේරු,
කුරුණෑගල උප කොට්ඨාශය.

1970 ජූනි මස 18 දින,
කුරුණෑගල වාරිමාර්ග කාර්යාලයේ යදී.

7-217—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

තංගල්ලේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1970 ජූලි මස 31 වන දින දහවල් 12 වන තෙක් ගාල්ල උප කොටසේ, මාදූගශ ව්‍යාපාරයේ මාගල ඇල කරදිය ඉවත් කිරීමේ නිර්මිතයට අවශ්‍ය ලී දොරවල් සැපයීමට ටෙන්ඩර් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම සිදු කෙරේ.

ටෙන්ඩර් පත්‍ර ගාල්ලේ වාරිමාර්ග කාර්යාලයෙන් රු. 25 ක මුදලක් තැන්පත් කිරීමෙන් ලබා ගත හැක.

ජේ. එම්. ඩී. එල්. සෙනෙවිරත්න,
වාරිමාර්ග ඉංජිනේරු,
ගාල්ල උප කොටස.

7–223—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—මහනුවර උප කොට්ඨාශය

මහනුවර උප කොටසේ "කුණ්ඩසාලේ පාංශු පරිශීලන අංශයේ අමතර නිවාස හා රසායනාගාරය වැඩි දියුණු කිරීම" සඳහා ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍ර කුණ්ඩසාලේ වාසී, මධ්‍යම කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1970.7.30 දින පෙ. ව. 10 තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම සිදු කරනු ලැබේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 27,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට, සමූපකාර සමිතිවලට හා ග්‍රාමසංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ හැක.

3. 1970.7.28 දින ප. ව. 4.30 දක්වා (එදින ඇතුළුව) කාර්යාල වේලාවන් තුල පමණක් මහනුවර/මාතලේ/නුවරඑළිය හා හසලක යන වාරිමාර්ග කාර්යාලයකින් ලබාගතහැකි ආකෘති පත්‍රවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් ආකෘතිපත්‍ර ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ සහ ඒවායේ වටිනාකම දක්වන ප්‍රකාශයක්, ඔවුන්ට ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට ඉඩදිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැනවෙත ඉදිරිපත් කළ යුතුයි. ආකෘතිපත් ඉදිරිපත් කිරීමට පළමු රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ඉහත සඳහන් ඕනෑම වාරිමාර්ග කාර්යාලයක හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

4. ටෙන්ඩර් දෙපිටපතකින් ඉදිරිපත් කළ යුතුවා මෙන්ම ලියාපදිංචි කළ සීල් තබන ලද කවරයක බහා එවිය යුතුය. "කුණ්ඩසාලේ පාංශු පරිශීලන අංශයේ රසායනාගාරය වැඩිදියුණු කිරීම" යනුවෙන් කවරයේ වම් කෙළවරේ පැහැදිලිවම සඳහන් කළ යුතුයි. ටෙන්ඩරය පිළිබඳ වෙනත් අදාල විස්තර හා සැලසුම් රාජකාරි වේලාවන් තුල මහනුවර වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

ඒ. ටී. ජේ. ද පින්ටෝ,
මහනුවර වාරිමාර්ග ඉංජිනේරු,
මහනුවර උප කොට්ඨාශය.

1970. 6. 24 දින,
කුණ්ඩසාලේ දීය.

7–308—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### හිඟුරක්ගොඩ හා පොළොන්නරුව යන ගොවිපලවල 1970 යල් කන්නයේ ගොයම් කැපීම

පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, කෘෂිකර්ම ගොවිපල් අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් ඉහත සඳහන් ගොවිපලවල් දෙකේ පහත දැක්වෙන කොටස්වල ගොයම් කැපීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1970 ජූලි 26 වැනි දින පෙරවරු 10.30 දක්වා භාරගනු ලැබේ.

ඒ ඒ ගොවිපලේ ඒ ඒ කොටස්වල ගොයම් කැපීම පහත සඳහන් දිනයන්හිදී ආරම්භ කළ යුතුයි :—

| ගොවිපල | කුඹුරු කොටස් අංකය | කැපීමට ඇති අක්කර ප්‍රමාණය | කැපීම ආරම්භ කළ යුතු දිනය | දිනකට කැපිය යුතු අක්කර ගණන |
|---|---|---|---|---|
| හිඟුරක්ගොඩ ගොවිපල | ඩී | ... 50 ... | 1970.9.5 ... | 10 |
| | සී | ... 43 ... | 1970.9.5 ... | 10 |
| | ඊ | ... 16 ... | 1970.9.8 ... | 10 |
| | ඊ | ... 36 ... | 1970.9.1 ... | 10 |
| පොළොන්නරුව ගොවිපල | ඒ I | ... 36 ... | 1970.9.15 ... | 15 |
| | බී I | ... 25 ... | 1970.9.18 ... | 15 |
| | බී II | ... 50 ... | 1970.9.20 ... | 15 |
| | බී වැව කොටස... | 15 ... | 1970.9.25 ... | 15 |
| | ඒ වැව කොටස... | 15 ... | 1970.9.28 ... | 15 |
| | පර්යේෂණ කොටස | 18 ... | 1970.9.14 ... | 18 |
| | ගබඩා කොටස ... | 15 ... | 1970.9.30 ... | 15 |

2. මෙහි එක එක කොටස සඳහා වෙන වෙනම ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර්කරුවන්ට අවශ්‍ය නම් එක කොටසකට වැඩි ගණනක් සඳහා ටෙන්ඩර් ඉල්ලීමට හැකිය. ඒ සඳහා වෙන වෙනම ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර්කරු විසින් ගන්නා ලද අක්කර ප්‍රමාණය කිසියම් හේතුවක් ඇතොත් එහි අක්කර ප්‍රමාණය අඩු කිරීමට ටෙන්ඩර් මණ්ඩලයට බලය ඇත. එමෙන්ම වර්ෂාව හෝ වෙනත් නොවැලැක්විය හැකි කරුණක් ඇති වුවහොත් නියමිත දිනට පෙර හෝ පසු දිනයක් නියම කිරීමට අදල ගොවිපලේ කළමනාකරුට බලය ඇත. ගොයම් කපන දැකැති ආදිය ටෙන්ඩර්කරු විසින් සපයා ගත යුතුයි.

3. ඉහත සඳහන් ගොවිපලවල්වල කපන ලද ගොයම්, කපන ස්ථානයේ සිට යාර 150 ක් පමණ ඈතින් වූ ස්ථානයකට ගෙන ගොස් ගොවිපල කළමනාකරුගේ උපදෙස් අනුව ගොඩගැසිය යුතුයි. මෙය වී වැටෙන්නට නොදී කළ යුතුය. අඟල් 6 කට වැඩිය ඉපනැල්ලක් කුඹුරේ නොතිබිය යුතුයි. ගොයම් කැපීමෙන් පසු කොළ ගැනීමේ දී වැටුණු ගොයම් කරල් හෝ උප්පිඩි යනාදිය හොඳින් අහුලා ගොඩ ගසා කොළයට එක් කළ යුතුයි.

4. නියමිත කාලය ඇතුලතදී ගොයම් කැපීම නිම කළ යුතු අතර, නියමිත දිනය ඉක්මවා පමාවන සෑම දිනයක් සඳහාම දඩ මුදලක් ටෙන්ඩර් කරු විසින් ගෙවිය යුතුය. මෙම දඩ මුදල කෙතෙක් ද යන්න තීරණය කිරීමේ බලය ටෙන්ඩර් මණ්ඩලය සතුය. ඉහත සඳහන් කර ඇති දිනකට නියමිත අක්කර ප්‍රමාණය කැපීමට ටෙන්ඩර්කරුට හැකියාවක් තිබිය යුතුය. එමෙන්ම ගොවිපලේ කළමනාකරු සෑහීමකට පත්වන අයුරු එය ඉටු කළ යුතු වේ. කපන ලද ගොයම් වලට වැස්සෙන් බාධාවක් නොපැමිණියහොත් කපාගත් දින සිට දින දෙකක් ඇතුලත ගොඩ ගැසිය යුතුයි. වැස්සෙන් බාධාවක් ඇති වුවහොත් ගොයම් කොළ කොතැනක ගොඩගැසිය යුතුදැයි ගොවිපල කළමණාකරු තීරණය කරනවා ඇත. ටෙන්ඩර්කරුගේ පැහැර හැරීමෙන් හෝ නොසැළකිල්ලෙන් හෝ වී වලට හානියක් සිදුවේ නම් එම හානියේ වටිනාකම ටෙන්ඩර්කරුගෙන් අයකර ගනු ලැබේ.

5. අනුරාධපුර ගොවිපල පාලන හා නිෂ්පාදන කාර්යාලයේ පරිපාලන නිලධාරි තැනගෙන් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායේ එවිය යුතුය. සියළුම ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර දෙපිටපතකින් යුක්තව නිසියේ සම්පූර්ණ කර සීල් තබා "සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, කෘෂිකර්ම ගොවිපල් අංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය", යන්න ලියා ලියුම් කවරයේ වම්පස උඩ කෙළවරේ "හිඟුරක්ගොඩ හා පොළොන්නරුව ගොවිපලවල ගොයම් කැපීමේ ටෙන්ඩර්" යන්න ලියා එවිය යුතුය. ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය ද එහි සඳහන් කළ යුතුය.

6. 1970.7.24 වැනි දින දවල් 12 තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර දෙනු ලැබේ. ඒ දීම කරනු ලබන්නේ එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 25 ක් බැගින් තැන්පත් කර ලබාගත් මුදල් කුවිතාන්සියක්, අනුරාධපුර ගොවිපල පාලන හා නිෂ්පාදන කාර්යාලයේ, පරිපාලන නිලධාරි තැනට ඉදිරිපත් කළ පසුවය. මෙම මුදල් තැන්පත් කිරීම ඕනෑම කච්චේරියක හෝ පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හෝ කළ හැකිය. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා දින හතක් ඇතුළත දී අවශ්‍ය ඇප තැබීමට හා ගිවිසුම් පත්‍රය අත්සන් කිරීමට නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල් සියල්ලම රාජසන්තක කරනවාත් හැර, ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නම් ලැයිස්තුවට ඇතුලත් කිරීමට ද ඉඩ තිබේ.

7. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. නැතහොත් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනට ඒවා අතින්ම භාරදිය යුතුයි. ලියාපදිංචි කළ තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කළ දිනයේම ටෙන්ඩර් කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගැනීමට නියමිත දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුන හොත් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගෙන් ඒ ගැන කරුණු විමසිය යුතුය.

8. ටෙන්ඩර්කරුට වුවමනා නම් ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී ඉදිරියේ පෙනී සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් භාරගැනීම නැවැත් වීමට නියමිත ඉහත කී දින, එකී වේලාවේදී පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දී ඒවා විවෘත කරනු ලැබේ.

22. සේවයේ යෙදවීම, අහිතකරය යි සළකනු ලබන ඕනෑම කම්කරුවෙකු කොන්ත්‍රාත්කරු විසින් සේවයේ යෙදවීම සම්බන්ධයෙන් විරුද්ධ වීමේ අයිතිය රජය සතු ය.

23. රජයේ වැඩ පැහැර හරින ලද කොන්ත්‍රාත්කරුවන් ගේ නාම ලේඛණයෙහි තනි වශයෙන් හෝ වෙනත් අයෙකු ගේ නම් සමඟ දක්වා ඇති කිසිම පුද්ගලයෙකු සමඟ හෝ තමාට සැහේ ය යි ඒත්තු යන කරුණු උඩ කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා විරුද්ධවන කිසිවකු සමඟ කොන්ත්‍රාත්තුවට බැඳෙනු නො ලැබේ.

24. අවශ්‍ය වූවහොත් කොන්ත්‍රාත්කරුගේ වියදමෙන් බැඳුම්කරයකට අත්සන් තැබීම අවශ්‍ය වන ඇපකරුවන් දෙදෙනෙකු සපයා ගැනීමට තෝරා ගනු ලබන ටෙන්ඩර්කරුට සිදු වේ. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් මෙසේ නම් කරනු ලබන ඇපකරුවන් දෙදෙනා කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා විසින් අනුමත කරන අයවළුන් විය යුතු ය.

25. සපයනු ලබන කෘෂි-රසායනික ද්‍රව්‍ය සම්බන්ධ රාජ්‍ය භාග හා/හෝ පේටන්ට් හිමිකම් වලින් රජය නිදහස් කිරීමට ටෙන්ඩර්කරුවන් බැඳී සිටී.

26. කෘෂි-රසායනික ද්‍රව්‍ය සැපයීම අසතුටුදායක වීම හෝ කොන්ත්‍රාත්තුවේ කොන්දේසි නොපිරිහෙලා ඉටු නො කිරීමේ හේතුවෙන් කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමේ අයිතිය කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා සතු ය.

27. පේරාදෙණියේ පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (ව්‍යාප්ති) වෙත ඉල්ලුම් කිරීමෙන් මේ පිළිබඳ වැඩි විස්තර ලබාගත හැක.

ඊ. අබේරත්න,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (ව්‍යාප්ති).

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.
1970 ජූලි මස 1 වැනිදා.

## උපලේඛනය

### පළිබෝධක

| අංකය | කෘෂි-රසායනික ද්‍රව්‍ය | ප්‍රමාණය | පැකැට්ටුවේ ප්‍රමාණය |
|---|---|---|---|
| අයි/1 ... | සියයට 25 ඉමල්සිපයබල් සාන්ද්‍රයක් වශයෙන් ඩයික්ලෝරෝ ඩිපිනිල් ට්‍රයික්ලෝරෝඊතෙන් (ඩී.ඩී.ටී) සහිත කෘමි නාශකය | 5,000 (ගැ. 500) | ... දියර අවුන්ස 16, ලේබල් සහිත කාන්දුවීම සහ සුළු සොරකම් වලක්වන වැස්ම සහිත බෝතල් |
| අයි/2 ... | 50% ජලයෙහි දිය කළහැකි කුඩු වශයෙන් ඩයික්ලෝරෝ ඩිපිනිල් ට්‍රයික්ලෝරෝඊතෙන් (ඩී.ඩී.ටී) | 1,000 (රා. 5,000) | ... ලේබල් සහිත සීල් තබන ලද රා. 5 පැකට් |
| අයි/3 ... | 50%එස් (අයි සි. (ඊතොක්සිකාබොනිල්) ඊතයිල්) ඩයිමතයිල් පොස්පොරෝතියෝ ලොතියෝනේට් (මැලිනියොන්) සහිත කෘමි නාශකය. ඩීයෝඩරයිස්ට් ඉමල්සිපයබල් සාන්ද්‍රයක් | 5,000 (ගැ. 500) | ... දියර අවුන්ස 16, ලේබල් සහිත කාන්දුවීම සහ සුළු සොරකම් වලක්වන වැසුම් සහිත බෝතල් |
| අයි/4 ... | 5% කුඩ වශයෙන් මැලතියොන් කෘමිනාශක ... | 200 (රා. 200) | ... ලේබල් සහ සීල් සහිත රා. 1 පැකට් |
| අයි/5 ... | 1.3% ගම්මා බෙන්සීන් හෙක්ස්අක්ලෝරයිඩ සහිත කෘමිනාශක කුඩු වලින් | 10,000 (රා. 50,000) | ... ලේබල් සහ සීල් සහිත රා. 5 පැකට් |
| අයි/6 ... | 3%ගම්මා බෙන්යීන් හෙක්ස්සක්ලෝරයිඩ සහිත කෘමිනාශක කුඩු | 500 (රා. 250) | ... ලේබල් සහ සීල් සහිත රා. 5 පැකට් |
| අයි/7 ... | 6%ගම්මා බෙන්යීන් හෙක්ස්සක්ලෝයෙඩ සහිත කෘමිනාශකය<br>කැට සහිත මිශ්‍රණයක් ... ... ... | (1) 6,000<br>(2) 1,000 | ... සීල් ලේබල් සහිත රා. 5 පැකට්<br>... සීල් ලේබල් සහිත රා. 55 පැකට් |
| අයි/8 ... | 26% ගම්මා බෙන්යීන්හෙක්ස්සක්ලෝරයිඩ සහිත කෘමිනාශක, ජලයෙහි විසුරුවාලිය හැකි කුඩු වශයෙන් | 500 (රා. 500) | ... සීල් ලේබල් සහිත රා . 1 පැකට් |
| අයි/9 ... | 20% ගම්මා බෙන්යීන්හෙක්සාක්ලෝරයිඩ සහිත කෘමිනාශක ඉමල්සිපයබල් සාන්ද්‍රයක් | 1,000 (ගැ. 100) | ... දියර අවුන්ස 16 ලේබල් සහිත කාන්දුවීම සහ සුළු සොරකම් වලක්වන වැසුම් සහිත, බෝතල් |
| අයි/10 ... | 80% 1–නැප්තිල් එන් මිතයිල් කාබනේට් (කාබරිල්) කෘමිනාශක දියේ විසිරිය හැකි කුඩක් වශයෙන් | (1) 400 (රා. 100)<br>(2) 200 (රා. 200) | ... (1) ලේබල් සහ සීල් සහිත අවු. 4 පැකට<br>... (2) ලේබල් සහ සීල් සහිත රා. 1 පැකට |
| අයි/11 ... | 80% 0–0 ඩයිමතයිල් 1–1 හයිඩ්‍රොක්සි — 2.2.2. ට්‍රයික්ලෝරෝ ඊතල් පොස්පේට්ට සහිත කෘමිනාශකය, ජලයෙහි ඉසිය හැකි කුඩක් වශයෙන් | 640 (රා. 200) | ... සීල්, ලේබල් සහිත අවු. 5 පැකට් |
| අයි/12 ... | 50% 0–0 ඩයිමිතයිල් 1–1 හයිඩ්‍රොක්සි–2–2 ට්‍රයික්ලෝරෝ ඉතයිල් පොස්පොනේට් සහිත කෘමිනාශක ඉමල්සිපයබල් සාන්ද්‍රයක් වශයෙන් | 200 (ගැ. 20) | ... දියර අවු. 16 ලේබල් සහිත කාන්දුවීම සහ සුළු සොරකම් වලක්වන වැසුම් සහිත බෝතල් |
| අයි/13 ... | 60% 0–0 ඩයිඑතයිල් 0–(2–අයිසෝප්‍රොයිල්–4 මිතයිල්–6–පයරි මිඩිනිස්) පොස්පොරෝ යෝඒට් කෘමිනාශකය, ඉමල්සිපයබල් සාන්ද්‍රයක් වශයෙන් | 500 (ගැ. 500) | ... දියර අවු. 2 ලේබල් සහිත කාන්දුවීම් සහ සුළු සොරකම් වැලැක්වන වැසුම් සහිත බෝතල් |
| අයි/14 ... | 40% 0–0 ඩයිඊතයිල් 0–(2–අයිසෝප්‍රොයිල්–4 මිතයිල්–6–පයිරි මිඩනිල්) පොස්පොරෝතියෝ | 200 (රා. 200) | ... ලේබල් සහ සීල් රා. 1 පැකට් |
| අයි/15 ... | 75% 3–මිතයිල්–4 ඩයිමිතයිල් ඇම්නෝපිනිල්–එන්–මොනොතිල් කාබමේට් සහිත කෘමිනාශකය, ජලයෙහි දියකළ හැකි කුඩක් වශයෙන් | 400 (රා. 200) | ... ලේබල් සහ සීල් සහිත රාත්තල් භාගයේ පැකට් |
| අයි/16 ... | 25% 0.0 ඩයිතිසිල්–ස්–2 (එතිල්සල්පිනිල්) එතිල්තියොන්පොස් පේට් සහිත කෘමිනාශකය | 1,000 ... | ... ලේබල් සහ සීල් සහිත 10සිසි ඇළුමිනියම් භාජන |
| අයි/17 ... | 20% 1, 2, 3, 4, 10, 10–කෙක්සිසාක්ලෝරෝ, 1,4, 4අ, 5, 8, 8අ, හෙක්ස්සා හයිඩ්‍රොඑක්සෝ–1, 4 එන්ඩෝ–5, 8, ඩයිමිතනො නැප්තැලින් (අ ල්ඩරින්) සහිත කෘමිනාශක ඉමල්සියපබල් සාන්ද්‍රයක් වශයෙන් | 3,000 (ගැ. 300) | ... දියර අවු. 16, ලේබල් සහිත කාන්දුවීම සහ සුළු සොරකම් වලක්වන වැසුම් සහිත බෝතල් |
| අයි/18 ... | 1, 2, 3, 4, 10,10–හෙක්ස්ක්ලෝරෝ 1, 4, 4ඒ, 5,8, 8ඒ, 2 හේසහයි ඩ්‍රෝ එක්සෝ–1, 4–එන්ඩෝ–5, 8– ඩයිමිතානෝ නැප්තැලින් (ඇල්ඩරින්) 2.5— සහිත කෘමිනාශක කුඩක් වශයෙන් | (1) 1,000 (රා. 1,000)<br>(2) 1,000 (රා. 5,000) | ... ලේබල් සහ සීල් සහිත රා. 1 පැකට්<br>... ලේබල් සහ සීල් සහිත රා. 5 පැකට් |
| අයි/19 ... | 20% 1, 2, 3, 4, 10, 10–හෙක්ස්ක් ලෝරෝ 6–7 ඊපොක්සි 1, 4, 4අ, 5, 6, 7, 8, 8අ, ඔක්ටසයිඩෝ-ක්සෝ 14 එන්ඩෝ 5, 8, ඉයිමිතනො නැප්තලීන් සහිත කෘමිනාශකය. ඉමල්සන් සාන්ද්‍රයක් වශයෙන් | 500 (ගැ. 50) | ... දියර අවුන්ස 16 ලේබල් සහිත කාන්දුවීම සහ සුළු සොරකම් වලක්වන වැසුම් සහිත බෝතල් |
| අයි/20 ... | 2% 1, 2, 3, 4, 10, 10–හෙක්සාන්ලෝරෝ 6–7 ඊපොක්සි–1, 4, 4අ, 5, 6, 7, 8, 8අ, එක්ටහයිඩ්‍රෝ-ක්ස්ය–1, 4, එන්ඩො 5, 8, ඩයිමි තනෝ, නැප්තලීන් සහිත කෘමිනාශකය, කුඩක් වශයෙන් | 200(රා. 200) | ... ලේබල් සහ සීල් සහිත රා. 1 පැකට් |
| අයි/21 ... | 80%නො අඩු, සල්පර් ජලයෙහි දියකළ හැකි කුඩු සහිත කෘමි නාශකය | 5,000 (රා. 5000) | ... ලේබල් සීල් සහිත රා. 1 පැකට් |

| අංකය | කෘෂි-රසායනික ද්‍රව්‍ය | ප්‍රමාණය | පැකැට්වුවේ ප්‍රමාණය |
|---|---|---|---|
| අයි/22 ... | 50% ක හෝ අධික සාන්ද්‍රණයක 0.0–ඩයිමිතයිල් 1–0 (3 මිතයිල්–4 හයිට්‍රොපිනිල්) කියොනොපොස්පේට් සහිත කෘමිනාශකය. ඉමල්සිපයබල් සාන්ද්‍ර වශයෙන් | 10,000 (ගැ. 1,000) | ... දියර අවු. 16 ලේබල් සහිත කාන්දුවීම සහ සුළු සොරකම් වලක්වන වැසුම් සහිත බෝතල් |
| අයි/23 ... | 6.5/89.0 අන්පාතයෙන් අල්පා සහ බීමා අයිසෙමරස් සහිත 25% 2–ක්ලෝරෝ 1–(24–ඩයික්ලෝරෝපිනිල්) විනිල්ඩයිතිල් ෆොස් පේඩ් සහිත කෘමිනාශකය. ජලයෙහි දියකළ හැකි කුඩක් වශයෙන් | 2,000 (රු. 100) | ... ලේබල් සහ සීල් සහිත රු. ½ පැකට් |
| අයි/24 ... | 20%එස්–(එන්-පොමිල්-න් මිතයිල් කාබමොයිල්-මිතයිල්) ඩයිමි තයින් පොස්පොරො තියොලොතියොන්ට් සහිත කෘමිනාශක ඉමල්ෂන් සාන්ද්‍රයක් වශයෙන් (පොමොතියොන් උදා :— අන්තියෝ) | (1) 1,600 (ගැ. 20)<br>(2) 1,000 (ගැ. 100) | ... (1) දියර අවුන්ස 2 ලේබල් සහිත කාන්දු වීම සහ සුළු සොරකම් වලක්වන වැසුම් සහිත බෝතල්<br>... (2) දියර අවුන්ස 16 ලේබල් සහිත කාන්දු වීම සහ සුළු සොරකම් වලක්වන වැසුම් සහිත බෝතල් |
| අයි/25 ... | 10% 0.0–ඩයතයිල් 0 (2-අයිසොප්‍රොපිල්-4 මිතයිල් 6 පයිරිමිඩි නයිල්) පොස්පොරොතියෝ ඒට් සහිත කෘමි නාශක කැට මිශ්‍රණයක් වශයෙන් | (1) 5,000 (රු. 5,000)<br>(2) 500 (රු. 10,000) | ... ලේබල් සහ සීල් සහිත රු. 1 පැකට්<br>... ලේබල් සහ සීල් සහිත රු. 20 පැකට් |
| අයි/26 ... | 60% 3 හයිඩ්‍රොක්සිල්-එන්-මිනයිල්සිස්-ක්‍රොටොනොමයිඩ් සිමි නයිල් පොස්පේට් (මොනෝක්‍රොටෙපොස්) සහිත කෘමි නාශක දියනාති සාන්ද්‍රයක් වශයෙන් | (1) 800 (ගැ. 20)<br>(2) 3,000 (ගැ. 300) | ... දියර අවුන්ස 4 ලේබල් සහිත කාන්දුවීම සහ සුළු සොරකම් වලක්වන වැසුම් සහිත බෝතල්<br>... දියර අවුන්ස 16 ලේබල් සහිත කාන්දුවීම සහ සුළු සොරකම් වලක්වන වැසුම් සහිත බෝතල් |
| අයි/27 ... | 20% 1, 2, 4, 5, 6, 7, 10, ඔක්ටාක්‍රොලොරො–4, 7, 8, 9, ටෙට්‍රා හයිඩ්‍රො–4, 7, මිතයිල් එනින්ඩෙන්, (ක්ලෝඩෙන්) සහිත කෘමි නාශක ඉමල්සිපයබල් සාන්ද්‍රයක් වශයෙන් | 1,000 (ගැ. 100) | ... දියර අවුන්ස 16 ලේබල් සහිත කාන්දුවීම සහ සුළු සොරකම් වලක්වන වැසුම් සහිත බෝතල් |
| අයි/28 ... | 50% 0, 0 ඩිමිනයිල් එහොක්සි කාබනිල්බෙන්සිල් පොස්පොරොඩි ඒට් (පෙන්තොඒට්) හෝ සමාන කෘමිනාශක ඉමල්සිපයබල් සාන්ද්‍රයක් වශයෙන් | (1) 1,000 (ගැ. 25)<br>(2) 2,000 (ගැ. 200) | ... දියර අවුන්ස 4 ලේබල් සහිත කාන්දුවීම සහ සුළු සොරකම් වලක්වන වැසුම් සහිත බෝතල්<br>... දියර අවුන්ස 16 ලේබල් සහිත කාන්දුවීම සහ සුළු සොරකම් වලක්වන වැසුම් සහිත බෝතල් |

දිලීර නාශක

| අංකය | කෘෂි-රසායනික ද්‍රව්‍ය | ප්‍රමාණය | පැකැට්වුවේ ප්‍රමාණය |
|---|---|---|---|
| එප්/1 ... | 3.5% මිතොපිර්තයිල්මර්කරි ක්ලෝරයිඩ් සහිත දිලීර නාශක ජල යෙහි දිය කළහැකි කුඩු වශයෙන් | 16,000 (රු. 1,000) | ... සීල් සහ ලේබල් සහිත අවුන්ස 1 පැකට් |
| එප්/2 ... | 1.5%මර්කරි, පෙනිල් ඊතයිල් මර්කරි ක්ලෝරෝයිඩ් වශයෙන් අඩංගු දිලීර නාශකයක් වියලි බීජ ආලේපනයක් වශයෙන් ප්‍රයෝජනයට ගැනීමට | 1,600 (රු. 100) | ... ලේබල් සහ සීල් සහිත රු. 1 පැකට් |
| එප්/3 ... | 50%මෙටැල්ලික්කොපර්, කොපර් ඔක්සික්ලෝරයිඩ් සහිත දිලීර නාශකයක් ජලයෙහි දියකළ කුඩක් වශයෙන් | 1,500 (රු. 100) | ... ලේබල් සහ සීල් සහිත රු. 1 පැකට් |
| එප්/4 ... | 76%පෙරික්ඩයිමිතයිල්ඩිතියෝ කාබමේට් සහිත දිලීර නාශකය ජලයෙහි දියකළ හැකි කුඩු වශයෙන් | 11,000 (රු. 500) | ... ලේබල් සහ සීල් සහිත රු. ½ පැකට් |
| එප්/5 ... | 70%සින්ක්පොපිලින්–බිස්ඩිතියෝ කාබමේට් සහිත දිලීර නාශකය ජලයෙහි දියකළ හැකි කුඩු වශයෙන් | 11,200 (ටොන් 5) | ... ලේබල් සහ සීල් සහිත රු. 1 පැකට් |
| එප්/6 ... | 50%එන් (ට්‍රයික්ලෝරෝමෙතිල්තියෝ) සයික්ලොහෙක්ස්-4-ඊන්-1,2–ඩයිකාබොක්සිමයිඩ් සහිත දිලීර නාශකය ජලයෙහි දියකළ හැකි කුඩු වශයෙන් | 200 (රු. 200) | ... සීල් සහ ලේබල් සහිත රු. 1 පැකට් |
| එප්/7 ... | සහත සඳහන් සක්‍රිය මිශ්‍රණ ද්‍රව්‍ය 80% ක් අඩංගු දිලීර නාශක මෙතිල් ආසනො-එස්–(ඩයිමෙතිල්ඩයිතියෝ කාබමේට්) සින්ක්-ඩයිමෙතිල් ඩයිතියෝ කාබමේට්, ටෙට්‍රාමෙතිල්–තියුරම් ඩයි සල්පයිට් | 5,000 (රු. 2,500) | ... ලේබල් සහ සීල් සහිත රු. ½ පැකට් |
| එප්/8 ... | 2% කසුගමයින් සහිත දිලීර නාශකය, දියරයක් වශයෙන් ... | 2,000 ... | ... දියර අවුන්ස 10 ලේබල් සහිත කාන්දුවීම සහ සුළු සොරකම් වලක්වන වැසුම් සහිත බෝතල් |
| එප්/9 ... | 80% මන්ගනීස් එතිලීන්බිස් ඩිතියෝ කාබමේට් (මනෙබ්) සහිත පැලෑටි නාශක දියකළ හැකි කුඩක් වශයෙන් | 1,000 (රු. 500) | ... ලේබල් සහ සීල් සහිත රු. ½ පැකට් |
| එප්/10 ... | 60% සිංඑතිලීන්බිස්ඩිතියෝ කාබමේට් (සිනෙබ්) හෝ වැඩි සහිත පැලෑටි නාශක දියකළ කුඩක් වශයෙන් | 1,000 (රු. 500) | ... ලේබල් සහ සීල් සහිත රු. ½ පැකට් |

පැලෑටි නාශක

| අංකය | කෘෂි-රසායනික ද්‍රව්‍ය | ප්‍රමාණය | පැකැට්වුවේ ප්‍රමාණය |
|---|---|---|---|
| එච්/1 ... | 40% හෝ ඊට වැඩි සාන්ද්‍රත්වයකින් යුත් 4-ක්ලෝරෝ-2 මෙතිල්පි ෆිනොක්සි ඇසිටික් අම්ලය සහිත පැලෑටි නාශකය (එම්සීපීඒ) | 40,000 (ගැ. 4,000) | ... දියර අවු. 16 ලේබල් සහිත කාන්දුවීම සහ සුළු සොරකම් වලක්වන වැසුම් සහිත බෝතල් |
| එච්/2 ... | 35% හෝ ඊට වැඩි සාන්ද්‍රත්වයකින් යුත් එන්-3 (4-ඩයික්ලෝරෝ පිනිල්) ප්‍රොපියොනමයිඩ් සහිත පැලෑටි නාශකය (3, 4 ඩී. පී. ඒ) | 15,000 (ගැ. 1,500) | ... දියර අවු. 16 ලේබල් සහිත කාන්දුවීම සහ සුළු සොරකම් වලක්වන වැසුම් සහිත බෝතල් |
| එච්/3 ... | 20% 1, 1-ඩයිමිතයිල් 4-4 බයිපිරිඩලියම් ඔක්සික්ලෝයිඩ් සහිත පැලෑටි නාශකය | 1,000 (ගැ. 100) | ... දියර අවු. 16, ලේබල් සහිත කාන්දුවීම සහ සුළු සොරකම් වලක්වන වැසුම් සහිත බෝතල් |
| එච්/4 ... | 75% ඩයිමිතයිල්එස්ටර් ටෙට්‍රක්ලෝරෝ තෙරිප් වලින් ආම්ලය සහිත පැලෑටි නාශකය, ජලයෙහි දියකළ හැකි කුඩු වශයෙන් | 500 (රු. 500) | ... ලේබල් සහ සීල් සහිත රු. 1 පැකට් වලින් |
| එච්/5 ... | 65% ක්ලෝරෝ එන්–අයිසොප්‍රොපිල් ඇසිටිලිනයිඩ් සහිත පැලෑටි නාශකය, ජලයෙහි දියකළ හැකි කුඩු වශයෙන් | (1) 500 (රු. 5,000)<br>(2) 2,000 (රු. 2,000) | ... (1) ලේබල් සහ සීල් සහිත රු. 10 පැකට් වලින්<br>... (2) සීල් සහ ලේබල් සහිත රු. 1 පැකට් වලින් |
| එච්/6 ... | 80% 2 ක්ලෝරෝ 4-6 බිසිස්ප්‍රොපොලමිනෝ 1, 3, 5 ට්‍රයසින් පැලෑටි නාශකය, ජලයෙහි දියකළ හැකි කුඩු වශයෙන් | 100 (රු. 100) | ... සීල් සහ ලේබල් සහිත රු. 1 පැකට් වලින් |
| එච්/7 ... | 50%3 (3–4 ඩයික්ලෝපිනිල්)–1 මිතොක්සි-1 මෙතිල් යූරියා සහිත පැලෑටි නාශකය, ජලයෙහි දියකළ හැකි කුඩු වශයෙන් | 100 (රු. 100) | ... ලේබල් සහ සීල් සහිත රු. 1 පැකට් |

| අංකය | කෘෂි-රසායනික ද්‍රව්‍ය | ප්‍රමාණය | පැකැට්වුවේ ප්‍රමාණය |
|---|---|---|---|
| එච්/8 ... | සෝඩියම් ලවන කැට මිශ්‍රණයක් වශයෙන් පෙන්ටක්ලෝරෝපිනොල් 25% අඩංගු පැලෑටි නාශකය | 1,000 (රා. 16,000) | ... ලේබල් සහ සීල් සහිත රා. 16 පැකට් |
| එච්/9 ... | තෙමිය හැකි කුඩක් වශයෙන් සකස් කරන ලද 2,4–ඩිසියොප්‍රොපිලමිනො 6–මෙතිල්තියෝ 1,3, 5–ට්‍රයිසින් (පොම්ට්‍රයින්) අඩංගු පැලෑටි නාශක (උදා. ගෙසාගාඩ්) ටෙන්ඩර්කරු විසින් ඉදිරිපත් කරනු ලබන මිශ්‍රණයේ සාන්ද්‍රනය දැක්විය යුතු අතර, ඉදිරිපත් කරනු ලබන නිෂ්පාදනයේ සාන්ද්‍රනය පෙන්නුම් කරන, නිෂ්පාදකයින්ගේ මුද්‍රිත මුල් පත්‍රිකා ද ඉදිරිපත් කළයුතු වේ. | 56 (රා. 56) | ... නිෂ්පාදකයින්ගේ සීල් තබන ලද මුල් රා. 1 පැකට් |
| එච්/10 ... | 2–ක්ලෝරෝ–2, 6–ඩයතයිල්–එන් (මෙතොක්සිමෙතිල්) අසටනිලයිඩ් 40% වඩා අඩංගු පැලෑටි නාශක සාන්ද්‍ර තෛලෝදයක් වශයෙන් | 500 (ගැ. 50) | ... දියර අවු. 16 ලේබල් සහිත කාන්දුවීම සහ සුළු සොරකම් වලක්වන වැසුම් සහිත බෝතල් |
| එච්/11 ... | 50% 2–ප්ලොරෝ–4, 6–බිස් (එතිලමිනො)–එස්–ට්‍රයසීන් සහිත පැලෑටි නාශක දියකළ හැකි කුඩක් වශයෙන් ... | (1) 500 (රා. 500)<br>(2) 200 (රා. 1,000) | ... ලේබල් සහ සීල් සහිත රා. 1 පැකට්<br>... ලේබල් සහ සීල් සහිත රා. 5 පැකට් |
| එච්/12 ... | 80% 3– (3, 4, ඩයික්ලොරොපෙනිල්) 1, 1–ඩිමිතයිල් සූරියා (ඩියුරොන්) සහිත පැලෑටි නාශක දියකළ කුඩක් වශයෙන් | 1,000 (රා. 1,000) | ... ලේබල් සහ සීල් සහිත රා. 1 පැකට් |
| එච්/13 ... | 85% අති සෝඩියම් සෝල්ට් 2, 2 ඩයික්ලොරොප්‍රොෂමනික් අසිඩ් (ඩලපොන්) සහිත පැලෑටි නාශක ජලයෙහි දියකළ හැකි කුඩක් වශයෙන් | 1,000 (රා. 1,000) | ලේබල් සහ සීල් සහිත |
| එච්/14 ... | 45% ට වැඩි 2, 4–ඩයික්ලොරො පොනොක්සි, ආසෙටික් අසිඩ් (2, 4ඩී) අමයින් ලෝල්ට සහිත පැලෑටි නාශක ඉමල්සිපයබල් සාන්ද්‍රයක් වශයෙන් | 1,000 (ගැ. 100) | ... දියර අවු. 16 ලේබල් සහිත කාන්දුවීම සහ සුළු සොරකම් වලක්වන වැසුම් සහිත බෝතල් |

**වෙනත් දේ.**

| අංකය | කෘෂි-රසායනික ද්‍රව්‍ය | ප්‍රමාණය | පැකැට්වුවේ ප්‍රමාණය |
|---|---|---|---|
| එම්/1 ... | බොත්සලිඩොනියමිනෝ–4–පොනිල්තියාසොලිනෝ 2–තියොන් (පෙන්ටියාසොන්) 50% 3 අඩංගු ශාකානු නාශක තෙමිය හැකි කුඩක් වශයෙන් | 1,000 (පැකට්) | ... නිෂ්පාදකයින්ගේ සීල් තබන ලද මුල් අවු. 4 පැකට් |
| එම්/2 ... | 90%සෝඩියම් පුලුබරො අසිටේට් සහිත වී නාශක කුඩක් වශයෙන් සීල් තබන ලද නිෂ්පාදකයන්ගේ මුල් පැකට් | 200 (රා. 200) | ... ලේබල් සහ සීල් සහිත රා. 1 පැකට් |
| එම්/3 ... | 5% හෝ ඊට වැඩි සිංක්පාස්පයිඩ් අඩංගු ආලේපයක් වශයෙන් සීල් තබන නිෂ්පාදකයන්ගේ මුල් පැකට්. ආලේපයේ අඩංගු සිංක් පොස්පයිඩ් ප්‍රමාණය හා පැකට්වුවේ අඩංගු ප්‍රමාණය ටෙන්ඩර් කරු විසින් සඳහන් කළ යුතුය | 200 (රා. 200) | ... ලේබල් සහ සීල් සහිත රා. 1 පමණ පැකට් |
| එම්/4 ... | 0.6% ට වැඩි කුමරින් අඩංගු වී නාශක කුඩ. තමන් විසින් ටෙන්ඩර් කරන ද්‍රව්‍යයේ අඩංගු කුමරින් ප්‍රමාණය ටෙන්ඩර්කරු සඳහන් කළ යුතුය | 800 (රා. 200) | ... ලේබල් සහ සීල් සහිත අවුන්ස 4 පැකට් |
| එම්/5 ... | 1.5% ට වැඩි මෙටසිටල්ඩිහයිඩ් (මෙටල්සිහයිඩ්) අඩංගු ගොළු බෙලි නාශක' බෙහෙත් කැට. මෙටල්ඩිහයිඩ් ප්‍රමාණය සඳහන් කළ යුතුය | 1,000 (රා. 250) | ... ලේබල් සහ සීල් සහිත අවුන්ස 4 පැකට් |

7–342—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

---

## රාජකීය ලංකා නාවික හමුදාව

### රෙදි ඇපිල්ලීම—1970–71

1970 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1971 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා රාජකීය ලංකා නාවික හමුදාවේ නිළ ඇඳුම්, බැරැක්ක සහ රෝහල් රෙදි පිළි ඇපිල්ලීම සඳහා පහත සඳහන් එක් එක් සේවාව ඉදිරියෙන් දක්වා ඇති දිනයන්හි පෙරවරු 10 දක්වා කොළඹ, කොඩිගහ වීදියේ රාජකීය ලංකා නාවික හමුදා මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

| I<br>සේවය | II<br>ටෙන්ඩර්පත් නිකුත් කෙරෙන අවසාන දිනය | III<br>ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය | IV<br>ටෙන්ඩර් පත් විවෘත කරන දිනය |
|---|---|---|---|
| (අ) කොළඹ රෙදි පිළි ඇපිල්ලීම ... | 70.7.26 දින දවල් 12 දක්වා ... | 70.7.27 දින පෙ.ව. 10 දක්වා ... | 70.7.27 දින පෙ.ව. 10.30 දක්වා |
| (ආ) ත්‍රිකුණාමළයේ රෙදිපිළි ඇපිල්ලීම ... | 70.7.26 දින දවල් 12 දක්වා ... | 70.7.27 දින පෙ.ව. 10 දක්වා ... | 70.7.27 දින පෙ.ව. 10.30 දක්වා |
| (ඇ) වැලිසර රෙදිපිළි ඇපිල්ලීම ... | 70.7.26 දින දවල් 12 දක්වා ... | 70.7.27 දින පෙ.ව. 10 දක්වා ... | 70.7.27 දින පෙ.ව. 10.30 දක්වා |
| (ඈ) කාරෙයිනගාර් රෙදිපිළි ඇපිල්ලීම ... | 70.7.26 දින දවල් 12 දක්වා ... | 70.7.27 දින පෙ.ව. 10 දක්වා ... | 70.7.27 දින පෙ.ව. 10.30 දක්වා |

2. අයදුම්කරුගේ මුදල් තත්වය සහ මෙම සේවා කරගෙන යාමේ හැකියාව පිළිබඳව සම්පූර්ණ විස්තරයක් සහිතව ඉදිරිපත් කරන ලිඛිත අයදුමක්මත ඉහත සඳහන් සේවා සඳහා ටෙන්ඩර් ආකෘතිපත් ඒ ඒ සැපයීම ඉදිරියෙහි II වෙනි තීරයේ දක්වා ඇති දිනයන්හි මධ්‍යාහ්නයේ 12 දක්වා කොළඹ, කොඩිගහ වීදියේ රාජකීය ලංකා නාවික හමුදා මූලස්ථානයේ නාවික හමුදාධිපති විසින් නිකුත් කරනු ලැබේ.

3. ඉහත සඳහන් එක් එක් සැපයීම් සේවා සඳහා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට මත්තෙන් රු. 75 බැගින්, නැවත ලබා ගත හැකි ටෙන්ඩර තැන්පත් මුදලක් නාවික හමුදා මූලස්ථානයේ දී ගෙවිය යුතුයි. චෙක්පත් භාරගනු නොලැබේ. මුදල් ඇණවුම් නාවික හමුදාධිපති නමින් වියයුතුයි.

4. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම්කරුවන් තම තමන්ගේ සම්පූර්ණ නම් සහ ලිපින ඉදිරිපත් කළයුතුයි.

5. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම්කරුවන් තමන් ටෙන්ඩර්කිරීමට කැමති සේවය සහ ස්ථාන සඳහන් කිරීම අවශ්‍යය.

ඩී. වී. හන්ටර්,
කොමඩෝරු,
නාවික හමුදාධිපති.

නාවික ආහාර හා නිළ ඇඳුම් අංශය,
රාජකීය ලංකා නාවික හමුදා මූලස්ථානය,
තැ. පෙ. 593, කොළඹ 1,
1970 ජූලි මස 1 දින.

7–402—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1970 ජූලි මස 27 වන දින පෙ.ව. 10.30 වනතෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර මාතර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ.

| පාසලේ නම | | කළයුතු වැඩය | අවශ්‍ය ලියාපදිංචිය රුපියල් |
|---|---|---|---|
| (1) හ/තංගල්ල මහ විද්‍යාලය | ... | 80′ × 20′ ගොඩනැගිල්ල | 22,500 |
| (2) හ/අම්බලම මහ විද්‍යාලය | ... | එම ... | 22,500 |
| (3) හ/පලපොත කණිෂ්ඨ විද්‍යාලය | ... | 80′ × 30′ ගොඩනැගිල්ල සහ ජලමුද්‍රා වැසිකිළිය | 22,500 |
| (4) හ/දෙබොක්කාව විද්‍යාලය | ... | එම ... | 22,500 |
| (5) හ/බැමිණියන්විල කණිෂ්ඨ විද්‍යාලය | | 60′ × 20′ ගොඩනැගිල්ල සහ ජලමුද්‍රා වැසිකිළිය | 20,000 |

සංලක්ෂය : හ = හම්බන්තොට දිස්ත්‍රික්කය

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ කාර්යාලයේ රු. 100 (සියය) ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය තංගල්ලේ, ප්‍රධාන අධ්‍යාපන නිලධාරි වෙත ඉදිරිපත් කිරීමෙන් ඉහත සඳහන් හා ඊට වැඩි ගණනකට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1970 ජූලි මස 24 වන දින දවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 කට අඩු වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙත්). චෙක්පත, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නො ලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සිය කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ තංගල්ලේ, ප්‍රධාන අධ්‍යාපන නිලධාරිගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක්ය.

3. දෙවැනි ඡේදයේ සඳහන්කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලට ද ටෙන්ඩර්පත්‍ර මේ වැඩ සඳහා එවිය හැකිය. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර්පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි තංගල්ල ප්‍රධාන අධ්‍යාපන නිලධාරිගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියලු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදිය බලාගත හැක. තැපැලෙන් එවන ටෙන්ඩර්පත් ලියා පදිංචි තැපැලෙන් මාතර අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතු ය. තැපැලෙන් නො එවන ටෙන්ඩර්පත් කවරයක් බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර් කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයකු විසින් පෞද්ගලිකව මාතර අධ්‍යාපන කාර්යාලයේ, කාර්යාල සහකාර/ප්‍රධාන ලිපිකරු වෙත භාරදිය යුතු ය. එසේ භාරදුන් විගස ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුය.

5. 1970 ජූලි මස 27 වන දින ප.ව. 3 ට මාතර අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර්පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර්පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම හා මිළ ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් කළ දින සිට සති හයක් ගතවනතුරු තමන් සඳහන් කරන ලද මිළ ගණන් වලට එම වැඩය කිරීමට ටෙන්ඩර් කරුවන් කැමැතිවිය යුතු ය.

7. තවත් අවශ්‍ය විස්තරයක් වේතොත් තංගල්ලේ ප්‍රධාන අධ්‍යාපන නිලධාරී ගේ කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂාකර බැලීම සඳහා මෙම කාර්යාලයයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 66.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් කරන ලද පාසල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව කොන්ත්‍රාත් කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මඟින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සළකනු ලැබේ.

වලිමුනි විදුධර් ජස්ටින් මෙන්ඩිස්,
හම්බන්තොට ප්‍රදේශයේ ප්‍රධාන අධ්‍යාපන නිලධාරී.

1970 ජූලි මස 1 දින,
තංගල්ලේ අධ්‍යාපන කාර්යාලයයේදීය.

7-408—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

---

## රාජ්‍ය දැව සංස්ථාව

### යන්ත්‍රානුසාරයෙන් දැව හෙලා සැපයීම සඳහා ටෙන්ඩර් දැන්වීම

පහත දැක්වෙන ප්‍රදේශයන්ගෙන් යන්ත්‍රානුසාරයෙන් දැව හෙලා සැපයීම සඳහා කොළඹ 5, තිඹිරිගස්යාය පාරේ අංක. 265 දරණ ස්ථානයේ රාජ්‍ය දැව සංස්ථාවේ ක්‍රියාකාරී අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. රාජ්‍ය දැව සංස්ථාවේ පළමුවැනි ශ්‍රේණියේ කොන්ත්‍රාත් කරුවන් කෙන් හා යන්ත්‍රානුසාරයෙන් දැව හෙලා සැපයීමට හැකියාවක් ඇති, රු. 1,00,000 හෝ ඊට වැඩි වටිනාකමකට රජයේ කොන්ත්‍රාත්තු කිරීමට ලියා පදිංචි වූ ප්‍රසිද්ධ වෙළඳ සමාගම්වලින් සහ කොන්ත්‍රාත් කරුවන් ගෙන් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

3. අනුරාධපුර ප්‍රදේශය

(1) පිඹුරත්තැව ජලාශ යෝජනා ක්‍රමය :
කඳන්, සිල්පර හා ඉරූ ලී හෙලා සැපයීම—රු. 1,000,000 වටිනාකම.

(2) අඹන්ගඟ :
කඳන්, සිල්පර හා ඉරූ ලී හෙලා සැපයීම—රු. 1,000,000 වටිනාකමට.

4. 1970 ජූලි මස 26 වැනි දින අ. භා. 2 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරණු ලැබේ.

5. 1970 ජූලි මස 27 වැනි දින පූ. භා. 11ට ටෙන්ඩර් ආකෘති පත්‍ර භාරගැනීම අවසන් කරනු ඇත.

6. වැඩි විස්තර රාජ්‍ය දැව සංස්ථාවේ ප්‍රාදේශීය කළමනාකරුගෙන් හෝ කොළඹ 5, තිඹිරිගස්යාය පාරේ 265 දරණ ස්ථානයේ ක්‍රියාකාරී කළමනාකරුගෙන් හෝ ලබාගත හැකිය.

ඒ. ඩී. ආර්. රත්නරාජා,
ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙනුවට.

70.7.10,
ක්‍රියාකාරී අංශය,
රාජ්‍ය දැව සංස්ථාව,
265, තිඹිරිගස්යාය පාර, කොළඹ 5.

7-381—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

---

## ඊයම් මුද්‍රා සැපයීම

### තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

ඊයම් මුද්‍රා සැපයීම සඳහා කොළඹ තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ මූලස්ථාන ගොඩනැගිල්ලේ, දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා 1970 ජූලි මස 27 වැනි දින පෙ. ව. 10 වනතෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

(2) 1970 ජූලි මස 27 වැනි දින පෙරවරු 10.05ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ඇත. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී ටෙන්ඩර් කරුවන්ට එහි පැමිණ සිටිය හැක.

(3) කොළඹ 5, තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ සහකාර අධිකාරී (උපකරණ, ගොඩනැගිලි, සහසාධක හා ගබඩා) කාර්යාලයෙන් නිකුත් කරනු ලබන ආකෘති පත්‍රවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

(4) ප්‍රධාන තැපැල් කාර්යාලයේ, අංක 4 දරන විමසීම් කවුළුවේ රු. 50ක මුදලක් තැන්පත් කර කුවිතාන්සියක් ලබාගෙන, එම කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, ටෙන්ඩර් ඉදිරිපත් කරලීම සඳහා අවශ්‍ය ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලබන්නේ 1970 ජූලි මස 10 වැනි දින සිට 1970 ජූලි මස 23 වැනි දින දක්වා පමණකි.

(5) වැඩි විස්තර, කොළඹ 5, තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ සහකාර අධිකාරී (උපකරණ, ගොඩනැගිලි, සුභසාධක හා ගබඩා) කාර්යාලයෙන් ලබාගත හැක.

වර්නන් ඈම්. අබේසේකර,
පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සංදේශ අධ්‍යක්ෂ.

තැපැල් හා විදුලි සංදේශ මූලස්ථානය,
කොළඹ 1.

7-314—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

## සුරාබදු දෙපාර්තමේන්තුව

1. ලී වැඩ යන්ත්‍රයක් සැපයීම සඳහා ටෙන්ඩර්.
2. ඉන්දියානු ආධාර යටතේ ආනයනය කළයුතු ගේජ් 10 මල නොබැඳෙන වානේ වලින් ගැලුම් 4,000 ගේ ටැන්කි 10ක් තනා භාරදීම සඳහා ටෙන්ඩර්
3. අඟල් 190 රෝද පරතරය ඇති ඩීසල් ලොරි 3ක් ඉන්දියානු ආධාර යටතේ සිදුවේ රජයේ ස්කාගාරයට සැපයීම සඳහා ටෙන්ඩර්.

70.4.30 දින අංක 14,904 සහ 70.5.22 දින අංක 14,907 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රවල පළවී ඇති නිවේදනවලට අමතර වශයෙනි. ඉහත සඳහන් ටෙන්ඩර් තුන භාරගන්නා අවසාන දිනය 1970 ජූලි මස 19 වැනි දින පෙ. ව. 10 දක්වා දීර්ඝ කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1970 ජූලි මස 17 වැනි දින පෙ. ව. 11 දක්වා සුරාබදු කොමසාරිස්ගෙන් ඉල්ලුම්කර ලබා ගත හැකිය.

ඩබ්ලිව්. බී. දිසානායක,
සුරාබදු කොමසාරිස්.

සුරාබදු කොමසාරිස් කාර්යාලය,
කොළඹ 1,
1970.6.28.

7-313—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අංක කොළඹ 8, වැගසින් පාරේ පිහිටි ලිපි ද්‍රව්‍ය ගබඩාවට පරණ උත්තර කෝෂ 10ක් සැපයීම හා ගෙනැවිත් භාරදීම සඳහා ටෙන්ඩර් පත්, කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ, බී.එස්.එස්.අයි. ගොඩනැගිල්ලේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970.7.26 දින අ. භා. 2.30 දක්වා බාරගනු ලැබේ.

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 50 ක මුදලක් තැන්පත් කොට ලබාගන්නා කුවිතාන්සිය, කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ බී. එස්. එස්. අයි. ගොඩනැගිල්ලේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. මිල ගණන් ලියා අනුපිටපතක් ද, සහිතව ටෙන්ඩර් පත් ඉදිරිපත් කළයුතුය.

වැඩි විස්තර අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

එන්. වාමදේව,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1970. 6. 30 දින,
කොළඹ 1,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව.

7-291—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1970 ජූනි 18 දින අංක 14,911 දරණ රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද ටෙන්ඩර් දැන්වීමේ ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය 1970 ජූලි 10 දින වෙනුවට 1970 ජූලි මස 9 දින යනුවෙන් සංශෝධනය විය යුතුය.

එම ගැසට් නිවේදනයේ 5 වැනි ඡේදයේ සඳහන් පරිදි ටෙන්ඩර් පත්‍ර විවෘත කරන දිනයද 1970 ජූලි 9 දිනය යනුවෙන් සංශෝධනය විය යුතුය.

1970. 6. 30 දින,
අධ්‍යාපන කාර්යාලය,
අනුරාධපුරය.

ඩබ්ලිව්. බී. ප්‍රනාන්දු,
ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්‍ෂ,
අනුරාධපුරය.

7-239—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1970 ජූලි මස 31 වැනි සිකුරාදා පෙ. ව. 10.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර්පත්‍ර ග්‍රීන්පාත්, කොළඹ 7, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාර ගනු ලැබේ :—

| පාඨශාලාවේ නම | වැඩයේ ස්වභාවය |
|---|---|
| 1. කො/රත්මලාන කණිෂ්ඨ කාර්මික ආයතනය ... | වට තාප්පය |
| 2. කො/අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ග්‍රීන්පාත් කොළඹ 7 ... | අළුත් වැඩියාව |

සංක්‍ෂෙපය : කො=කොළඹ දිස්ත්‍රික්කය.

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ හෝ කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගේ කාර්යාලයේ හෝ රු. 100 ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් අංක : 1, රු. 16,000 ; අංක : 2, රු. 5,000 හා ඊට වැඩි ගණනකට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1970 ජූලි මස 30 වැනි බ්‍රහස්පතින්දා පෙ. ව. 10.30 දක්වා ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ. (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 කට අඩු වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙත්) චෙක්පත්, මුදල් ඇනවුම්, තැපැල් ඇනවුම් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක්ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලට ද ටෙන්ඩර්පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර්පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත් ටෙන්ඩර්පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියළු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදිය ද බලාගත හැක. තැපැලෙන් එවන ටෙන්ඩර්පත් ලියාපදිංචි තැපැලෙන් ග්‍රීන්පාත් කොළඹ 7, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපැලෙන් නොඑවන පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පුද්ගලිකව ග්‍රීන්පාත්, කොළඹ 7, අධ්‍යාපන කායසිලයේ කායසිල සහකාර/ප්‍රධාන ලිපිකාර වෙත භාර දිය යුතුයි. එසේ භාරදුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබා ගත යුතුයි.

5. 1970 ජූලි මස 31 වැනි සිකුරාදා පෙ. ව. 10.30 ට ග්‍රීන්පාත්, කොළඹ 7, අධ්‍යාපන කාර්යාලයේ දී ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර්පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා මිළ ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර්පත් භාර ගැනීම අවසන් කළ දින සිට සති 6 ක් ගතවන තුරු තමන් සඳහන් කරන ලද මිළ ගණන්වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතුයි.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් කොළඹ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගේ කාර්යාලයෙන් ලබා ගත හැක. ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර්පත්‍ර නිකුත් කිරීමේදී 66.9.30 දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත්කරුවන් ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ මගින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

සී. ජී. සුගතදාස,
අධ්‍යාපනාධ්‍යක්ෂ, කොළඹ ප්‍රදේශය.

1970 ජූනි මස 29 වැනිදා,
කොළඹ 7, ග්‍රීන්පාත්,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී ය.

7-352—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—යාපනය කොට්ඨාශය

### කිළිටි රෙදි සේදීම

**සේවය සහ ටෙන්ඩර්කරුවන්ගේ සුදුසුකම්.**—1970 ඔක්තෝබර් 1 වැනි දින සිට 1971 සැප්තැම්බර් 30 වනදයින් (දින දෙකක් ඇතුළත) අවසන් වන වර්ෂය තුල, මෙහි පහත සඳහන් උපලේඛනයේ පළමුවෙනි වගන්තියෙහි දක්වා තිබෙන ආයතනයන්හි කිළිටි රෙදි සේදීම සඳහා ලාංකිකයන් හා ලාංකික සමාගම් විසින් එවනු ලබන සිල් තබන ලද ටෙන්ඩර් පත්‍ර යාපනය සෞඛ්‍ය සේවා අධිකාරි විසින් භාරගනු ලැබේ.

2. **ටෙන්ඩර් තැන්පත් මුදල.**—(i) මෙම උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ බදුල්ල, මඩකලපුව, අනුරාධපුර, කොළඹ, ගාල්ල, කළුතර, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුර සහ වව්නියා යන ස්ථානයන්හි පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලවලින් ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි.

ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝරම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කම් විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම්කිරීමේදී ටෙන්ඩර්පත්‍ර බාරගැනීමට සැලකිය යුතු කාලයකට පළමු තම වත්කම මට දන්විය යුතුය. මේ සඳහා උවමනා පෝරම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ දෙවන කොටසේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක.

වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහාපෑමට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **සෝදන කැලි ප්‍රමාණය පිළිබඳ විස්තර.**—දළ වශයෙන් මාසයකට සේදිය යුතු කැලි ප්‍රමාණය මේ සමඟ ඇති උපලේඛනයේ 5 වැනි වගන්තියෙහි දක්වා ඇත.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර්පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා "සෞඛ්‍ය සේවා අධිකාරි, යාපනය, කියා එවිය යුතුයි. සිල් කරන ලද ටෙන්ඩර් පත බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස සහිත කෙළවරේ ටෙන්ඩර්කරුවන්ගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර්පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරි ප්‍රාදේශීය ලේකම් මහතාට දීමෙන් ඒ ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි කළ තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 6 වැනි තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කටයුතු පිළියෙල කරගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාලසීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාල සීමාව ඉකුත්වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම්, එහි සඳහන් මිළ ගණන් මොන හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු ඔහුගේ ටෙන්ඩරය පිළිගත් දින සිට දින 10ක් ඇතුළත මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන්වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් හැර පිළිපැදිය යුතු ද වන්නේය.

11. **අනික් විස්තර.**—(i) කොන්ත්‍රාත්කරුවන්ට ගබඩා, විදුලිබලය, ජලය ආදී පහසුකම් සැපයුවහොත් ඊට යන වියදම් ආදිය පළාතේ ආදයම් පාලක නිලධාරිතුමා තක්සේරු කළ ගණන්වලට අනුව වවුචරයෙන් කපාගනු ලැබේ.

(ii) **කිළිටු රෙදිවල විෂබීජ නැති කිරීම සහ එහා මෙහා ගෙනයාමේ වියදම්.**—යම් අවස්ථාවක කිළිටු රෙදි සේදීමට පළමු ඒවායේ විෂබීජ නැති කිරීම සඳහා වෙන ස්ථානයකට ගෙනයාමට සිදුවුවහොත් ඒවා එහා මෙහා ගෙනයාමට කිසිම ගාස්තුවක් ගෙවනු නොලැබේ.

(iii) **පළාත් පාලන මණ්ඩලවල පිහිටා ඇති ආයතනයන් සඳහා ටෙන්ඩර්.**—පළාත් පාලන මණ්ඩලවල ඇති ආයතනයන්ට ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක්කේ ඒ ඒ මණ්ඩලවල නීතිවලට අනුව (නීති ඇතොත්) රෙදි පිරිසිදු කරන ස්ථාන හිමි අයට පමණි.

(iv) ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් කොටසක් හෝ සෑම කොටසම ඒවාට නියමිත තැන්පත් මුදල බැඳීමෙන් පසු සඳහන් කළ හැකිය.

1970 ජුනි මස 30 වෙනි දින,
යාපනයේ සෞ.සේ. අධිකාරි කාර්යාලය.

ඇස්. රාසරත්නම්,
සෞඛ්‍ය සේවා අධිකාරි, යාපනය.

## උපලේඛනය

| සේවය | ටෙන්ඩර් තැන්පත් මුදල | ඇප මුදල | මසකට රෙදි සේදිය යුතු වාර ගණන | මසකට සේදිය යුතු කැලි ගණන සාමාන්‍ය | ටෙන්ඩර් අවසාන වන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|
| | රු. | රු. | | | |
| **සිවිල් රෝහල—කන්කසන්තුරේ** | | | | | |
| 1 වෙනි කොටස—පිරිමි වාට්ටු (වෛද්‍ය), ගැහැණු වාට්ටු (වෛද්‍ය), බාහිර රෝගීන්ගේ අංශය, ශල්‍ය කර්මාගාරය, ඇක්ස්රේ අංශය, රසායනාගාරය, මාතෘ වාට්ටුව, මුළුතැන් ගෙය, දන්ත චිකිත්සාගාරය හා හෙදි නිවාසය, මානසික වාට්ටු (පිරිමි සහ ගැහැණු) ... ... | 50 ... | 100 ... | 4 ... | 2,200 | 1970–7–30 දින පෙරවරු 10 ට |
| 2 වෙනි කොටස—වාට්ටු අංක 1 (පිරිමි ක්ෂය රෝග වාට්ටු) ... | 50 ... | 100 ... | 4 ... | 700 | |
| **මහ රෝහල—යාපනය** | | | | | |
| අංශ 1—මාතෘ වාට්ටු අංක 1 සහ 2, ළමා වාට්ටු අංක 9 ... ... | 50 ... | 100 ... | 15 ... | 23,000 | |

| සේවය | ටෙන්ඩර් තැන්පත් මුදල | ඇප මුදල | මසකට රෙදි සේදිය යුතු වාර ගණන | මසකට සේදිය යුතු කෑලි ගණන සාමාන්‍ය | ටෙන්ඩර් අවසාන වන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|
| | රු. | රු. | | | |
| අංශ 2—ස්ත්‍රී ශල්‍ය වෛද්‍ය වාට්ටු අංක 3 සහ 4, ස්ත්‍රී චිකිත්සා වාට්ටුව අංක 5, විකලාංග වාට්ටුව සහ කණ්, නාස, උගුරු වාට්ටු අංක 6—පිරිමි ශල්‍ය වෛද්‍ය වාට්ටුව අංක 18 ... ... ... | 50 ... | 100 ... | 4 ... | 9,000 | 1970.7.30 දින පෙරවරු 10ට |
| අංශ 3—ස්ත්‍රී වෛද්‍ය වාට්ටුව, අංක 10 ස්ත්‍රී අක්ෂ වාට්ටුව, අංක 12 පිරිමි වෛද්‍ය වාට්ටුව, අංක 14 පිරිමි ශල්‍ය වෛද්‍ය වාට්ටුව, අංක 17 රසායනාගාර කාමරය, විකිරණ දෙපාර්තමේන්තුව, අභ්‍යන්තර බෙහෙත් හල, ලේ බැංකුව සහ බාහිර රෝගීන්ගේ අංශය, අක්ෂ සහ කණ්, නාස, උගුර චිකිත්සාගාරවල හෙද පාලිකා නිවස, මාණ්ඩලික හෙද නිවස, මුළුතැන් හා අනිකුත් ... ... ... ... | 50 ... | 100 ... | 4 ... | 12,000 | |
| අංශ 4—ශල්‍ය වෛද්‍ය කාමරය ... ... ... | 50 ... | 100 ... | 15 ... | 11,000 | |
| අංශ 5—ගෙවන වාට්ටුව අංක 7, විකලාංග වාට්ටු අංක 8, පිරිමි අක්ෂි වාට්ටුව අංක 9 සහ උරස්තල වාට්ටුව අංක 16 ... ... | 50 ... | 100 ... | 4 ... | 7,100 | |

7–393—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### 1970–71 ගබඩා බඩු ඇදීම

**සේවය සහ ටැන්ඩර් දැමීමට සුදුසු පුද්ගලයින්.**—මේ කාර්යාලයෙන් හෝ මෙහි මතු 2 වන ඡෙදයේ සඳහන් කාර්යාලවලින් හෝ ඉල්ලා ලබා ගතයුතු උපලේඛනවල දක්වා ඇති කොරතුරු පරිදි, 1970.10.1 වනද සිට 1971.9.30 වනද දක්වා වකවානුව තුළ දුම්රිය පොළෙන්/පොළවලින් පොළවලට/පොළට, ආයතනවලින්/ආයතනවලට/කාර්යාලයට/කාර්යාලයයෙන් ගබඩා බඩු ඇදීම සඳහා ලාංකිකවූ පුද්ගලයින්ගෙනුත්, ලාංකික ව්‍යාපාර ආයතනවලිනුත්, සමුපකාර සමිතිවලිනුත්, අනුරාධපුර සෞ. සේ. අධිකාරීතැන ටැන්ඩර් බාරගනු ඇත.

සඳහන් මිළ ගණනට කම්කරු ගාස්තු සහ පැටවීම් කුලීද ඇතුළත් විය යුතුයි.

2. ටැන්ඩර් එවිය යුත්තේ ඊට නියමවූ ආකෘති පත්‍රය මතයි. රු. 100ක මුදලක් ළහම ඇති කච්චේරියේ අනුරාධපුර සෞ. සේ. අධිකාරි නමට තැන්පත් කොට එහි ලදුපත ලබාගෙන ටැන්ඩර් පත්‍ර නිකුත් කරනු සඳහා ටැන්ඩර්කරු නිසි පරිදි අත්සන් කළ වට්නාකම දක්වෙන ප්‍රකාශනයක් ඒ ලදුපත සමග ඉදිරිපත් කළ යුතුයි. ටැන්ඩර් පත්‍ර 1970.8.3 වනද දහවල් 12 දක්වා මතු සඳහන් සෞ. සේ. අධිකාරි කාර්යාලවලින් ලබාගත හැකිය :—

| | | | |
|---|---|---|---|
| මඩකලපුව | ගාල්ල | කෑගල්ල | පුත්තලම |
| බදුල්ල | යාපනය | කුරුණෑගල | රත්නපුර |
| කොළඹ | කලුතර | මාතලේ | වවුනියා |
| | මහනුවර | මාතර | |

නියමිත ආකෘති පත්‍රයේ නොවන කිසිදු ටැන්ඩරයක් සැලකිල්ලට ලක් නොවේ.

3. තමන් දෙපාර්තමේන්තුව සමග කොන්ත්‍රාත්තුවකට බැඳී ඇතත් නැතත් සියලු ටැන්ඩර්කරුවන් විසින් වටිනාකම පිළිබඳ වගතුග සැපයිය යුතුයි. මේ සඳහා අවශ්‍ය ආකෘති පත්‍ර ඉහත 2 වන ඡෙදයෙන් කියවුනු කවර හෝ සෞ. සේ. අධිකාරි කාර්යාලයයෙකින් ලද හැකිවේ.

4. එක් එක් පිටපතේ ටැන්ඩර්කරුගේ අත්සන ඇතිව දෙපිටපතකින් ඉදිරිපත් කළ යුතු ටැන්ඩර් පත්‍ර ''බඩු ඇදීම සඳහා ටැන්ඩරය'' යනුවෙන් වම්පැත්තේ උඩු කෙළවරේ සලකුණක් තබා අනුරාධපුර සෞ. සේ. අධිකාරි වෙත පිට නම ලියූ කවරයක බහා අස් ඔබා (සීල් තබා) එවිය යුතුයි.

5. ටැන්ඩර් පත්‍ර 1970.8.4 වනද පෙරවරු 10 ට පෙර අනුරාධපුර සෞ. සේ. අධිකාරි වෙත ලැබෙන සේ ඔහු වෙත පිට නම ලියා ලේඛනගත තැපැලෙන් එවිය යුතුය; නැතහොත් සෞ. සේ. අධිකාරි කාර්යාලයයේ තිබෙන ටැන්ඩර් පෙට්ටියේ හෝ තැන්පත් කළ යුතුය. ටැන්ඩර්කරුවන් කැමති නම්, ටැන්ඩර්කරුගේ නම සහ ලිපිනය සඳහන් කවරවලින් යුත්, අස් එබූ (සීල් තැබූ) ටැන්ඩර් පත්‍ර ඒ ඒ සෞ. සේ. අධිකාරි කාර්යාලවල, ලේකම්/ගණකාධිකාරි වෙත බාරදී ඊට ලදු පතක් ලබාගැනීමට ටැන්ඩර් කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට හෝ අවසර ඇත.

6. ටැන්ඩර් දමන මිළ ගණන් පැහැදිලි ඉලක්කමෙන් දක්වා වචනයෙන් ද නැවත ලියා තිබිය යුතුයි. වෙනස් කිරීම් සහ මකා දැමීම් සියල්ල ටැන්ඩර්කරු විසින් අත්සන් තබා අනුමත කොට තිබිය යුතුයි. නැත්නම් ටැන්ඩර් පත්‍රය නොසරුප් සේ සලකා පිටු දකිනු ලැබිය හැකිය.

7. බඩු ඇදීම සඳහා සෑහෙන තරම් ප්‍රවාහන පහසුකම් සැලසීමට ටැන්ඩර් කරුවන්ට පිළිවන්කම තිබිය යුතුයි. මේ මෙහෙය සඳහා යොද ගැනීමට යන වාහනවල ස්වරූපය ටැන්ඩර් එවන විට දක්විය යුතුයි.

8. ටැන්ඩර් පත්‍ර 1970.8.4 වනද පෙරවරු 10ට අනුරාධපුර සෞ. සේ. අධිකාරි කාර්යාලයයේදී විවෘත කරනු ඇත. ටැන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ වරම් ලත් නියෝජිතයින්ට හෝ තමන් කැමති නම්, අනුරාධපුර සෞ. සේ. අධිකාරි සමග විධිවිධාන සලසා ගෙන ඔහුගේ අවසරය පිට, ටැන්ඩර් විවෘත කරන විට පෙනී සිටිමින් තමන් ඉදිරිපත්කළ ටැන්ඩරයේ දෙවන පිටපත පිරික්සිය හැකිය.

9. ටැන්ඩර්කරුවන්, තමන් ඉදිරිපත් කරන මිළ ගණන්, ටැන්ඩර් බාරගැනීම අවසන් වන දවසේ සිට හය මාසයක් දක්වා පිළිගත හැකිසේ තබාගත යුතුයි. ඉදිරිපත් කළ ටැන්ඩර් පත්‍ර පසුව අස්කළ හැකි නොවේ.

10. අනුරාධපුර සෞ. සේ. අධිකාරි ඉල්ලා සිටියොත්, තමන් ගන්නා කොන්ත්‍රාත්තුව ඉටු කිරීමට තමන් පොහොසත් බවට සාක්ෂි හැටියට ලියකියවිලි හෝ වෙනත් සාධක හෝ ඉදිරිපත් කිරීමට ටැන්ඩර්කරුවන් සූදානමින් සිටිය යුතුයි.

11. මේ කොන්ත්‍රාත්තුව යටතේ සිය කාරිය ඉටු කිරීමේදී ටැන්ඩර්කරු සේවයට ගත යුත්තේ ලාංකිකයන් පමණකි. මෙහිදී " ලාංකිකයා " යනුවෙන් හැඳින්වෙන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් හෝ ලංකාවේ පුරවැසිකම ලැබූවෙකි. අනුරාධපුර සෞ. සේ. අධිකාරිගේ අවසරය සහ අනුදැනුම කලින් නොලැබ ලාංකික නොවන කම්කරුවන් සේවයට ගැනීම කොන්ත්‍රාත්තුවේ කොන්දේසි කඩකළාක් සේ සළකා, කොන්ත්‍රාත්තුව අවලංගු කොට එහි කොන්දේසි ප්‍රකාර දඩයන්ට කොන්ත්‍රාත්කරු යටත් කළ හැකි වරදකි.

12. 1934 අංක 19 දරන කම්කරු වන්දි මුදල් ආඥාපනත හෝ එහි සංශෝධන, ලිහිල් කිරීම්, එකතු කිරීම යන කිසිවක් හෝ යටතේ යම්කිසි සේවකයෙකු විසින් ඉදිරිපත් කරන්නට යෙදෙන යම් හිමිකමක් වෙතොත්, කොන්ත්‍රාත්කරු විසින් ඒ හැම දෙයකින්ම ආංඩුව මුදගත යුතුයි.

13. අනුරාධපුර සෞ. සේ. අධිකාරීතැන ඉල්ලා සිටින පරිදි මුළු කොන්ත්‍රාත්තුව හෝ ඉන් කොටසක් හෝ වෙනුවට රු. 800කට නොවැඩි ඇප මුදලක් තැබීම අවශ්‍ය වනු ඇත.

14. තෝරාගනු ලබන ටැන්ඩර්කරු, කොන්ත්‍රාත්තුව සතුටුදයක ලෙස ඉටු කරන බවට සෞ. සේ. අධ්‍යක්ෂ සමග කොන්ත්‍රාත්තුවකට බැඳිය යුතුයි. ටැන්ඩර්කරුගේ ටැන්ඩරය බාරගත් බව අනුරාධපුර සෞ. සේ. අධිකාරි විසින් හෝ ඔහුගේ නිසි වරම් දරන නියෝජිතයෙකු විසින් හෝ ටැන්ඩර් කරුට දන්වා දස දිනක් ඇතුළතදී කොන්ත්‍රාත්තුවට අත්සන් කිරීමට හෝ නියමිත ඇප මුදල තැබීමට හෝ ටැන්ඩර්කරු මැලිවූවොත් හෝ අපොහොසත් වුවොත් හෝ ඔහුගේ තැන්පත් මුදල රාජසන්තකවී, රජයේ ගිවිසුම් පැහැර හරින කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලියට ඔහුගේ නමද ඇතුළත් කිරීමට ද හේතුවේ. ටැන්ඩරය බාරගත් බව දක්වෙන නිවේදනය ටැන්ඩර් කරු සිය ටැන්ඩරයේ දී ඇති ලිපිනයට තැපැලෙන් යවා තිබේ නම්, නැතහොත් ඒ ලිපිනය ඇති තැන දමා තිබේ නම්, එය ටැන්ඩර්කරුට ලැබුණු බව ගණන් ගනු ලැබේ.

15. අනුරාධපුර සෞ. සේ. අධිකාරිගේ අවසරය කලින් නොගෙන මේ කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට පැවරීමට හෝ බෙදීම හෝ නොකට යුතුයි. කොන්ත්‍රාත්කරුවෙකු තමන් වෙනුවෙන් කොන්ත්‍රාත්තුව ඉටු කරනු පිණිස අන් අයෙකුට බලය පවරමින් නිකුත් කළ ප්‍රතිනිධි බලය නොපිළිගැනීමේ අයිතිය රජය සතුවේ.

16. අනුරාධපුර සෞ. සේ. අධිකාරිතැන සෑහෙතැයි තමන්ට පෙනෙන හේතු නිසා, තමා නම් සඳහන් කරන කිසියම් පුද්ගලයෙකු/පුද්ගලයින් කොන්ත්‍රාත්කරු විසින් සේවයට ගැනීම ගැන සිය විරුද්ධත්වය ලියවිල්ලකින් කොන්ත්‍රාත්කරු වෙත දන්වා සිටි කල ඒ කියන තැනැත්තා/තැනැත්තන් කිසිවෙකුත් කොන්ත්‍රාත්කරු විසින් සේවයට නොගත යුතුයි.

17. කිසිදු ප්‍රශ්නයක් නැතිවැ ටැන්ඩර් සියල්ලමැ හෝ, ඉන් කිසිවක් හෝ පිටු දැකීමත් යම් ටැන්ඩරයක කොටසක් පමණක් පිළිගැනීමත් රජය සතු අයිතියකි.

18. සෞ. සේ. අධ්‍යක්ෂක තැන සමග කොන්ත්‍රාත්තුකරු බැඳුණු ගිවිසුම කවරක් වුව ද, තමන් කැමැති අන්දමකින්, තමන් කැමැති කෙනෙකු ලවා එකී වැඩ කොටස කරවා ගැනීමේ නිදහස අනුරාධපුර සෞ. සේ. අධිකාරී වෙත තිබේ. එබඳු විටෙකැදී වැඩ නැතිවීම නිසා තමන්ට වන පාඩුව පිරිමැසීමට යම්කිසි වන්දියක් හෝ අලාභයක් හෝ අඩුකිරීමක් හෝ වෙනත් සහනයක් හෝ ඉල්ලීමේ අයිතිය කොන්ත්‍රාත්කරුට නොලැබේ. ඔහු ඊට හිමිකරුවෙක් ද නොවේ.

19. ඉහතකී පරිදි කොන්ත්‍රාත්කරු වෙත පවරන ලද බඩු ගෙන ගොස් බාරදීමට කොන්ත්‍රාත්කරු දෙතුන් වතාවක් ප්‍රමාද වූවොත් නැත්නම් අපොහොසත් වූවොත් හෝ ඒ බඩු බාරදීමට පිට පිට අපොහොසත් වූවොත් හෝ එකී කොන්දේසි කිසිවක් කඩ කළොත් හෝ, ඔහු කොන්ත්‍රාත්තුව ඉටු නොකළාක් සේ සළකනු ලැබේ. තවද, කොන්ත්‍රාත්තුවේ ඉටු කරන බවට ඔහු ඇපයක් හැටියට තැන්පත් කළ මුදල ද රජය සතුවී, රජයේ කොන්ත්‍රාත්තුවකට හවුල්වීමට ඔහුට ඉඩක් නොලැබෙන පරිදි රජයේ කොන්ත්‍රාත්තු පැහැර හරින්නන්ගේ නාමාවලියට ඔහුගේ නමද ඇතුළත් වීමට ඉඩ තිබේ.

20. ලංකාණ්ඩුවේ නීති මේ කොන්ත්‍රාත්තුවට අදළ වෙයි.

21. ටෙන්ඩර්කරුවන් කොන්ත්‍රාත්තුවේ කොන්දේසි හොඳින් දැන සිටිය යුතුයි. තොරතුරු නොදත් බව හෝ ප්‍රමාණවත් නොවූ බව හෝ කියා ඉදිරිපත් කරන මැසිවිලි කිසි කලෙකත් සළකා බලනු නොලැබේ.

22. මෙහිලා සඳහන් සියලු කොන්දේසි අකුරට මැ සපුරා නැතොත්, කිසිදු ටැන්ඩරයක් සළකා බලනු නොලැබේ.

23. ටැන්ඩර්කරුවන්ට දැනගැනීමට අවශ්‍ය වැඩි විස්තර යමක් වෙතොත්, ඉහත 2 වැනි ඡෙදයේ දැක්වෙන කාර්යාලවලින් ඉල්ලා ලබාගත හැකිය.

24. **දුර ප්‍රමාණ කිවටුවෙන්.**—දුම්රිය පොළවල/අතුරු පොළවල සිට ආයතනවලට/කාර්යාලවලට කොපමණ දුරක් තිබේ ද යන වග මෙ සමග ඇති උපලේඛනයේ දැක්වේ. මෙහි දැක්වෙන දුර ප්‍රමාණය නිරවද්‍යතාවය ගැන දෙපාර්තමේන්තුව වග නොකියයි.

25. **ගබඩා/බඩු යනාදිය නැතිවීම නිසා මුදල් අය කිරීම.**—කොන්ත්‍රාත්කරු විසින් ගෙන ගොස් බාරදිය යුතු බඩු බාහිරාදිය හෝ ඉන් යමක් හෝ නැතිවූවොත් හෝ හොරකම් කරනු ලැබුවොත් හෝ බඩු බාහිරාදියට අලාභයක්-හානියක් සිදු වුවහොත් හෝ ඒ හේතුවෙන් රජයට දරීමට සිදුවන රේගු බදු යනාදිය කිසිවක් වෙතොත් එය ද ඇතුළත් කොටැ, අලාභ හානි සිදුවූ හෝ සොරකම් කරන ලද හෝ නැතිවූ බඩු බාහිරාදියෙහි මුළු වටිනාකම දෙපාර්තමේන්තු ගාස්තුත් සමග දෙපාර්තමේන්තුවට ගෙවීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

26. **දැක්විය යුතු මිළ ගණන්.**—(අ) (i) බඩු ඇදීම සඳහා මෙසේ වැටි 10 ක් යටතේ එක් එක් බර ගොල්ල වෙනුවෙන් මිළ ගණන් බී-I උප ලේඛනයෙහි දැක්විය යුතු :—

පළමුවැ රාත්තල් 28 දක්වා ද,
දෙවනුවැ රාත්තල් 28 ට වැඩියෙන් රාත්තල් 56 දක්වා ද,
තුන්වනුවැ රාත්තල් 56 ට වැඩියෙන් රාත්තල් 84 දක්වා ද,
සිවවනුවැ රාත්තල් 84 ට වැඩියෙන් හොණ්ඩර 1 දක්වා ද,
පස්වනුවැ හොණ්ඩර 1 ට වැඩියෙන් හොණ්ඩර 1½ දක්වා ද,
හයවනුවැ හොණ්ඩර 1½ ට වැඩියෙන් හොණ්ඩර 2 දක්වා ද,
හත්වනුවැ හොණ්ඩර 2 ට වැඩියෙන් හොණ්ඩර 2½ දක්වා ද,
අටවනුවැ හොණ්ඩර 2½ ට වැඩියෙන් හොණ්ඩර 3 දක්වා ද,
නමවනුවැ හොණ්ඩර 3 ට වැඩියෙන් හොණ්ඩර 3½ දක්වා ද,
දසවනුවැ හොණ්ඩර 3½ ට වැඩියෙන් හොණ්ඩර 4 දක්වා ද වේ.

(ii) එක් බඩු පොදියක් මුළු දුරමැ ගෙනැ යාම සඳහා එක් එක් බර-ගොල්ල උදෙසා මිළ ගණන් දැක්විය යුතුයි.

(iii) මුදල් ගෙවනු ලබන්නේ, ඉහත වැටි ක්‍රමයේ දැක්වෙන බර කුමක් වුවද මුළු දුර ප්‍රමාණය මැ ගෙන යන ලද එක් එක් බඩු පොදි ගමන අනුවයි.

(iv) එක් බඩු තොගයක අඩංගු බඩු මිටි ගණනේ බර හොණ්ඩර 4 කට අඩු නම්, ඒවායේ ගෙවීම බී-I උපලේඛනය යටතේ විය යුතුයි. එක් බඩු තොගයක අඩංගු බඩු මිටි ගණනේ බර හොණ්ඩර 4 කට වැඩිවේ නම් ඒවායේ ගෙවීම තොග ප්‍රවාහණ ගෙවීම් යටතේ බී-II උපලේඛනය යටතේ විය යුතුයි.

(ආ) හොණ්ඩර 4 ක් හෝ ඊට වැඩියෙන් හෝ බරක් ඇති බඩු තොග මුළු දුරමැ ගෙන යෑම සඳහා මතු සටහන් වැටි 4 යටතේ බී-II උපලේඛනයෙහි මිළ ගණන් දැක්විය යුතුයි :—

(1) හොණ්ඩර 4 කට වැඩියෙන් හොණ්ඩර 10 දක්වා;
(2) හොණ්ඩර 10 කට වැඩියෙන් හොණ්ඩර 15 දක්වා;
(3) හොණ්ඩර 15 කට වැඩියෙන් හොණ්ඩර 20 දක්වා;
(4) ටොන් 1 කට වැඩියෙන්.

ටෙන්ඩර්කරුවන් විසින් මුළු දුරමැ ගෙන යාම සඳහා ඒ ඒ වැටි යටතේ මිළ ගණන් වෙන වෙනමැ දැක්විය යුතුයි. මුදල් ගෙවනු ලබන්නේ වැටි 4 යටතේ මුළු දුරමැ සඳහා හොණ්ඩරයකට දැක්වූ මිළ ගණන මතැ අනු ප්‍රමාණ ක්‍රමය උඩයි. හොණ්ඩරයක කොටසක් රාත්තල් 56 කට වැඩි නම් එය හොණ්ඩරයක් සේ සැළකෙයි. නොඑසේ නම් ඊට මුදලක් ගෙවනු නොලැබේ.

(ඇ) සඳහන් කර ඇති මිළ ගණන් සාධාරණ විය යුතු අතර යාබද බර කාණ්ඩ අතර අනවශ්‍ය පරිදි මිළ වැඩි විය යුතු නොවේ.

27. මේ දැන්වීම, මෙහි පහත ඉඩ තබා ඇති තැනෙහි ටැන්ඩර්කරුගේ අත්සන තබා ටැන්ඩර් පත්‍රයක් සමග අනුරාධපුර සෞඛ්‍ය සේවා අධිකාරී වෙත ආපසු එවිය යුතුයි.

එච්. සී. ඌරාගොඩ,
අනුරාධපුර සෞඛ්‍ය සේව අධිකාරී.

1970 ජූනි 29 වැනි දින දී ය.

————,
නිකුත් කරන නිලධාරියාගේ අත්සන.

දිනය : 1970....................

————,
ටැන්ඩර්කරුගේ අත්සන.

දිනය : 1970....................

## 1970–71 ගබඩා බඩු ඇදීම සඳහා ටෙන්ඩර් කොන්දේසිවල 24 වන ඡෙදයේ කියවෙන උපලේඛනය

| දුම්රිය පොළෙන්/ පොළට, දුම්රිය බාහිර නියෝජ්‍ය ස්ථානයෙන්/ ස්ථානයට | | ආයතනවලින්/ ආයතනවලට කාර්යාලවලින්/ කාර්යාලවලට | | කිවටුවෙන් සැලකිය හැකි දුර |
|---|---|---|---|---|
| | | **I කොටස** | | |
| | | | | හැ. |
| තඹුත්තේගම | ... | ගාලේවැව ම.බෙ. | ... | 7 |
| | | තඹුත්තේගම ම.බෙ.හා.මා.නි. | ... | 2 |
| තලාව | ... | එප්පාවල ම.බෙ.හා.මා.නි. | ... | 8 |
| | | කට්ටියාව ම.බෙ. ... | ... | 14 |
| | | තලාව ම.බෙ.හා.මා.නි. | ... | ½ |
| තඹුත්තේගම | ... | රාජාංගනය ම.බෙ.හා,මා.නි. | ... | 11 |
| රත්මලේ | ... | නෙළුබැව ග්‍රා.රෝ. ... | ... | 2 |
| අනුරාධපුර | ... | සෞ.සේ.අධි. කාර්යාලය, අනුරාධපුර | | 1 |
| | | සෞ.කා. අනුරාධපුර | ... | 2 |
| | | අනුරාධපුර රෝහල | ... | 2 |
| | | ගල්කුලම ම.බෙ. ... | ... | 11 |
| | | කහටගස්දිගිලිය රෝහල | ... | 21 |
| | | මිහින්තලේ ග්‍රා.රෝ. | ... | 8 |
| | | නොච්චියාගම ප.ඒ. | ... | 16 |
| | | එලයාපත්තුව ම.බෙ.හා.මා.නි. | ... | 10 |
| | | මෛත්‍රී ජංගම ... | ... | 2 |
| | | ශුද්ධ නගරය ම.බෙ. | ... | 2 |
| | | කම්මැන්නාව ග්‍රා.රෝ. | ... | 14 |
| | | කහටගස්දිගිලිය සෞ.කා. | ... | 21 |
| | | කෝන්වැව ම.බෙ. | ... | 29½ |
| | | මහවිලච්චිය ම.බෙ.හා.මා.නි. | ... | 22½ |
| | | රණෝරාව ම.බෙ. ... | ... | 20 |
| | | රඹාවැව ම.බෙ. ... | ... | 10 |
| | | **II කොටස** | | |
| තම්පලාකාමම් | ... | තම්පලාකාමම් ග්‍රා.රෝ. | ... | 2 |
| කන්තලායි | ... | කන්තලායි ම.බෙ. | ... | ¾ |
| | | ගන්තලාව ම.බෙ. ... | ... | 6½ |
| ත්‍රිකුණාමලය | ... | ත්‍රිකුණාමලය රෝහල | ... | 1½ |
| | | ත්‍රිකුණාමලය සෞ.කා. | ... | 1½ |
| | | ගෝමරන්කඩවල ග්‍රා.රෝ. | ... | 24 |
| | | මොරවැව ම.බෙ. ... | ... | 17 |
| | | නිලාවලි ම.බෙ. ... | ... | 9 |
| | | කිරියායි ම.බෙ. ... | ... | 31 |
| | | පුල්මුඩේ ම.බෙ.හාමා.නි. | ... | 36 |
| | | කුච්චවෙලි ග්‍රා.රෝ. | ... | 22 |
| වයිනාබේ | ... | පෙරියකින්යායි ප.ඒ. | ... | 5 |
| | | මුතූර් රෝහල ... | ... | 12 |
| | | තෝප්පූර් ම.බෙ. ... | ... | 13 |
| | | ඉච්ලන්පත්තෙයි ම.බෙ. | ... | 23 |
| | | අල්ලයි ම.බෙ. ... | ... | 26 |

### III කොටස

| දුම්රිය පොළෙන්/ පොළට, දුම්රිය බාහිර නියෝජ්‍ය ස්ථානයෙන්/ ස්ථානයට | | ආයතනවලින්/ ආයතනවලට කාර්යාලවලින්/ කාර්යාලවලට | | කිට්ටුවෙන් සැලකිය හැකි දුර හැ. |
|---|---|---|---|---|
| නෑගම | ... | නෑගම්පහ ම.බෙ.හා.මා.නි. | ... | 2½ |
| | | ගල්කිරියාගම ම.බෙ. | ... | 14 |
| | | ආඩියාගල ම.බෙ. | ... | 3 |
| කලාවැව | ... | කලාවැව ම.බෙ. ... | ... | 2 |
| | | සේනපුර ග්‍රා.රෝ. | ... | 11 |
| කැකිරාව | ... | මරදන්කඩවල ම.බෙ.හා.මා.නි. | ... | 5 |
| | | කුන්චිකුලම ම.බෙ. | ... | 29 |
| | | ගලෙන්බිඳුනු වැව ම.බෙ.හා.මා.නි. | ... | 22 |
| | | යකල්ල ග්‍රා.රෝ. ... | ... | 15 |
| | | කැකිරාව ප.ඒ. ... | ... | 2 |
| | | කැකිරාව සෞ.කා. | ... | 2 |
| | | හබරන ම.බෙ.හා.මා.නි. | ... | 1¾ |

### IV කොටස

| දුම්රිය පොළෙන්/ පොළට, දුම්රිය බාහිර නියෝජ්‍ය ස්ථානයෙන්/ ස්ථානයට | | ආයතනවලින්/ ආයතනවලට කාර්යාලවලින්/ කාර්යාලවලට | | කිට්ටුවෙන් සැලකිය හැකි දුර හැ. |
|---|---|---|---|---|
| පරසංගහවැව | ... | පරසංගහවැව ම.බෙ. | ... | 1 |
| මැදවච්චිය | ... | මැදවච්චිය රෝහල | ... | 2½ |
| | | රත්මල්ගහවැව ම.බෙ.හා.මා.නි. | ... | 16 |
| | | හොරවපතාන ප.ඒ. | ... | 28 |
| | | එතාකඩ ම.බෙ. ... | ... | 12 |
| | | කල්ලන්චිය ම.බෙ. | ... | 16 |
| | | කපුගොල්ලෑව ම.බෙ. | ... | 37 |
| | | කැඳෑව ම.බෙ. ... | ... | 13 |
| | | කරුණා ජංගම ... | ... | 2½ |
| වව්නියා | ... | කැබිතිගොල්ලෑව ම.බෙ.හා.මා.නි. | ... | 15 |
| | | පදවිය ම.බෙ. ... | ... | 41 |
| | | පදවිය දි.රෝ. ... | ... | 35 |
| | | තිත්තගෝනෑව ම.බෙ. | ... | 21 |
| | | සිරිපුර ම.බෙ. ... | ... | 47 |
| මැදවච්චිය | ... | පූනෑව ම.බෙ. ... | ... | 6 |

7–351—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

1970 ඔක්තෝබර මස 1 වනද සිට 1971 සැප්තැම්බර මස 30 වනදයින් අවසන් වන වර්ෂය තුළ මේ සමග ඇති උපලේඛනයේ පළමුවැනි තීරයෙහි දක්වා ඇති අමු කොස්කොළ හා තණකොළ සැපයීමට එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර්පත්‍ර ලාංකිකයන්ගෙන් හෝ ලාංකික ආයතනවලින් වෛද්‍ය පර්යේෂණායතනයේ අධ්‍යක්ෂ තැන විසින් භාර ගනු ලැබේ.

2. මෙම කාර්යාලය මඟින් සපයන ලද පෝර්මවල පමණක් පිටපත් දෙකකින් ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

3. මේ සමග ඇති උපලේඛනයේ 4 වැනි තීරයෙහි සඳහන් දිනවල පෙරවරු 10ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැකිය. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් විසින් ටෙන්ඩර් පත්‍රවල සඳහන් කරන ලද මිළ ගණන්ද පැමිණ සිටින්නන් ඉදිරියේ කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකුට ටෙන්ඩර්පත්‍ර පරීක්ෂා කිරීමට අවශ්‍ය වුවහොත් වෛද්‍ය පර්යේෂණායතනයේ අධ්‍යක්ෂගේ හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ වෙනත් නිලධාරියෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

4. මේ සමග ඇති උපලේඛනයේ දෙවැනි තීරයෙහි සඳහන් ප්‍රමාණයේ මුදලක් කච්චේරියක තැන්පත් කළ බවට නිකුත් කෙරෙන කුවිතාන්සියක් ටෙන්ඩර් පත්‍රය ලබා ගැනීමට පළමුව ඉදිරිපත් කළ යුතුය.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියා පදිංචි කරන ලද සමූපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිති වලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියා පදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

5. අයදුම්කරුවන් විසින් තැන්පත් කරන ලද මුදලට ලබාගත් කුවිතාන්සි ටෙන්ඩර්පත්‍ර නිකුත් කෙරෙන අවසාන දිනට පෙර දින දවල් 12 ට පෙර ඉදිරිපත් කර අවශ්‍ය පෝර්ම ලබාගත යුතුය. තැපැලෙන් පෝර්ම ඉල්ලුම් කරන අය මුදල් තැන්පත් කළ කුවිතාන්සි කල්වේලා ඇතිව එවීමෙන් අවසාන දිනයට ප්‍රථම ටෙන්ඩර් එවීම සඳහා අවශ්‍ය පෝර්ම ලබාගත හැකිය.

6. සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර්පත්‍ර ඉල්ලා එවීමට පෙර තම තමන්ගේ වටිනාකම් පිළිබඳ තොරතුරු වෛද්‍ය පර්යේෂණායතනයේ අධ්‍යක්ෂ වෙත දැන්විය යුතුය. මේ සඳහා අවශ්‍ය පෝර්ම එම කාර්යාලයෙන් ලබාගත හැක.

ටෙන්ඩර්කරුවන්ගේ මුදල් තත්ත්වයේ ස්ථිර භාවය පිළිබඳ තොරතුරු දැනගැනීමට පෙර ඔවුන් විසින් එවන ලද ටෙන්ඩර් පිළිබඳ තීරණයක් කළ නොහැකි බැවින්, තම තමන්ගේ වටිනාකම පිළිබඳ තොරතුරු කල්වේලා ඇතිව ඉදිරිපත් කළ යුතුය.

7. සැම ටෙන්ඩර්යක්ම ඉහත සඳහන් වෛද්‍ය පර්යේෂණායතනයේ අධ්‍යක්ෂ තැනගේ නමට එවිය යුතුය. සීල් තැබූ ටෙන්ඩර්පත්‍ර බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාද යන්න සඳහන් කළ යුතුයි. ඒ කවරයේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය ද සඳහන් කළ යුතුය. ටෙන්ඩර්පත් එම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ වෛද්‍ය පර්යේෂණායතනයේ අධ්‍යක්ෂවරයාට පුද්ගලිකව භාරදීමෙන් හෝ එය ලැබුණ බවට කුවිතාන්සියක් ලබා ගත හැක. ටෙන්ඩර් කරුවන්ට තම ටෙන්ඩර්පත් ලියා පදිංචි තැපැලෙන් ද එවීමට පුළුවන. ටෙන්ඩර්පත් භාර ගන්නා අවසාන දින පෙ.ව. 10ට පසු තැපැලෙන් එවන හෝ පැමිණ භාර දෙන සැම ටෙන්ඩර් පත්‍රයක්ම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. ආයතනයට අවශ්‍ය අමු කොස්කොළ හා තණකොළ ප්‍රමාණය දළ වශයෙන් වෛද්‍ය පර්යේෂණායතනයේ අධ්‍යක්ෂතුමාගෙන් ලබා ගත හැකිය.

9. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටිපස දක්වා ඇත. ටෙන්ඩරයක් ඉල්ලුම් කරන විට එහි අඩංගු කොන්දේසි හොඳින් දැන ගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය.

10. කිසිම විමසුමක් නොමැතිව ටෙන්ඩරය සම්පූර්ණයෙන්ම හෝ කොටසක් භාර ගැනීමද, නැතහොත් සියලුම ටෙන්ඩර් හෝ කොටසක් ප්‍රතික්ෂේප කිරීමේ බලයද රජය සතුව ඇත.

11. වැඩි විස්තර සඳහා මෙම කාර්යාලයට අයදුම් පත් එවීමෙන් දැන ගත හැකිය.

වෛද්‍ය කේ. නිත්‍යනන්ද,
වෛද්‍ය පර්යේෂණායතනයේ අධ්‍යක්ෂ.

1970.6.29 වනද,
කොළඹ 8, වෛද්‍ය පර්යේෂණායතනය.

### උපලේඛනය

| (1) සේවය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල | (3) ඇප මුදල | (4) ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය |
|---|---|---|---|
| 1. වෛද්‍ය පර්යේෂණ ආයතනයට තණකොළ සැපයීම ... | 100 ... | 400 | 1970.7.31 දින පෙරවරු 10ට |
| 2. වෛද්‍ය පර්යේෂණ ආයතනයට අමු කොස් කොළ සැපයීම ... | 100 ... | 300 | |

7–301—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### 1970–71 ගබඩා බඩු ඇදීම

**සේවය සහ ටැන්ඩර් දැමීමට සුදුසු පුද්ගලයින්.**—මේ කාර්යාලයෙන් හෝ මෙහි මතු 2 වන ඡේදයේ සඳහන් කාර්යාලවලින් හෝ ඉල්ලා ලබා ගතයුතු උපලේඛනවල දක්වා ඇති තොරතුරු පරිදි 1970.10.1 සිට 1971.9.30 වනද දක්වා වකවානුව තුළ දුම්රිය පොළෙන්/පොළවලින්/පොළවලට/පොළට/ආයතනවලින්/ආයතනවලට/ කාර්යාලයට/ කාර්යාලයෙන් ගබඩා බඩු ඇදීම සඳහා, ලාංකික වූ පුද්ගලයින්ගෙනුත්, ලාංකික ව්‍යාපාර ආයතනවලින්නුත්, සමූපකාර සමිතිවලිනුත් මහනුවර සෞ. සේ. අධිකාරි තැන ටැන්ඩර් බාරගනු ඇත.

සඳහන් මිළ ගණනට කම්කරු ගාස්තු සහ පැටවීම් කුලීද ඇතුළත් විය යුතුයි.

2. ටැන්ඩර් එවිය යුත්තේ ඊට නියමවූ ආකෘතිපත්‍රය මතැයි. රු. 100ක මුදලක් ළඟම ඇති කච්චේරියේ මහනුවර සෞ. සේ. අධිකාරී නමට තැන්පත් කොටැ එහි ලදුපත ලබාගෙනැ ටැන්ඩර්පත්‍ර නිකුත් කරනු සඳහා

(ආ) හොණ්ඩර 4ක් හෝ ඊට වැඩියෙන් හෝ බරක් ඇති බඩු තොග මුළු දුරමැ ගෙන යැම සඳහා මතු සඳහන් වැට් 4 යටතේ බී-II උපලේඛන යෙහි මිළ ගණන දක්විය යුතුයි :—

(1) හොණ්ඩර 4 කට වැඩියෙන් හොණ්ඩර 10 දක්වා.
(2) හොණ්ඩර 10 කට වැඩියෙන් හොණ්ඩර 15 දක්වා.
(3) හොණ්ඩර 15 කට වැඩියෙන් හොණ්ඩර 20 දක්වා.
(4) ටොන් 1 කට වැඩියෙන්.

ටෙන්ඩර්කරුවන් විසින් මුළු දුරමැ ගෙන යාම සඳහා ඒ ඒ වැට් යටතේ මිල ගණන් වෙන වෙනමැ දක්විය යුතුයි. මුදල් ගෙවනු ලබන්නේ වැට් යටතේ මුළු දුරමැ සඳහා හොණ්ඩරයකට දක්වූ මිළ ගණන මතැ අනු ප්‍රමාණ ක්‍රමය උඩයි. හොණ්ඩරයක කොටසක් රාත්තල් 56 කට වැඩි නම් එය හොණ්ඩරයක් සේ සැළකෙයි. නොඑසේ නම් ඊට මුදලක් ගෙවනු නොලැබේ.

(ඇ) සඳහන් කර ඇති මිළ ගණන් සාධාරණ විය යුතු අතර යාබද බර කාණ්ඩ අතර අනවශ්‍ය පරිදි මිළ වැඩි විය යුතු නොවේ.

27. මේ දන්වීම, මෙහි පහත ඉඩ තබා ඇති තැනෙහි ටැන්ඩර්කරුගේ අත්සන තබා ටැන්ඩර් පත්‍රයක් සමග මහනුවර සෞඛ්‍ය සේවා අධිකාරී වෙත ආපසු එවිය යුතුයි.

ජී. ඊ. ගජනායක,
සෞඛ්‍ය සේවා අධිකාරී.

1970 ජූනි මස 30 වැනි දින,
මහනුවර සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලය.

————————,
නිකුත් කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.

————————,
ටෙන්ඩර්කරුගේ අත්සන.

දිනය :————.

## 1970–71 ගබඩා බඩු ඇදීම සඳහා ටෙන්ඩර් කොන්දේසිවල 24 වන ඡේදයේ කියවෙන උපලේඛනය

**මහනුවර සෞ. සේ. අධිකාරිය—දුම්රිය පොළෙන්/පොළට/ආයතනවලින්/ ආයතනවලට, කාර්යාලවලින්/කාර්යාලවලට දුර ප්‍රමාණය දළවශයෙන්**

| දුම්රිය පොළෙන්/ පොළට, දුම්රිය බාහිර නියෝජ්‍ය ස්ථානයෙන්/ස්ථානයට | ආයතනවලින්/ආයතනවලට කාර්යාලවලින්/කාර්යාලවලට | කිටවු වෙන් සැළකිය හැකි දුර |
|---|---|---|
| | **1 වන කොටස—මහනුවර** | |
| කටුගස්තොට ... | ගලගෙදර සෞ. කා. ... | 11¼ |
| | ගලගෙදර ප. ඒ. ... | 11 |
| | මැදවල ප. ඒ. ... | 6½ |
| | කටුගස්තොට ප. ඒ. ... ... | 1 |
| | ශ්‍රී රාහුල විද්‍යාලීය දන්ත චිකිත්සාගාරය | 1¼ |
| | හාරිස්පත්තු සෞ. කා. ... | 3 |
| | අකුරන ග්‍රා. රෝ. ... ... | 4 |
| | බොක්කාවල ම. බෙ. ... | 12 |
| | පූජාපිටිය ම.බෙ. ... ... | 9 |
| | තික්තපජ්ජල මා.නි. ... ... | 4½ |
| | අන්කුඹුර ග්‍රා.රෝ. ... ... | 13 |
| වත්තේගම ... | යක්හගපිටිය ම. බෙ. ... | 5 |
| | මඩුල්කැලේ දි.රෝ. ... | 11 |
| | වත්තේගම ග්‍රා.රෝ. ... ... | 3¼ |
| | වත්තේගම සෞ.කා. ... | ¼ |
| | වත්තේගම ක්‍රයිස්ට් චර්ච් විද්‍යාලීය දන්ත චිකිත්සාගාරය | 1 |
| | ගල්පිහිල්ල මා.නි. ... | 3 |
| | හුරිකඩුව ප.ඒ. ... ... | 5 |
| | නාරන්පනාව ම.බෙ. ... | 7 |
| | මඩවල මා.නි. ... ... | 3 |
| | **2 වන කොටස—මහනුවර** | |
| මහනුවර ... | මිනිපේ ප. ඒ. ... / අඹගහපැලැස්ස මා. නි. ... | 45 |
| | බඩුමුල්ල ග්‍රා.රෝ. ... ... | 46 |
| | කොලොන්ගොඩ මා.නි. ... | 45 |
| | මැද මහනුවර සෞ.කා. ... | 19 |
| | දුන්හින්න මා.නි. ... ... | 23 |
| | මාරස්සන ප.ඒ. ... ... | 13 |
| | තලාකුඹය ග්‍රා.රෝ. ... | 6½ |
| | උඩුවෙල ග්‍රා.රෝ. ... ... | 6 |
| | තලාකුඹය සෞ.කා. ... | 7 |
| | මැදමහනුවර ම.බෙ. ... ... | 19 |
| | රන්ගල ම.බෙ. ... ... | 25 |
| | හොනාගම මා.නි. ... ... | 22½ |
| | මයිලපිටිය ම.බෙ. ... ... | 12 |
| | සල්ලේවත්ත ම.බෙ. ... | 41 |

| දුම්රිය පොළෙන්/ පොළට, දුම්රිය බාහිර නියෝජ්‍ය ස්ථානයෙන්/ ස්ථානයට | ආයතනවලින්/ආයතනවලට කාර්යාලවලින්/ කාර්යාලවලට | කිටවුවෙන් සැලකිය හැකි දුර |
|---|---|---|
| | මාඩුගොඩ ග්‍රා.රෝ. ... ... | 26 |
| | කෙල්දෙනිය දි.රෝ. ... ... | 18 |
| | හඟුරන්කෙත ම. බෙ. ... ... | 17½ |
| | රිකිල්ලගස්කඩ ප.ඒ. ... | 20 |
| | මතුරට දි.රෝ. ... ... | 28 |
| | මතුරට සෞ.කා. ... ... | 22 |
| | මන්දරන්නුවර ම.බෙ. ... | 25 |
| | කෙන්ගල්ල මහාවිද්‍යාලීය දන්ත චිකිත්සාගාරය | 7 |
| | **3 වන කොටස—මහනුවර** | |
| රඹුක්කන ... | එරමුදුලියද්ද ග්‍රා.රෝ. ... ... | 14 |
| | හතරලියද්ද ග්‍රා.රෝ. ... ... | 9½ |
| කඩුගන්නාව ... | කඩුගන්නාව ප.ඒ. ... ... | 1 |
| | වට්ටප්පොල ම.බෙ. ... ... | 5 |
| | කොටලිගොඩ ග්‍රා.රෝ. ... | 8 |
| | පමුනුව ම.බෙ. ... ... | 5 |
| | කඩුගන්නාව සෞ.කා. ... | ¾ |
| | පිලිමතලාව පාඨශාලීය දන්ත චිකිත්සාගාරය | 3 |
| පේරාදෙනිය හන්දිය | මාම්පිටිය ග්‍රා.රෝ. ... ... | 2 |
| | ඊරියගම ම.බෙ. ... ... | 1 |
| | මුරුතලාව මා.නි. ... ... | 5 |
| | දස්කර පාඨශාලීය දන්ත චිකිත්සාගාරය | 3 |
| පේරාදෙනි සරසවිය දුම්රියපල | පේරාදෙනි විශ්ව විද්‍යාලීය දන්ත චිකිත්සාගාරය | 2 |
| | ගලහ ම.බෙ. ... ... | 15 |
| | දෙල්තොට දි.රෝ. ... ... | 19 |
| | **4 වන කොටස—මහනුවර** | |
| ගම්පල ... | පුස්සැල්ලාව දි.රෝ. ... ... | 12 |
| | බඹරදෙනිය මා.නි. ... ... | 6 |
| | පන්විලතැන්න ග්‍රා.රෝ. ... | 10¼ |
| | ගම්පල දි.රෝ. ... ... | ¾ |
| | ගම්පල සෞ.කා. ... ... | ¾ |
| | ගම්පල සහිරා විද්‍යාලීය දන්ත චිකිත්සාගාරය | 1½ |
| | උඩගම ම.බෙ. ... ... | 12 |
| හැටන් ... | හැටන් ම.බෙ. ... ... | ½ |
| | මස්කෙලිය දි.රෝ. ... ... | 12 |
| | දික්ඔය දි.රෝ. ... ... | 5½ |
| | බොගවන්තලාව දි.රෝ. ... | 14 |
| වටවල ... | වටවල දි.රෝ. ... ... | 3 |
| | ලක්ෂපාන ම.බෙ. ... ... | 14 |
| නාවලපිටිය ... | ගිනිගත්හේන ප.ඒ. ... ... | 9 |
| | දෙලොස්බාගේ දි.රෝ. ... | 12 |
| | නාවලපිටිය දි.රෝ. ... ... | 1 |
| | නාවලපිටිය සෞ.කා. ... | ½ |
| | කොත්මලේ මා.බෙ. ... ... | 9 |
| | **5 වන කොටස—නුවරඑළිය** | |
| උලපනේ ... | මොරපේ ම.බෙ. ... ... | 10 |
| කොටගල ... | කොටගල දි.රෝ. ... ... | 2 |
| | විජේබාහුකන්ද ම.බෙ. ... | 12 |
| තලවකැලේ ... | ලිඳුල දි.රෝ. ... ... | 3 |
| | ආගරපතන දි.රෝ. ... ... | 14 |
| වටගොඩ ... | පුන්ඩලුඔය ම.බෙ. ... ... | 7 |
| | රම්බොඩ දි.රෝ. ... ... | 14 |
| | මල්දෙනිය ග්‍රා.රෝ. ... ... | 21 |
| | **6 වන කොටස—නුවරඑළිය** | |
| නානුඔය ... | නානුඔය ම.බෙ. ... ... | 1½ |
| නුවරඑළිය ඕ.ඒ. ... | නුවරඑළිය මූ.රෝ. ... ... | 1½ |
| | නුවරඑළිය සෞ.කා. ... | 1 |
| | කඳපොල ම.බෙ. ... ... | 8 |
| රාගල ඕ.ඒ. ... | මඩුල්ල ම.බෙ. ... ... | 17 |
| | නිල්දන්ඩාහින්න ම.බෙ. ... | 13 |
| | මුල්හල්කැලේ.දි.රෝ. ... | 10 |
| | උඩපුස්සැල්ලාව දි. රෝ. ... | 8 |
| | තෙරිපැහැ ම.බෙ. ... ... | 21 |
| | රුපහ ම.බෙ. ... ... | 13 |
| | මානාකොල ම.බෙ. ... ... | 27 |
| | කුරුපනාවල ම.බෙ. ... ... | 14 |
| | කලගන්වත්ත ම.බෙ. ... | 18 |
| | අරුක්වත්ත ම.බෙ. ... ... | 28 |

7–350—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—කුරුණෑගල කොට්ඨාශය—කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම—1970-71

කුරුණෑගල දිස්ත්‍රික්කයේ වෛද්‍ය ආයතනවලට 1970 ඔක්තෝබර් 1 වැනි දින සිට 1971 සැප්තැම්බර් 30 වැනි දින දක්වා වූ කාල පරිච්ඡේදය තුළ, කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ටෙන්ඩර් පත් කැඳවමින්, අංක 14,912 හා 1970 ජූනි 25 වැනි දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වන කොටසේ 840 වන පිටුවෙහි අංක. 6-660 දරණ දැන්වීම යටතේ පළකරණ ලද නිවේදනයේ 13 වන වගන්තිය මෙයින් ඉවත් කරන අතර ඒ වෙනුවට පහත සඳහන් වගන්ති ආදේශ කරන බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

13. (i) රෝගියෙකුගේ සම්පූර්ණ ආහාර වේලකට සහල් අවුන්ස 4½ ක් ඇතුළත් වනසේ බත්වේල් සැපයීමට ටෙන්ඩර් කරුවන් මිළ ගණන් දැක්විය යුතුය.

(ii) දැනට ආහාර උප ලේඛණයේ දක්වා ඇති සහල් අවුන්ස 12 ප්‍රමාණය අවුන්ස 9 වශයෙන් වෙනස්කර ඇති නිසා, 1970 ඔක්තෝබර් සිට ඒ වෙනුවෙන් අමතරව පාන් සැපයීම අනවශ්‍ය වනු ඇත.

(iii) අවශ්‍ය සහල් ආහාර කොමසාරිස් විසින් සළාක නොවන මිළට සපයන අතර. ඒ සඳහා ටෙන්ඩර්කරු මුදල් ගෙවිය යුතුය. දැනට සළාක නොවන සහල් රාත්තලක මිළ ශත 50 කි.

පරිත්‍යාග කරණලද සහල් හෝ නොමිළයේ සහල් හෝ පිසීම සඳහා කොන්ත්‍රාත්කරුට සැපයුවහොත්, ඒ සඳහා සලාක නොවන සහල් මිළට කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් මුදල් අඩුකරනු ලැබේ.

කිසියම් අවස්ථාවකදී සලාක සහල් සැපයුවහොත්, ඒ සහල් සඳහා සලාක මිළට කොන්ත්‍රාත්කරු විසින් මුදල් ගෙවිය යුතුය. ඒ අතර සලාක නොවන සහල් මිළේ සහ සලාක සහල් මිළේ වෙනස කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් අඩු කරගනු ලැබේ.

(iv) කූපන් භාර නොදුන්හොත්, සේවකයින්ට සැපයිය යුත්තේ පාන් ය. කූපන් භාරදුනහොත් ඒ වෙනුවෙන් නොසපයනු ලබන පාන් සඳහා පහත සඳහන් පරිදි කොන්ත්‍රාත්කරුගේ වවුචරයෙන් මුදල් අඩුකරගනු ලැබේ.

(අ) කූපන්වලට ලබාගන්නා සහල් දැනට මෙන් නොමිළයේ වුවහොත්, නොසපයනු ලබන පාන් වල සම්පූර්ණ වටිනාකම අඩුකරනු ලැබේ.

(ආ) එවැනි කූපන්වලට සහල් නිකුත් කරන්නේ කොන්ත්‍රාත්කරු ගෙවන සලාක මිළට නම්, නොසපයනු ලබන පාන්වල මිලේත්, සලාක මිලේත් වෙනස අඩුකරගනු ලැබේ.

2. උපලේඛණයේ 4 වැනි ඡේදයේ දක්වා ඇති ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය 1970 ජූලි මස 29 වෙනි දින පෙ. ව. 10 දක්වා දීර්ඝ කළ බව මෙයින් දන්වමි.

මා. කාරාලසිංහම්,
කුරුණෑගල, සෞඛ්‍ය සේවා අධිකාරී වෙනුවට.

1970 ජූනි මස 30 වෙනි දින,
කුරුණෑගල,
සෞඛ්‍ය සේවා අධිකාරී කායර්‍යාලයේ දීය.

7–343—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

---

## පුන්ඩලුඔය සුලු නගර සභාව

### පොදු වෙළඳ පල ඉදිකිරීම

පුන්ඩලුඔය සුලු නගර සභාවේ පොදු වෙළඳ පල ඉදිකිරීම සඳහා රු. 50,000 කට වැඩි කර්මාන්ත කර්ම සඳහා ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද ටැන්ඩර් පුන්ඩලුඔය සුලු නගර සභාවේ සභාපති විසින් 1970.7.30 දින පෙරවරු 10 දක්වා බාරගනු ලැබේ.

ටෙන්ඩර් ඉදිරිපත් කළ යුත්තේ රු. 200 ක් වූ ටෙන්ඩර් තැන්පත් මුදලක් සහ රු. 10 ක ටෙන්ඩර් ෆෝර්ම ගාස්තුවක් ගෙවූ විට මා විසින් 1970.7.29 දින පස්වරු 2 දක්වා නිකුත් කරනු ලබන නියමිත ආකෘති පත්‍රවලය.

වැඩි විස්තර කාර්යාලයීය වේලාවන් තුළ දී මෙම සභාවේ ලේකම් තැනගෙන් ලබා ගත හැක.

ඊ. පී. ඒ. ප්‍රැන්සිස් අප්පුහාමි,
සභාපති,
පුන්ඩලුඔය සුලු නගර සභාව.

1970 ජූනි මස 29 වන දින,
පුන්ඩලුඔය සුලු නගර සභා කාර්යාලයේ දී ය.

7–375—70.7.10 දින අංක 14,910 දරන ගැසට් පත්‍රය

---

## තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

### සේවයට නුසුදුසු බඩු විකිණීම

මරදානේ පිහිටි තැපැල් සහ විදුලි සංදේශ ගබඩාවේ තබා ඇති සේවයට නුසුදුසු බඩු බාහිරාදිය විකිණීම සඳහා, කොළඹ 1, තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ලේ, ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලයේ ගැනුම්පත් මණ්ඩලයේ සභාපති විසින් 1970 ජූලි මස 30 වෙනි දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

2. කොළඹ 1, තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ලේ, 5 වෙනි මහලේ, ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලයෙන් ලබාගත් ෆෝර්මවලින් පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ යුතුය. ඉහත සඳහන් කාර්යාලයේදී ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂාකර බැලීමටද, අවශ්‍ය විස්තර දැන ගැනීමටද පුලුවන.

3. තැපැල් කාර්යාලයක හෝ මධ්‍ය විදුලි පණිවුඩ කාර්යාලයේ විදුලි පණිවුඩ කැෂියර් වෙත හෝ ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රුපියල් 50ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සිය ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමෙන් 1970 ජූලි මස 26 වෙනි දින දවල් 12 වන තෙක් බලාපොරොත්තු ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් ඉල්ලුම්පත් ලබාගත හැකිවේ.

වී. අලගරත්නම්,
ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු

ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලය,
තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථානය,
ලෝටස් පාර, තැ. පෙ. 503,
කොළඹ 1.

7–399—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

---

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

බදුල්ලේ පීලිපොතගම පාරේ පිහිටි ජ්‍යෙෂ්ඨ ලිපිකරු නිවාසයේ වහල අළුත්වැඩියා කිරීම සඳහා වූ ටෙන්ඩර්පත් නැගෙනහිර කොට්ඨාශයේ අධිකාරී ඉංජිනේරු කාර්යාලයෙහි ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයා විසින් වර්ෂ 1970 ජූලි මස 29 වැනි බදාදා පෙරවරු 11 වනතෙක් භාරගනු ලැබේ.

2. බදුල්ල ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් ඉංජිනේරු වරයාගෙන් ලබාගත් ආකෘතිපත්වල ටෙන්ඩර්පත් පිළියෙලකොට අනු පිටපතක්ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිවන අතර, සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පිළිවන.

3. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ/ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රු. 7.100 කට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් (විසිපහක්) 25 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1970 ජූලි මස 19 වැනි ඉරිදා පස්වරු 4.30 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර්පත් එවීමට සුදුසුවනවා ඇත. ටෙන්ඩර් සඳහා ප්‍රමාදවී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රුපියල් 10 බැගින් අපසු ගෙවනු නොලැබෙන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබා ගත යුතුයි.

4. ටෙන්ඩර් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත් කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතුවේ.

5. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

6. ටෙන්ඩර් ලබා ගැනීමට අදහස් කරන අය තම තමන් විසින් දැනට කරගෙන යනු ලබන වැඩවල තත්ත්වය හා ප්‍රගතිය දැක්වෙන ඒ ඒ දිස්ත්‍රික් ඉංජිනේරුවරුන්ගෙන් ලබා ගත් ලිපියක් තමන් වෙත ටෙන්ඩර්පත්‍ර නිකුත් කිරීමට පෙර ඉදිරිපත් කළ යුතුද වේ.

ජී. සී. සමරසූරිය,
නැගෙනහිර කොට්ඨාශයේ අධිකාරී ඉංජිනේරු.
ගොඩනැගිලි.

අධිකාරී ඉංජිනේරු කාර්යාලය,
නැගෙනහිර කොට්ඨාශය,
ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,
බදුල්ල.

7–302—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

අක්කර පත්තුවේ පිහිටි ග්‍රාමීය උසාවියේ ලේඛනාගාරය දීර්ඝ කිරීම හා අමතර කාමරයක් තැනීම සඳහා එවන ටෙන්ඩර්පත් බදුල්ල ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ නැගෙනහිර කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපති වරයා විසින් වර්ෂ 1970 ක්වූ ජූලි මස 29 වැනි බදාදා පෙරවරු 11 වනතෙක් භාරගනු ලැබේ.

2. කල්මුනේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් ඉංජිනේරු වරයාගෙන් ලබාගත් ආකෘති පත්‍රවල ටෙන්ඩර්පත් පිළියෙල කොට අනු පිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුය. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිවන අතර සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට හැකිය.

3. ර. වැ. දෙපාර්තමේන්තුවේ/ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 10,000 කට නොඅඩු ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත් කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරු වරයා වෙත ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1970 ජූලි මස 19 ඉරිදා පස්වරු 4.30ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත් එවීමට සුදුසුවනවා ඇත. ටෙන්ඩර් පත් සඳහා ප්‍රමාද වී අයදුම් කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රුපියල් 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරි තැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුය.

4. ටෙන්ඩර් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත් කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතු වේ.

5. ටෙන්ඩර් ලබා ගැනීමට බලාපොරොත්තු වන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේ දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළයුතු ආකෘති පත්‍ර නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ කොටුවේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී තැන්පත් කළ හැක.

ජී. ඩී. සමරසූරිය,
නැගෙනහිර කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු (ගොඩනැගිලි).

නැගෙනහිර කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු (ගො) කාර්යාලය,
ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,
බදුල්ල.

7–353—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

---

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

ලග්ගල, බලවේග පෙහෙකම් වැඩපොල තැනීම සඳහා වූ ටෙන්ඩර් පත්, කොළඹ 1, "ට්‍රාන්ස්වර්ක්ස්" මන්දිරයෙහි ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයා විසින් වර්ෂ 1970 අගෝස්තු මස 4 වැනි අඟහරුවාදා පෙරවරු 11 වන තෙක් භාරගනු ලැබේ.

2. මහනුවර ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික්ක ඉංජිනේරුවරයාගෙන් ලබාගත් ආකෘතිපත්‍රවල ටෙන්ඩර්පත් පිළියෙල කොට අනුපිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි වන අතර, සැලැස්මද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පිළිවන.

3. රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ/ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 1,80,500 කට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරුවරයා වෙත ටෙන්ඩර් පිළිබඳ තැන්පත් මුදල වන රු. 200 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය වර්ෂ 1970 ජූලි මස 24 වැනි සිකුරාදා පස්වරු 1 ට පෙර ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර්පත් එවීමට සුදුසුවනවා ඇත. ටෙන්ඩර්පත් සඳහා ප්‍රමාද වී අයදුම්කරන්නන් විසින් එක් දිනකට හෝ ඉන් අඩකට රු. 10 බැගින් ආපසු ගෙවනු නොලබන පමාවීමේ ගාස්තුවක් නිකුත් කරන නිලධාරීතැනට ගෙවා ඒ සඳහා කුවිතාන්සියක් ලබාගත යුතුයි.

4. ටෙන්ඩර්පත් නිකුත් කිරීමට පෙර අයදුම්කරු විසින් කොන්ත්‍රාත්කරුගේ සටහන් පොත හෝ පිරික්සුම් ලිපිය ඉදිරිපත් කළ යුතුවේ.

5. ටෙන්ඩර් ලබා ගැනීමට බලාපොරොත්තු වන අය, ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සිය ඉදිරිපත් කරන අවස්ථාවේදී, දැනට කරගෙන යන වැඩ පිළිබඳ සියලු විස්තර අඩංගු කළ යුතු ආකෘතිපත්‍ර, නිකුත් කරන නිලධාරියාගෙන් ලබාගෙන නියමිත ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් තැන්පත් මුදල, කොළඹ කොටුවේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියකදී හෝ තැන්පත් කළ හැක.

7. තවද, ටෙන්ඩර් ලබා ගැනීමට අදහස් කරන අය, තම තමන් විසින් දැනට කරගෙන යනු ලබන වැඩවල තත්ත්වය හා ප්‍රගතිය දැක්වෙන ඒ ඒ දිස්ත්‍රික් ඉංජිනේරුවරුන්ගෙන් ලබාගත් ලිපියක්, තමන් වෙත ටෙන්ඩර්පත් නිකුත් කිරීමට පෙර ඉදිරිපත් කළ යුතුවේ.

ඩබ්ලිව්. ඇන්. ජී. මොරිසන්,
ගොඩනැගිලි අධ්‍යක්ෂ වෙනුවට.

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය,
"ට්‍රාන්ස්වර්ක්ස්" මන්දිරය,
තැ. පෙ. අංකය 504,
කොළඹ 1, 1970.7.1.

7–401—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

---

# බඩු බාහිරාදිය විකිණීම

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

**අබලන් භාණ්ඩ වෙන්දේසිය—ලය රෝහල, කඳාන සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ක්ෂය රෝග මර්ධන ව්‍යාපාර අධිකාරිය**

පහත දැක්වෙන කඳාන ලය රෝහලේ ඇති අබලන් භාණ්ඩ 1970 ජූලි මස 30 වන දින පෙ. ව. 10 ට එම ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ:—

1. හාන්සි පුටු 2.
2. කොට ඇඳි හාන්සි පුටු 4.
3. බිම් ඔප දමනය විදුලි 1.
4. කැරම් බෝඩ් 2.
5. පිල්ටර (ගැ. 4) 1.
6. රෝගීන්ගේ පුටු 2.
7. කරණවැම් දැලිපිහිය 1.
8. විදුලි උදුන 1.
9. මේස පංකා 1.
10. ලෑන්ඩ් රෝවර් බැටරි (බැගොනසිව්) 1.
11. ලෑන්ඩරෝවර් පියුබ්ස් 5.
12. රෝගීන්ගේ කවිච්චි පුටු 4.
13. ලෑන්ඩ් රෝවර් ටයර් 3.
14. ආරෝග්‍යශාලා කබඩ්ස් 1.
15. ඇඳි පුටු 3.
16. පහසු හාන්සි පුටු 2.
17. මේස 1.
18. කොස්ඩා කපන මැෂින් 2.
19. මස් සේප්පු 1.
20. කාන්තා පුටු 1
21. අඩු 2.
22. පැතලි පීරි 2.
23. විදුලි කේතල් 2.
24. ගෙවතු මුල්ලු 1.
25. අත් මුල්ලු 1.
26 ආලින්ද බංකු 1.
27. විදුලි ශීත කරන 1.
28. භූමිතෙල් උදුන් 7.

කඳාන ලය රෝහලේ දී 1970.7.29 වන දින පෙ.ව. 10 සිට ප.ව. 3 දක්වා මෙම භාණ්ඩ පරීක්ෂාකර බැලිය හැක.

මිලදී ගන්නා බඩු වෙනුවෙන් මුදල් ගෙවීම් එම ස්ථානයේදීම කළ යුතු අතර එදිනම සවස 4.30 ට කලින් එම බඩු ඉවත් කර ගත යුතුයි.

වෛද්‍ය ඒ. ඇම්. ඩී. රිචඩ්ස්,
ක්ෂය රෝග මර්ධන ව්‍යාපාර අධිකාරි.

1970 ජූනි 20 වැනි දින,
කොළඹ 12,
ක්ෂය රෝග මර්ධන ව්‍යාපාර අධිකාරි කාර්යාලයේදී ය.

7–225—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

## රේගුවේ විකිණීම්

අත් ඔර්ලෝසු, ටේප් රැකෝඩර්, රැකෝඩ් ප්ලේයර්, ට්‍රාන්සිස්ටර් රේඩියෝ, සිනෙකැමරා. උල්පත් පෑන්, බෝල් පොයින්ට් පෑන්, විදුලි පන්දම්, චූයින් ගම්, "තෙකී" මහණ මැෂින්, "ප්ලිමත්" වර්ගයේ පාවිච්චි කරන ලද මෝටර් රථ ඇන්ජිමක්, මෝටර් රථ අමතර කොටස්, බෝල් ටි ඇන සහ මුරිච්චි, ප්‍රසට මෝල් පෙති, මෝටර් කාර් කණ්ණාඩි, පිට මෝටර් (අවුට් බෝඩ් මෝටර්), විටමින් 'සී' සහිත විටමින් 'බී' කොම්ප්ලෙක්ස් පෙති, අඩු නයිලෝන් මාළු දැල්. මසන ලද ලෝම ඇඳුම්, විදුලි ඉස්තිරික්ක, පෑන් පිහි, වැගිකබා, මාළු බාන වැල්රෝද, මස්දොර, ප්‍රතිදීප්ත නළ ලාම්පු (ප්ලුරොසන්ට් විදුලි ලාම්ප්ස්), හම්රෙදි, කේජු, කඩුංකා, උකුකල කිරි, සපත්තු, සුවඳ විලවුන්, ටෑල්කම් පවුඩර්, ජර්කින්, දේශීය බෙහෙත් බඩු ටාර්, විදුලි කම්බි සහ විදුලයොත් (කේබල්), වීදුරු තබලේරු, කවාක කැම, කරවල කුඩු (fපිෂ්මීල්), හෝර්ලික්ස්, නෙස්ටෝමෝල්ට්, විත් කෑම, ගෑස් සිලින්ඩර, බිරමල් (යිස්ට්) කම්බිදුල් රෝල්, සීනු ඔර්ලෝසු, විදින කටු, වර්පත් වැයින්, තේ කොළ, කරාබුනැටි, හැඳි, ඉන් සියුලින් ඉන්ජැක්ෂන්, ඉඩි යතුරු, සලාදතෙල්, කපුනූල්, නූල්රෝල්, සූරුච්චි, චුම්බකපටි (මැග්නට්ක් ටේප්), නලබඩු. ගෑස් මැන්ටල්, ප්ලාස්ටික් ළදරු තොටලි, ශීතකරණ යක්, නෙස්කැෆේ, නෝනාවරුන්ගේ සෙරෙප්පු, වායු සමීකරණ යක්.

යනාදීයෙන් සමන්විත නොයෙකුත් අල්ලා ගන්නා ලද සහ අයිම් කරවන ලද භාණ්ඩයන් 1970 ජූලි මස 16, 17, 18, 23, 24 සහ 25 යන දිනයන්හි සෑම දිනකම පෙරවරු 9.00 පටන්ගෙන කොළඹ 1, රේගුවේ මගීන්ගේ පර්යන්ත වේදිකාවේ ගමන් බඩු කායසිලයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම භාණ්ඩයන් කොළඹ 1, රේගුවේ මගීන්ගේ පර්යන්ත වේදිකාවේදී 1970 ජූලි මස 15 වැනි දින පෙරවරු 9.30 සිට පස්වරු 4.00 දක්වා ප්‍රදර්ශනය කෙරෙනු ඇත.

වැඩි විස්තර රේගුවේ ප්‍රධාන කාර්යාලය, දිගු කාමරය. විමසීම් කවුන්ටරය, ගුවන්බඩු කාර්යාලය, මගීන්ගේ බඩු කාර්යාලය, නිවාරණ කාර්යාලය, අපනයන කාර්යාලය, තැපැල් පාර්සල් කාර්යාලය සහ ප්‍රධාන ලිපිකරු කාර්යාලයෙන් ලබාගත හැක.

ප්‍රධාන රේගු අයකැමි.

මගේ අංකය : පිඹ/විකිනීම/22/70.
1970 ජූනි මස 30 වැනි දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ,
නිවාරණ කාර්යාලයේ දීය.

7–347—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

---

## රාජකීය ලංකා නාවික හමුදාව

**සේවයට අයෝග්‍ය බඩු බාහිරාදිය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

1970 ජූලි මස 22 වෙනි බදාදා පෙරවරු 10 ට කොළඹ, කොච්චිකඩේ රාජකීය ලංකා නාවික හමුදාවේ රු. ව. ලං. 'රංගල' ආයතනයේදී පහත දැක්වෙන සේවයට අයෝග්‍ය බඩු බාහිරාදිය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. විකුණනු ලබන විෂයයන් 1970 ජූලි මස 22 වෙනි දින පෙරවරු 8 සිට 10 දක්වා වේලාව තුළදී පරීක්ෂා කළ හැකිය.

3. වෙන්දේසිය අවසානයේදී සම්පූර්ණ මුදල ගෙවීම අවශ්‍ය වේ. මිල දී ගත් විෂයයන් එදින පස්වරු 4 ට පෙර ඉවත් කර ගත යුතුයි.

ඩී. වී. හන්ටර්,
වැඩබලන නාවික හමුදාධිපති.

1970 ජූනි මස 22 වෙනි දින,
කොළඹ, රාජකීය ලංකා නාවික හමුදා මූලස්ථානයේ දී ය.

අඩි 27 වේලරය, විවිධ ප්‍රමාණයේ මෝටර් වාහන විදුලි, වෝල්ට් 6 සහ 12 බැටරි, පාපැදියන්, සින්ක් බේසන්, රථ වාහන අමතර කොටස්, කොට්ටා, බාත් ටබ්ස්, ලෝලෙවල් සිස්ටර්න්ස්, යකඩ තහඩු, මුහුනු සෝදන පිගන් බේසන්, ඇලුමිනියන් පිගන් සහ කෝප්ප යනාදිය.

7–305—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම

## අරක්කු රේන්ද විකිණීම—රත්නපුර දිස්ත්‍රික්කය—1970–71

1970 ඔක්තෝබර් මාසයේ 1 වෙනි දින සිට 1971 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා ඇති කාල සීමාව තුළ මෙහි පහත උප ලේඛනයෙහි දක්වෙන ප්‍රදේශයන්හි, අරක්කු සිල්ලර වශයෙන් විකිණීම පිණිස, පහත දැක්වෙන නීතිවලට අනුකූලව ටෙන්ඩර් කැඳවනු ලැබේ :—

1. (i) 1970 අප්‍රේල් මස 17 වන දින අංක 14,902 දරණ රජයේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද අරක්කු රේන්ද විකිණීමේ කොන්දේසි අනුව, හා
(ii) පුරාබද්ද නිවේදනයේ දැක්වෙන සෑම පුරාබද්ද බලපත්‍රයක් කෙරෙහි ම බලපාන පොදු කොන්දේසි මලාවට යටත්වය.

2. සෑම ටෙන්ඩර්කරුවෙක් විසින්ම ඕනෑම කච්චේරියකින් ලබා ගන්නා ලද නියමිත ආකෘති පත්‍රයක් සම්පූර්ණ කර එවිය යුතුයි. එසේ ඉදිරිපත් කරන සෑම ටෙන්ඩරයක් සමගම කච්චේරියේ මුදල් තැන්පත් කළ බවට ලබා ගත් කුවිතාන්සියක් ද අමුණා තිබිය යුතුයි. බලංගොඩ අංක 1 දරණ අරක්කු තැබෑරුම සඳහා නම් රු. 2,000 ක් ද, පින්නවල අංක 2 දරණ අරක්කු තැබෑරුම සඳහා නම් රු. 1,000 ක තැන්පත් කළ යුතුයි.

3. ඉදිරිපත් කරන ටෙන්ඩරය සුරක්ෂිත ලෙස කවරයක බහා සීල් තබා වම් කෙළවර මුදුනේ කුමණ තැබෑරම සඳහා දැයි පැහැදිලිව සඳහන් කර ටෙන්ඩර් වහන නියමිත වේලාවට පෙර ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුය. තැපැලෙන් එවන්නේ නම්, ''රත්නපුර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්තතැන, රත්නපුර'' යන ලිපිනයට ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුයි. නැතහොත් කච්චේරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි බහාලිය යුතුයි.

4. සෑම ටෙන්ඩර්කරුවෙක්ම තමාගේ නමින්ම ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. නියෝජිතයන්ගේ මාර්ගයෙන් හෝ ලාංකික නොවන අයගේ නමින් අරක්කු රේන්ද විකිණීමේ කොන්දේසිවල 6 වැනි කොන්දේසිය අනුව නුසුදුස්සෙකු වූ අයගේ නමින් හෝ ටෙන්ඩර් පිළිගනු නොලැබේ.

5. එක් අයෙකු එක් තැබෑරුමක් සඳහා එක් ටෙන්ඩර් පත්‍රයකට වඩා එවිය නොහැක. එක් තැබෑරුමක් සඳහා පස් දෙනෙකුට වැඩි අයවළුන් විසින් ද ටෙන්ඩර් ඉදිරිපත් කළ නොහැක.

6. ටෙන්ඩරයේ මුදල අකුරෙන් සහ ඉලක්කමෙන් දක්විය යුතුය. ටෙන්ඩරයේ කරන සෑම වෙනස් වීමක්ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන සහ දිනය යොදා සහතික කළ යුතුය. මේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. තෝරා ගත් ටෙන්ඩර්කරු, මිළදී ගත් තැනැත්තා හැටියට ප්‍රකාශ කළ විගසින්ම රේන්ද විකිණීමේ කොන්දේසිවලට අත්සන් තබා, දිසාපති තැන විසින් නියම කරන ලද මුදල ඇප වශයෙන් තැන්පත් කළ යුතුයි.

8. කිසිදු හේතුවක් නොදක්වා, කිසියම් ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ලම හෝ ස්වකීය අභිමතය පරිදි ප්‍රතික්ෂේප කිරීමේ බලය ආණ්ඩුවේ ඒජන්ත වෙත පැවරී ඇත.

9. පහත සඳහන් පරිදි, එක් එක් තැබෑරුමකට නියම කර ඇති වේලාවන්හිදී, 1970 අගෝස්තු 13 වෙනි බ්‍රහස්පතින්ද ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. සෑම ටෙන්ඩර්කරුවෙක්ම එකී නියමිත වේලාවට කච්චේරියේ පෙනී සිටිය යුතුය.

10. ටෙන්ඩර්කරුගේ දැනගැනීම සඳහා මෙම දිස්ත්‍රික්කයේ වතුවල තිබෙන කැන්ටින් ලැයිස්තුව ද පහත සඳහන් කර ඇත.

11. වැඩි විස්තර රත්නපුර කච්චේරියෙන් විමසා දැනගත හැකිය.

ඇස්. ජී. සමරසිංහ,
රත්නපුර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1970 ජූනි මස 24 වැනි දින,
රත්නපුර දිසාපති කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| අනුක්‍රමික අංක | කොට්ඨාශය | පිහිටි ප්‍රදේශය | තැබෑරුම විවෘත කරන වේලාව | තැබෑරුම වහන වේලාව | ටෙන්ඩර් වහන වේලාව |
|---|---|---|---|---|---|
| 1. | බලංගොඩ නගර සභා කොට්ඨාශය ... | බලංගොඩ නගර සභාවේ අංක 5 දරණ නාගරික කොට්ඨාශය | පූර්වභාග 8.30 ... | අපරභාග 8.30 ... | පූරවභාග 10.30 |
| 2. | කඩවත සහ මැද කෝරළය ... | පින්නවල ගම ... | පූර්වභාග 8.30 ... | අපරභාග 7.00 ... | පූර්වභාග 11.00 |

වතු කැන්ටින් (ටෙන්ඩර් කිරීම සඳහා නොවේ.)

| | | | |
|---|---|---|---|
| 3. | අටකළන් කෝරළය ... | මාදම්පේ වත්ත ... | වත්තේ අධිකාරීගේ මනාපය උඩ පවතී. |

7–218—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

---

## වවුනියාව දිස්ත්‍රික්කයේ අරක්කු රේන්ද විකිණීම—1970-71

**1970 ඔක්තෝබර් මස 1 සිට 1971 සැප්තැම්බර් 30 දින දක්වා කාලය සඳහා**

1970 ඔක්තෝබර් 1 ද සිට 1971 සැප්තැම්බර් 30 දක්වා වූ කාලය සඳහා වවුනියා දිස්ත්‍රික්කයේ අරක්කු තැබෑරුම් වල සිල්ලරට අරක්කු විකිණීමේ අයිතිය පමණක් විකිණීම සඳහා (පහත සඳහන් කොන්දේසි වලට යටත් කොට) සුරාබද්ද බලපත්‍රයන්ට අදල පොදු කොන්දේසි මාලාවට යටත්ව අංක 14,902 සහිතව 17.4.70 වැනි දින ප්‍රකාශයට පත් ගැසට් පත්‍රයේ සඳහන් කොන්දේසි වලට අනුකූලව, ටෙන්ඩර් පත්‍ර මෙයින් කැඳවනු ලැබේ.

2. පහත දක්වා ඇති උප ලේඛණයේ සඳහන් කර ඇති වේලාවට කලින් වවුනියාව දිස්ත්‍රික්කයේ දිසාපති තුමා වෙත ලැබෙන පරිදි ටෙන්ඩර් පත්‍ර " 1970–71 වර්ෂය සඳහා වවුනියාව දිස්ත්‍රික්කයේ අරක්කු රේන්ද මිළයට ගැනීමේ ටෙන්ඩරය " යයි සඳහන් කර 1970 ජූලි මස 29 වැනි දට ප්‍රථම එවිය යුතුය.

3. එක් එක් තැබෑරුම සඳහා වෙන වෙනම ටෙන්ඩර් පත්‍රය බැගින් එවිය යුතුය. තවද, එක් අයෙකු විසින් එක තැබෑරුමක් සඳහා එක ටෙන්ඩරයකට වැඩි ගණනක් නොඑවිය යුතුය. එක් තැබෑරුමක් සඳහා පස් දෙනෙකුට නොවැඩි ගණනකට සාමූහික ටෙන්ඩරයක් එවිය හැකිය.

4. පහත සඳහන් කොන්දේසි වලට අනුකූල නොවූ ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(අ) ටෙන්ඩර් පත්‍රය එවනු ලැබූ අය පුද්ගලිකව නොපැමිණිය හොත්,

(ආ) සෑම ටෙන්ඩර් පත්‍රයකටම ටෙන්ඩර් කරුගේ නිශ්චල දේපොල පිහිටි කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදයම් නිලධාරියා විසින් නිකුත් කරණ ලද වත්කම් සහතිකයේ මුල් පිටපතද අමුණා තිබිය යුතු අතර, එක් තැබෑරුමකට වැඩියෙන් ටෙන්ඩර් ඉදිරිපත් කරන අවස්ථාවල මෙහි පහත දක්වා ඇති පරිදි, මුල් පිටපත් සහ එහි විධිමත් ලෙස සහතික කරන ලද පිටපතක් අමුනා තිබිය යුතුය. එවැනි වත්කම් සහතිකයක් අමුණා නොමැත්තා වූද, ටෙන්ඩරයේ දක්වෙන මුදල් ප්‍රමාණයෙන් සියයට 25 කට අඩු වටිනාකමක් ඇති වත්කම් සහතිකයක් අමුණා ඇත්තාවූ ද ඕනෑම ටෙන්ඩර් පත්‍රයක් ප්‍රතික්ෂෙප කළ හැකිය. තැබෑරුම් එකකට වැඩි ගණනකට ටෙන්ඩර් ඉදිරිපත් කරන ටෙන්ඩර් කරුවන් විසින් එම රේන්ද වර්ෂයේදීම අනික් එක් ටෙන්ඩරයක් සමග වත්කම් සහතිකයේ මුල් පිටපත අමුණා යවා ඇති නම් අනිකුත් ටෙන්ඩර වලට එම සහතිකයේ, සහතික පිටපත් අමුණා යැවිය හැකිය. එවැනි අවස්ථාවලදී මුල් වත්කම් සහතිකය අමුණා යැවූ ටෙන්ඩරයට අදල තැබෑරුමේ පිහිටීම, නම සහ අංකය දක්වෙන සටහනක් අනික් ටෙන්ඩර් පත්‍ර සමග ඉදිරිපත් කරන සහතික පිටපත්වල තිබිය යුතුය.

5. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් එවීම හෝ වවුනියාව දිසාපති කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ දැමීම හෝ වවුනියාව දිසාපති තුමාට හෝ එතුමාගේ කාර්යාල සහකාර තැනට හෝ පුද්ගලිකව භාර දීම කළ හැකි නමුත්, ටෙන්ඩර් පත්‍ර එවනු ලබන ලියුම් කවරයේ වම් කෙළවරේ ටෙන්ඩරය එවනු ලැබූ තැබෑරුමේ නම හා අංකය සඳහන් කර කවරය සීල් තබා එවිය යුතුය. එක් එක් ටෙන්ඩරය සම්බන්ධයෙන් එක් ලියුම් කවරය බැගින් පාවිච්චි කළ යුතු අතර, එක් එක් ලියුම් කවරයේ ඉහතින් සඳහන් කර ඇති පරිදි තැබෑරුමෙහි නම හා අංකය සඳහන් කළ යුතුය.

6. විකිණීමේ කොන්දේසි සපුරා ලීම වශයෙන් සෑම ටෙන්ඩර් පත්‍රිකාවක් සමගම රු. 1,500/- කට කච්චේරි කුවිතාන්සියක් ඇමිණිය යුතුය. සියළුම තැන්පත් කිරීම් වවුනියා දිස්ත්‍රික්කයේ දිසාපති නමින් විය යුතුය. සාර්ථක වූ ටෙන්ඩර් පත්‍රිකාව ඉදිරිපත් කළ අය ඔහුට එම වරප්‍රසාදය හිමි වූ විගසම විකිණීමේ කොන්දේසි වලට අත්සන් තැබීමට ඉදිරිපත් නොවූවහොත් ඇප මුදල රාජසන්තක වේ.

7. ඕනෑම ටෙන්ඩරයක් ප්‍රතික්ෂෙප කිරීමේ බලය වවුනියාව දිසාපති තුමා සතුය.

8. සාර්ථක ලෙස ටෙන්ඩරය ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් කරු අරක්කු රේන්ද මිළට ගත් ලෙස ප්‍රකාශයට පත් කළ වහාම වවුනියාව දිසාපති තුමා විසින් ඇප මුදල් වශයෙන් නියම කරනු ලබන මුදල වහාම දිසාපති තුමා වෙත ගෙවිය යුතු අතර, ටෙන්ඩර් කරු විසින් අවශ්‍ය මුද්දර ඉදිරිපත් කර කොන්දේසි මාලාවකට හා කොන්ත්‍රාත්තුවකට අත්සන් තැබිය යුතුය.

9. සාර්ථක ලෙස ටෙන්ඩර් කරන ලද අය ගැණුම්කරු ලෙස ප්‍රකාශයට පත් කළ වහාම තමා විසින් තැබෑරුම පවත්වාගෙන යාමට තෝරා ගත් ස්ථානය දිසාපති තුමාට දන්විය යුතු අතර ඒ සඳහා එතුමාගෙන් අනුමැතිය ලබා ගත යුතුය. අංක 3 වවුනියාව අරක්කු තැබෑරුම් ඉදිරි රේන්ද වර්ෂයේදී දනට පවත්නා ස්ථානයේ නොතිබෙනු ඇත.

10. පූර්වෝක්ත විකිණීම සම්බන්ධ කොන්දේසි හා වෙනත් විස්තර සඳහා වවුනියාව දිසාපති කාර්යාලයට ලියා විමසන්න.

### උපලේඛණය

| අංකය හා නම | | තැබෑරුම පිහිටා ඇති ප්‍රදේශ | ටෙන්ඩර් භාර ගැනීම නවත්වන වේලාව |
|---|---|---|---|
| 1. | මුලතිව් ... | මුලතිව් සුලු නගර සභා සීමාව තුල ... | පූ.භා. 10.00 |
| 2. | මාන්කුලම් ... | මාන්කුලම් ගම ඇතුළත ... | පූ.භා. 10.30 |
| 3. | වවුනියාව ... | වවුනියා නගර සභා සීමාව තුල ... | පූ.භා. 11.00 |

ඒ. පෙරුමයිනාර්,
වවුනියාව අතිරේක දිසාපති.

දිසාපති කාර්යාලයය,
වවුනියාව, 30.6.70.

7–403—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

---

## මහනුවර දිස්ත්‍රික්කයේ 1970/71 වර්ෂයේ අරක්කු තැබෑරුම් රේන්ද විකිණීම

අංක 14,902 හා 1970 අප්‍රේල් මස 17 වෙනි දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිඩ කොට ඇති 1970–71 වර්ෂයට හා ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වලංගු අරක්කු තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුල වලංගුව පවත්නා සෑම සුරාබද්ද බලපත්‍රයක් කෙරෙහිම බලපානා පොදු සුරාබද්ද කොන්දේසිවලටත් යටත්ව 1970 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1971 සැප්තැම්බර් මස 30 වෙනි දින තෙක්වූ කාලය තුලදී පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් කර ඇති අරක්කු තැබෑරුම්වල අරක්කු සිල්ලරට විකිණීමේ වරප්‍රසාදයන් මිළදී ගැනීම සඳහා මහනුවර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්තතැන විසින් 1970 අගෝස්තු මස 18 වෙනි දින තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. සෑම ටෙන්ඩරයක්ම දිවයිනේ ඕනෑම කච්චේරියකින් ලබාගත හැකි නිසි ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර—

(අ) ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් ඕනෑම කච්චේරියක රු. 2,500ක් තැන්පත් කර ඒ සඳහා ලබාගත් කුවිතාන්සියක්, සහ

(ආ) ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපල පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ආදයම් නිලධාරිතැනගෙන් ලබාගත් ටෙන්ඩර්කරුගේ වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධව යථෝක්ත අරක්කු තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගු නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත තරමයේ නිවේදනය කෙරේ. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේදී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂයෙන් සැළකිළිමත් විය යුතුය :—

(අ) ටෙන්ඩර් පත්‍ර මුළුමනින්ම සම්පූර්ණ කළ යුතුය. මෙසේ කිරීමේදී එහි සඳහන් කර ඇති මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතුය. තවද, නියමිත සාක්ෂිකරුවන්ගේ අත්සන් යොද තිබිය යුතුය.

(ආ) සෑම වෙනස්කිරීමක් හෝ වචන කපා හැරීමක් ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන සහ දිනය යොදා සහතික කර තිබිය යුතුය.

මෙකී නියමයන්ට පටහැනිව ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් පත්‍රිකා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ ටෙන්ඩර් පත්‍රය ටෙන්ඩර් තැන්පත් මුදල තැන්පත් කර ලබාගත් කච්චේරි කුවිතාන්සියක්, චරිත සහතිකයක් සමග ලියුම් කවරයක බහා මුද්‍රා තබා ලියුම්කවරයෙහි වම් කෙළවර මුදුනේ තැබෑරුමේ අංකය සහ නම සඳහන් කර මහනුවර කච්චේරියේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාරගැනීම අවසන් කිරීමට පෙර තැන්පත් කළ යුතුය. එසේ නැතහොත් ටෙන්ඩර් භාරගැනීමේ වේලාව ඉකුත්වීමට පෙරම යෙන් මහනුවර ආණ්ඩුවේ ඒජන්තතැනට ලැබෙනසේ ලියා පදිංචි කළ සීඝ්‍රගාමී තැපැලෙන් එවිය යුතුය.

4. එක් එක් රේන්දයක් වෙනුවෙන් ටෙන්ඩර් භාරගැනීම අවසන් කරන වේලාව පහත සඳහන් උප ලේඛනයෙහි සඳහන් කර ඇත. එකී වේලාවන් හිදී සියළුම ටෙන්ඩර්කරුවන් මහනුවර කච්චේරියේ පෙනී සිටිය යුතුය.

5. සාර්ථක ලෙස ටෙන්ඩර්කරුවන් ඉදිරිපත් කළ අය 'වරප්‍රසාදය මිළදී ගත් තැනැත්තා' යයි ප්‍රකාශ කරනු ලැබූ පසු එම දින පස්වරු 4ට පෙර මහනුවර ආණ්ඩුවේ ඒජන්තතැන විසින් නියම කරනු ලැබූ මුදලක් ඇප වශයෙන් මහනුවර කච්චේරියේ තැන්පත් කොට යටකී අරක්කු තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවට අත්සන් තැබිය යුතුය. මෙම ගෙවීම මුදලින්ම හෝ බැංකුවෙක් විසින් 'ගෙවීම සඳහා' යයි ලකුණු කළ චෙක්පතකින් හෝ ලංකා බැංකුවේ හෝ මහජන බැංකුවෙන් හෝ ''ආරක්ෂිත චෙක්පත්'' නමැති ස්වරූපයෙන් නිකුත් කරන ලද චෙක්පතකින් හෝ බැංකුවකින් ඒ බැංකුවේ නාමටම නිකුත් කරන ලද චෙක්පතකින් හෝ ගෙවිය යුතුවේ.

6. මේ සම්බන්ධ වැඩි විස්තර මහනුවර කච්චේරියෙන් විමසා දැනගත හැකිය

ඇස්. මාරලන්ද,
මහනුවර ආණ්ඩුවේ ඒජන්තතැන

1970 ජූනි මස 27 වෙනි දින,
මහනුවර කච්චේරියේදී ය.

### උප ලේඛනය

පහත සඳහන් කළ අරක්කු තැබෑරුම් ලැයිස්තුව සහ ටෙන්ඩර් පත්‍ර භාරගැනීම—අවසන් කරන වේලාවන් :

| අනුක්‍රමික අංකය | නම සහ කොට්ඨාශය | තැබෑරුම පිහිටුවිය යුතු ප්‍රදේශය | තැබෑරුම විවෘත කරන වේලාව පෙ.ව. | තැබෑරුම වසන වේලාව ප.ව. | ටෙන්ඩර් භාරගැනීම අවසන් කරන වේලාව |
|---|---|---|---|---|---|
| 1 ... | කොළඹ වීදියේ අරක්කු තැබෑරුම—මහනුවර නාගරිකයේ අංක 17 දරණ ඡන්ද කොට්ඨාශය | කොළඹ වීදිය සහ ත්‍රිකුණාමල වීදිය මංසන්ධියටත්, කොළඹ වීදිය සහ කැසල් හිල් වීදිය මංසන්ධියටත් අතර කොළඹ වීදියේ මහනුවර නාගරිකයේ අංක 17 දරණ ඡන්ද කොට්ඨාශයට අයත් පාර්ශවයේ | 8.00 ... | 7.30 | ...පෙ.ව. 9.30 |
| 2 ... | කටුකැලේ අරක්කු තැබෑරුම—මහනුවර නාගරිකයේ අංක 16 සහ 4 දරණ කොට්ඨාශ ... | මහනුවර පොලිස් ස්ථානය අසල පාලමටත් කටුකැලේ මුස්ලිම් දේවස්ථානයටත් අතර පේරාදෙනිය පාරේ, මහනුවර නාගරිකයේ අංක 16 සහ 4ට අයත් පාර්ශවයේ | 8.00 ... | 7.30 | ...පෙ.ව. 10.00 |
| 3 ... | වහුගේපිටිය අරක්කු තැබෑරුම—උඩ පළාත | වහුගේපිටිය ග්‍රාමය තුල ... ... ... | 8.00 ... | 7.00 | ...පෙ.ව. 10.30 |
| 4 ... | පුස්සැල්ලාව අරක්කු තැබෑරුම—පුස්සැල්ලාව නගරය | පුස්සැල්ලාව නගර සීමා ඇතුළත ... ... | 8.00 ... | 7.00 | ...පෙ.ව. 11.00 |
| 5 ... | හැටන් අරක්කු තැබෑරුම—හැටන්-දික්ඔය නගර සභාවේ අංක 5 දරණ ඡන්ද කොට්ඨාශය | හැටන්-දික්ඔය නගර සභාවේ අංක 5 දරණ ඡන්ද කොට්ඨාශය තුල | 8.00 ... | 7.30 | ...පෙ.ව. 11.30 |
| 6 ... | කොටියාගල අරක්කු තැබෑරුම—කොටියාගල නගරය | කොටියාගල නගර සීමාව ඇතුළත ... ... | 8.00 ... | 7.00 | ...මධ්‍යහ්න 12 |
| 7 ... | හාර්ඩන් හුයිස් අරක්කු තැබෑරුම—අඹගමුව කෝරළය | හාර්ඩන් හුයිස් ග්‍රාමය තුළ ... ... ... | 8.00 ... | 7.00 | ... ප.ව. 1.30 |
| 8 ... | මස්කෙළිය අරක්කු තැබෑරුම—අඹගමුව කෝරළය | මස්කෙළිය නගර සීමාව තුළ ... ... | 8.00 ... | 7.00 | ... ප.ව. 2.00 |
| 9 ... | පුසුරුස්ස අරක්කු තැබෑරුම—උඩපලාත | පුසුරුස්ස නගර සීමාව තුළ ... ... ... | 8.00 ... | 7.00 | ... ප.ව. 2.30 |

### ටෙන්ඩර් ඉදිරිපත් නොකළ යුතු මහනුවර දිස්ත්‍රික්කයේ වතු කැන්ටීන්

| | | | |
|---|---|---|---|
| 10 ... | උඩ පළාත ... ... | ගලහ, පුසුරාසි වතුයායේ සීමාව තුළ ... ... | වෙළඳාම් කරණ වේලාව වතුඅධිකාරි විසින් නියෝග කරණ පරිදිය |
| 11 ... | උඩදුම්බර ... ... | ඌරුගල, වුඩසයිඩ වතුයායේ සීමාව තුළ ... ... | එම |

සටහන.—සෑම තැබෑරුම් පවත්වන ස්ථානයක් සඳහාම මහනුවර ආණ්ඩුවේ ඒජන්ත තැනගේ පෙර අනුමැතිය ලබාගත යුතුය

7-287—70.7.10 දින අංක 14,914 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුයි.**

උපලේඛනය

**1970**

| මාසය | පළ කිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| ජූනි | 70. 6. 5 සිකුරාද | 70. 5.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.11 බ්‍රහස්පතින්ද | 70. 6. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 6.18 බ්‍රහස්පතින්ද | 70. 6.11 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 6.25 බ්‍රහස්පතින්ද | 70. 6.18 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| ජූලි | 70. 7. 2 බ්‍රහස්පතින්ද | 70. 6.25 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70 7 10 සිකුරාද | 70 7 2 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70. 7.17 සිකුරාද | 70. 7.10 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.24 සිකුරාද | 70. 7.17 සිකුරාද | දහවල් | 12.0 |
| | 70. 7.31 සිකුරාද | 70. 7.24 සිකුරාද | දහවල් | 12.0 |
| අගෝස්තු | 70. 8. 7 සිකුරාද | 70. 7.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70. 8.14 සිකුරාද | 70. 8. 7 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.21 සිකුරාද | 70. 8.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 8.28 සිකුරාද | 70. 8.21 සිකුරාද | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් | 70. 9. 4 සිකුරාද | 70. 8.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.11 සිකුරාද | 70. 9. 4 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.18 සිකුරාද | 70. 9.11 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70. 9.25 සිකුරාද | 70. 9.18 සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් | 70.10. 2 සිකුරාද | 70. 9.25 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10. 9 සිකුරාද | 70.10. 2 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.16 සිකුරාද | 70.10. 9 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.23 සිකුරාද | 70.10.16 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.10.30 සිකුරාද | 70.10.23 සිකුරාද | ප.ව. | 3.30 |
| නොවැම්බර් | 70.11. 5 බ්‍රහස්පතින්ද | 70.10.30 සිකුරාද | ප.ව. | 3.30 |
| | 70.11.12 බ්‍රහස්පතින්ද | 70.11. 5 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.20 සිකුරාද | 70.11.12 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | 70.11.27 සිකුරාද | 70.11.20 සිකුරාද | දහවල් | 12.0 |
| දෙසැම්බර් | 70.12. 4 සිකුරාද | 70.11.27 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.11 සිකුරාද | 70.12. 4 සිකුරාද | දහවල් | 12.0 |
| | 70.12.18 සිකුරාද | 70.12.10 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.24 බ්‍රහස්පතින්ද | 70.12.17 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | 70.12.31 බ්‍රහස්පතින්ද | 70.12.24 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 මාර්තු 5 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව, කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදි